III කාණ්ඩය

## බේකරි පිළිබඳ උපනීති

1. මේ උපනීතිවල "බේකරිය" යන්නෙන් අදහස් කරන්නේ මනුෂ්‍යයන්ට ආහාර වශයෙන් විකිණීම පිණිස පාන් හෝ බිස්කෝතු හෝ කැවිලිපෙවිලි පුළුස්සන හෝ සාදන ඕනෑම ස්ථානයෙකි. ඒ ආහාර වර්ග සකස් කරන හෝ ඒ ආහාර වගී සකස් කිරීමට ගන්නා ද්‍රව්‍යයන් රැස්කර තබන ඕනෑම ස්ථානයක් ඊට ඇතුළත් වේ.

2. (1) සභාපතිතුමාගෙන් බේකරියක් දමා ගැනීමට ලබාගත් බල පත්‍රයක් පිට මිස කිසිවකු විසින් බේකරියක් දැමීම හෝ කිසිම බේකරියක වෙළඳාම කරගෙන යෑම නොකළ යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දෙන හැම බල පත්‍රයක්ම 27 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දුන් අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එක් වැනිදාට අහෝසිවිය යුතුය.

3. බලපත්‍රය දීමට තිබෙන ස්ථානයත් බේකරියේ උපකරණත් පහත සඳහන් කොන්දේසිවලට ගැළපෙතොත් මිස නැත්නම් බේකරියක් දැමීම පිණිස බලපත්‍රයක් ලබා ගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය :—

(1) (අ) ගොඩනැගිල්ල හොඳින් අලුත්වැඩියාකොට හොඳින් වාතය හා ආලෝකය ලැබෙන පරිද්දෙන්ම තිබිය යුතුය. එහි හැම කාමරයකම විවෘත කළ හැකිවූද විවෘත කළ විට කාමරයේ බිමේ වර්ගප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු වර්ග ප්‍රමාණයක් ඇත්තාවූද ජනෙල් තිබිය යුතුය;

(ආ) හැම කාමරයකම කොයිම බිත්තියක් වත් උසින් අඩි හතකට අඩු නොවිය යුතුය. ඒ බිත්ති ගඩොලින් හෝ කළුගලෙන් හෝ බැඳ තිබිය යුතුය. ඒවායේ ඇතුල් පැත්ත හුණු බදාමෙන් කපලාරු කොට සුදුහුණු ගා තිබිය යුතුය;

(ඇ) වහල්පලය පොළොව සිට යටත් පිරිසෙයින් අඩි හයක් වත් උස්විය යුතුය;

(ඉ) වහල කල් පවතින ස්ථිර ද්‍රව්‍යයකින් සෙවෙලි කොට තිබිය යුතුය;

(ඊ) ලීදඬුවල තීන්ත හෝ සුදුහුණු ගා තිබිය යුතුය;

(උ) බිම හැම තැනම සිමෙන්ති දමා තිබිය යුතුය;

(ඌ) වතුර බැසයෑම සඳහා බිමේ සෑහෙන තරම් කානු ආදී පහසුකම් තිබිය යුතුය.

2. (අ) පිටි පදම් කරන කාමරයේ බිම දිගින් අඩි පහළොවකට හා පළලින් අඩි දොළහකට අඩු නොවිය යුතුය. එහි බිත්තිවල ඇතුල් පැත්තේ, බිම සිට අඩි හතරක් උසට පිඟන් ගඩොළු අල්ලා තිබිය යුතුය. නැත්නම් ඒ හරිය සිමෙන්තියෙන් කපලාරු කොට තිබිය [illegible] 3

(ආ) පිටි පදම් කරන කාමරයේ දොරවල් හා ජනෙල් ඇති පැති දෙකකින් වත් ඔබ්බෙහි පළලින් අඩි හතකට නොඅඩු ගිස් බිම් තීරුවක් තිබිය යුතුය.

(ඇ) පෝරණුවේ දොර, පිටි පදම් කරන කාමරයට කෙළින්ම විවෘත නොවිය යුතුය.

(ඉ) පිටි පදම් කරන හැම කාමරයකටම, කපලාරු කොට සුදුහුණු ගානලද සිලිමක් හෝ හොඳට ගේත්තුවන පරිදි ලෑලි ගසා සාද තීන්ත හෝ සුදුහුණු ගානලද සිලිමක් තිබිය යුතුය.

3. (අ) පාන් සෑදීමේදී පාවිච්චි කරන බාල්දිත් මේසත් සියලු භාජනත් බිම හා බිත්ති ශුද්ධපවිත්‍ර කරන විට එහා මෙහා කළහැකි විදියේ දේවල් විය යුතුය.

(ආ) පාන් සෑදීමේදී පාවිච්චි කරන මේසවල උඩ තට්ටුව හොඳින් පදම්වූද එකිනෙකට හොඳින් ගේත්තු වන්නාවූද ලෑලිවලින් හෝ උපද්‍රවදායක නොවන්නාවූද දිය බී නොගන්නාවූද යම්කිසි ද්‍රව්‍යයකින් සාද තිබිය යුතුය.

4. (අ) බේකරියෙහි සවසාතුකූල කුණුබාල්දියක්ද, යටත් පිරිසෙයින් පඩික්කම් දෙකක්ද සෑහෙන තරම් වැසිකිළිද තිබිය යුතුය.

(ආ) බේකරිය ඕනෑම වැසිකිළියක හෝ කසලවළක හෝ පෝර ගොඩක හෝ මතුපිටින් නොවැසූ මලමූත්‍ර නාලිකාව සිට යටත් පිරිසෙයින් අඩි පනහක් වත් ඈතින් තිබිය යුතුය.

(ඇ) බේකරිය ඇතුළත හෝ බේකරියට කෙළින්ම සම්බන්ධවන පරිද්දෙන් කසලවළක් හෝ වැසිකිළියක් හෝ අටුවළක් හෝ නොතිබිය යුතුය.

4. (1) ඕනෑම බේකරියකට බල පත්‍රයක් දී තිබෙන කාලපරිච්ඡේදය ඇතුළත ඕනෑම වේලාවකදී ඒ බේකරිය සඳහා පාවිච්චි කරන ඕනෑම ගොඩනැගිල්ලක් 3 වැනි උපනීතියේ විධිවිධානයන්ට නොගැළපෙන තත්වයකට පත්වුව හොත් ඒ ගොඩනැගිල්ල ඒ විධිවිධානයන්ට අනුකූල කරවීමට කළයුතු හැම දෙයක්ම අසවල් දිනයට මත්තෙන් කළ යුතුයයි නියම කොට ඒ බේකරියේ බලපත්‍රකාරයා වෙත දැන්වීමක් භාරදීමට සැලැස්වීමට සභාපතිහට බලය ඇත්තේය. සභාපතිතුමා නියම කරන දිනය ඒ දැන්වීමෙම සඳහන් විය යුතුය.

(2) මේ උප නීතියේ (1) වැනි ඡේදය යටතේ ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබූ කිසිම බේකරි බලපත්‍රකාරයකු ඒ දැන්වීමේ නියමිත කාලය ඇතුළත එහි නියම කළ යුතු කටයුතු නොකළ සිටිය යුතු නොවේ.

(3), (1) වැනි ඡේදය යටතේ ඕනෑම දැන්වීමක් (බලපත්‍රකාරයා) බේකරියේ කටයුතු කරගෙනයන ස්ථානයෙහි ගැසුව හොත් නැතහොත් බලපත්‍රකාරයා ඒ ස්ථානයෙහි රැඳෙන්නේ යොදවා ඇති සේවකයකුට භාරදුන්නොත් බලපත්‍රකාරයාටම භාරදුන්නා කොට සැලකිය යුතුය.

5. බලපත්‍රයක් ලත් හැම බේකරියකම බලපත්‍රකාරයා විසින් තම බේකරියේ පිට පැත්තේ ප්‍රකට ස්ථානයක තමාගේ නම හා "බල පත්‍රයක් ලත් බේකරිය" යන වචන සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් පින්තාරු කොට ලෑල්ලක් එල්ලා තබාගත යුතුය.

6. බලපත්‍රයක් ලත් හැම බේකරියකම බලපත්‍රකාරයා බේකරි පිළිබඳ මේ උපනීතිවල සිංහල පිටපතක්ද දෙමළ පිටපතක්ද ඉංග්‍රීසි පිට පතක්ද බලපත්‍රයද රාමුවක දමා බේකරියේ ප්‍රමුඛ ස්ථානයක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. එසේම ඔහු වැඩට ගන්නා සියලු සේවකයන්ගේ (පාන් විකිණීමට ගෙනයන අයත් ඇතුළුවයි) නම් හා ලිපිනයන් සුදානම්කරගත කොයි වේලාවකදී වුවත් සභාපතිහට හෝ ඔහුගෙන් බලය ලත් වෙන ඕනෑම කෙනෙකුට පරීක්ෂා කරබැලිය හැකි වන සේ බේකරියේ තබා තිබීමට සැලැස්විය යුතුය.

7. බලපත්‍රයක් ලත් හැම බේකරියකම බලපත්‍රකාරයා විසින් ජූනි මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් අවුරුද්දකට දෙවතාවක් බේකරියේ හැම කාමරයකම බිත්තිවල හා සිලිමේ සුදුහුණු ගෑවීමත් එහි ලී දඬුවල තීන්ත ගා නැති නම් ජූනි මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් යටත්පිරිසෙයින් අවුරුද්දකට දෙවතාවක් වත් ඒවායෙහි සුදුහුණු ගෑවීමත් තීන්ත ගා තිබේ නම් ඒ ලීදඬු යටත්පිරිසෙයින් එලෙසටම අවුරුද්දකට දෙවතාවක් වත් සබන් හා උණුවතුරෙන් සේදවීමත්, මෙකී වතාවලට අතිරේක වශයෙන් සභාපතිතුමා ලියවිල්ලකින් නියමකර එවවොත් වෙන ඕනෑම විටෙකදී බිත්ති, සිලිං, ලීදඬු යන මේවා සම්බන්ධයෙන් යථෝක්ත පිළියම් කරවීමත් කළ යුතුය.

8. බලපත්‍රයක් ලත් හැම බේකරියකම බලපත්‍රකාරයා විසින් එහි බිමත් බිත්තිවල පිඟන් ගඩොළු අල්ලා හෝ සිමෙන්ති දමා තිබෙන කොටසුත් මේසවල උඩතට්ටුත් ලයිසන් පත්‍රයේ සඳහන්කර තිබෙන වේලාවලදී හැමදම සේදවිය යුතුය. ඔහු විසින් බේකරියේ හැම තැනමත් එහි අවටත් කානුත් ශුද්ධපවිත්‍ර කොට කැඩුම් බිඳුම් නැතිව මනා තත්වයක තිබීමටත් ඒ ස්ථානයෙහි වූ යම් කානුවකින් හෝ වැසිකිළියකින් හෝ කසලවළකින් හෝ සෙසු අප්‍රිය දෙයකින් පැනනගින දුගීන්ධයෙන් තොරව තිබීමටත් සලස්වාගත යුතුය. පාන් සෑදීමේදී පාවිච්චි කරන ලීබඩු, භාජන, උපකරණ යන මේවා ශුද්ධ පවිත්‍ර ලෙසත් සවසාතුකූල ලෙසත් තබාගැනීමට සැලැස්විය යුතුය. වෙළඳාම සඳහා තිබෙන ද්‍රව්‍යවලින් අහක යන දේ හා ගෙදරදොරේ එකතුවන කුණු රොඩු ආදිය පියනක් ඇත්තාවූද දියසිරාව නාල්ලන්නාවූද භාජනයකට වහාම දමා තබ්බවා දවසකට එක් වරක් බේකරියෙන් ඉවත්කරවිය යුතුය. කුණුරොඩු දමන කල හැර අනික් හොයිවේලාවලදීත් ඒ භාජනය වසා තැබ්බවිය යුතුය.

9. බලපත්‍රයක් ලත් හැම බේකරියකම බලපත්‍රකාරයා විසින් පාන් සෑදීම සඳහා හොඳවූද පථ්‍යවූද පිරිත් වතුර හා වෙන ද්‍රව්‍යයනුත් ගත යුතුය. ඔහු විසින් පිටිමිටි ගොඩගසා තබාගත යුත්තේ මෙහි පහත පෙනෙන අන්දමට සාදන ලද්දවූද එහා මෙහා කළ හැකිවූද වේදිකාවක් උඩය—

මේ වේදිකාව තමාට පහසු දිග පළලකට සාදගත හැකිය. එය යටත් පිරිසෙයින් අඩි තුනක් වත් උස කකුල් පිට සවිකළ ශක්තිමත් තනි ලෑලි තට්ටුවකින් යුක්තවිය යුතුය. එහි කකුල් නොගැළවිය හැකි පරිද්දෙන් බිමට සවිනොකළ යුතුය. මීයන්ට කකුල් දිගේ ගොස් ලෑලි තට්ටුව උඩට නඟින්ට බැරිවන ලෙස ලෑලි තට්ටුවේ අයින රාලුවෙන් පිටතට අඟල් 9ක් එළියට නෙරා තිබිය යුතුය. මීයන්ට සැඟවී සිටීමට ලෑලි තට්ටුවේ යටි පැත්තේ රාක්ක හෝ කුහර නොතිබිය යුතුය. උස්සා බිම ශුද්ධපවිත්‍ර කළහැකිවන සේ ඒ වේදිකාව එහා මෙහා කළ හැකි විය යුතුය. එහි බිත්තියේ සිට යටත්පිරිසෙයින් අඟල් 9ක් වත් ඈතින් තැබිය යුතුය.

10. බලපත්‍රයක් ලත් හැම බේකරියකම බලපත්‍රකාරයා 9 වැනි උප නීතියේ සඳහන් වේදිකාව යට හා අවට කිසිවක් තමන්ට ඉඩ නොදී ඒ හරිය නිදහස්ව තබාගත යුතුය. සවසාතුකූල කුණු බාල්දියක්ද යටත්පිරිසෙයින් පඩික්කන් දෙකක්ද බලපත්‍රය ලත් ස්ථානයේ ඔහු විසින් තැබ්බවිය යුතුය. කුණු බාල්දි තැබිය යුත්තේ පාන් සාදන අයට පහසුවෙන් ආහැකි තැන්වලය. එහෙත් ඒවා පිටි පදම් කරන කාමරයේ නොතැබිය යුතුය.

11. බලපත්‍රයක් ලත් හැම බේකරියකම බලපත්‍රකාරයා විසින් බේකරිය මීයන්ගෙන් තොරව තබාගත යුතුවාත් හැර ඒ ස්ථානයේ පෙනෙන්ට තිබෙන සියලු මීගුල් විදුරු කැලිවලින් පුරවා සිමෙන්ති බද මෙන් වසා දැමිය යුතුය.

12. බේකරිය තුළ (හබා තිබෙන) පඩිස්කමට මිය වෙන තැනක කිසිවකු විසින් කෙළ නොගැසිය යුතුය.

13. කිසිවකු විසින් ඕනෑම තරුණක් සඳහාවත් බේකරියේ කිසිම සතකු හෝ තුරුල්ලකු පාලනාගත යුතුය.

14. (1) යම්කිසි වසංගත රෝගයකින් හෝ සංස්පර්ශක (ස්පර්ශයෙන් බෝවෙන) රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන්නාවූ හෝ ළඟදී පෙළුණාවූ හෝ ඒ රෝගයකින් පෙළෙන කෙනෙකුට ළඟදී සාත්තු කළාවූ කිසිවකු ඒ රෝගය බෝවෙන කාලපරිච්ඡේදය හා එහි රෝග ලක්ෂණ මෝරණ කාලපරිච්ඡේදය ඉකුත්වී යන තෙක් බේකරිය පිහිටි ස්ථානයට ඇතුල්වීම හෝ එහි පාන් සෑදීමේ හෝ විකිණීමේ කටයුතුවලට සහභාගිවීම හෝ ඒ ස්ථානයෙන් පාන් විකිණීමට ගෙනයෑම නොකළ යුතුය.

(2) බේකරියක බලපත්‍රකාරයා විසින් දැන දැනම කිසිවකුට මේ උප නීතියේ (1) වැනි ඡේදයේ විධිවිධානයන් කඩකිරීමට ඉඩ නොදිය යුතුය.

15. පාන් සාදන්නාවූ හෝ එකතුකර තබන්නාවූ හෝ පාන් සෑදීමට ගන්නා ද්‍රව්‍යයන් තබන්නාවූ කාමරයෙහි, පාන් සෑදීමට පාවිච්චි කරන ලබු ආදිය හැර වෙන ලීබඩුවක් හෝ රෙදිපිළි හෝ පැදුරු හෝ බඩුවක් බේකරියක බලපත්‍රකාරයා විසින් තබා නොගත යුතුය; නැතහොත් තබා ගැනීමට ඉඩ නොදිය යුතුය.

16. බේකරියක බලපත්‍රකාරයා විසින් බේකරියේම බිමේ හෝ බේකරි ගොඩනැගිල්ලේම වූ කිසි තැනක්, පාන් සාදන්නාවූ හෝ එකතු කර තබන්නාවූ හෝ පාන් සෑදීමට ගන්නා ද්‍රව්‍යයන් රැස්කර තබන්නාවූ ස්ථානවලින්, (බිම සිට සිලිම දක්වාවූ ආවරණයකින්) හොඳින් වෙන් කර (පිටතට හැරූ) ජනේලයකින් යුක්තවත් තිබෙනොත් මිස නිදාගැනීමේ ස්ථානයක් වශයෙන් පාවිච්චි නොකළ යුතුය; නැතහොත් පාවිච්චි කිරීමට ඉඩ නොදිය යුතුය. ඒ ජනේලය ඇරිය එහි වර්ග ප්‍රමාණය භූමියේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවිය යුතුය.

17. පාන් සකස්කිරීමේ හා සෑදීමේ කටයුතු කරන හැම අයකුම ඒ කටයුතුවල යෙදීමට මත්තෙන් අත් සෝදාගෙන පපුව හා උදරය වැසෙන පරිදි පිරිසිදු සුදු ඒප්‍රණයක් (Apron) ඇඳගෙන පිරිසිදු සුදු කැප් තොප්පියක් දමාගත යුතුය; නැතහොත් පිරිසිදු තලප්පාවක් බැඳගත යුතුය.

18. බලපත්‍රයක් ලත් හැම බේකරියකම බලපත්‍රකාරයා විසින් පාන් සෑදීමේ කටයුතුවල යෙදී සිටින අයට පිරිසිදු වතුර, පිරිසිදු තුවා, නිය කපන බුරුසු, සබන් යන මේවා සැපයිය යුතුවාත් හැර ඒවා ඔවුන්ට පහසුවෙන් ගතහැකි තැනක තැබ්බවිය යුතුය.

19. බලපත්‍රයක් ලත් හැම බේකරියකම බලපත්‍රකාරයා විසින් බීමට යෝග්‍ය වතුර සෑහෙන තරමට ඒ බේකරියට ලබාදිය යුතුය.

20. බලපත්‍රයක් ලත් කිසිම බේකරියක බලපත්‍රකාරයා විසින් මී, මැස්සන්, කුරුමිණි ආදී සතුන් හා දූවිලි නොවදින පරිදි නිසි ලෙස සෑදූ පිරිසිදු විදුරු පෙට්ටිවල දමා මිස ඒ බේකරිය තුළ විකිණීම සඳහා පාන් තැබීම හෝ තැබ්බවීම නොකළ යුතුය.

21. බලපත්‍රයක් ලත් හැම බේකරියකම බලපත්‍රකාරයා විසින් ඒ බේකරියේ කාටත් පෙනෙන තැනක සම්මත පඩි සහිත තරාදියක් තබා තැබීමට සැලැස්විය යුතුවාත් හැර විකුණන ලද පාන් ගෙඩියක් හෝ විකිණීමට තබා තිබෙන පාන් ගෙඩියක් කිරන්ට ඕනෑයයි යම් ගැනුම්කාරයකු කියා සිටියොත් එසේද කළ යුතුය.

22. කිසිම බේකරියක බලපත්‍රකාරයා විසින් සභාපතිහුත් තමාත් අත්සන් කළ ලියා පදිංචිකිරීමේ කාඩ්පත්‍රයක් ළඟ නැති කිසිවකුට බේකරියෙන් විකිණීම සඳහා පාන් ගෙනයෑමට ඉඩ නොදිය යුතුය.

23. බේකරියක බලපත්‍රකාරයා පාන් විකිණීමට යැවීම පිණිස රඳවා සිටින එක් එක් අයගේ පාවිච්චියට දීමට ලියාපදිංචිකිරීමේ කාඩ් ඉල්ලූ විට සභාපතිහු විසින් ඒවා නොමිලයේ දිය යුතුය.

[illegible] සෞඛ්‍ය ... හෝ වසතල ... [illegible] බලපත්‍රකාරයා විසින් ... නොදුම ... බේකරියෙන් විකිණීම සඳහා පාන් ගෙනයෑමට ඉඩ නොදිය ... එසේ ගෙනයෑමට ඉඩ දීමට මත්තෙන් බලපත්‍රකාරයා විසින් ඒ ... පෙට්ටිය හෝ විත්එක ... භාජනය පරීක්ෂාකොට එය ... සෞඛ්‍යදායක ලෙසටත් තිබෙන බව පිළිගත යුතුය.

... යුක්තිසහගත ඕනෑම වේලාවකදී හෝ පිටි පදම්කිරීම හෝ පාන් ... කරන ඕනෑම වේලාවකදී—

(අ) සභාපතිහට හෝ ඔහු විසින් ඒ සඳහා සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරන ලද්දාවූ (නගර සභාවේ) ඕනෑම නිලධාරියකුට බේකරියට ඇතුල්වී එය පරීක්ෂාකිරීමට බලය තිබිය යුතුය.

(ආ) බේකරියක බලපත්‍රකාරයා විසින් හෝ ඒ බේකරිය බාරයේ සිටින තැනැත්තා විසින් සභාපතිහට හෝ ඔහුගෙන් ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියකුට බේකරියට ඇතුල්වී පරීක්ෂා කිරීමට ඉඩ දී ඒ සම්බන්ධයෙන් වුවමනාවිය හැකි හැම උපකාරයක්ම කළ යුතුය.

... බේකරි පිළිබඳ මේ උප නීතිවලින් කවරක් වුවත් කඩකරන හැම ... රුපියල් දෙසියපනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද, ... කිරීම ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීමක් ... කරන සභාපතිහු හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු දැන්වීම්පතක් බාර දුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහකට වැඩි නුවූ අමතර දඩයක් ගැසීමෙන්ද දඬුවම් දිය හැකි විය යුතුය.

27. බේකරි පිළිබඳ මේ උපනීතිවලින් කවරක් වුවත් කඩකිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයා කරනු ලැබූ බලපත්‍ර කාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමටද ඊට අතිරේක වශයෙන් ඔහුට වෙන යම්කිසි දඬුවමක් දීමටද (සෑහෙන අධිකරණ බලය ඇති) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අභියාචනයක් අයනාර ලැබීමට බලපත්‍රකාරයාට අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## IV වැනි කාණ්ඩය

### බත්කඩ, තේ කෝපි කඩ යන මේවා පිළිබඳ උපනීති

1. (1) සභාපතිහුගෙන් බත්කඩයක් හෝ භෝජනාගාරයක් හෝ තේ කෝපි කඩයක් දමා ගැනීමට ලබාගත් බලපත්‍රයක් පිට මිස කිසිවකු විසින් බත්කඩයක් හෝ තේ කෝපි කඩයක් දැමීම හෝ පවත්වාගෙන යෑම නොකළ යුතුය.

(2) මේ උප නීතියේ 1 වැනි ඡේදය යටතේ දෙන හැම බලපත්‍රයක්ම 25 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකළහොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එක්වැනිදා අහෝසි විය යුතුය.

2. බලපත්‍රය දීමට හිමෙන ස්ථානය පහත සඳහන් කොන්දේසිවලට ගැළපෙනොත් මිස නැත් නම් බත්කඩයක් හෝ තේ කෝපි කඩයක් දැමීම පිණිස බලපත්‍රයක් ලබාගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය:—

(1) ගොඩනැගිල්ල හොඳින් අලුත්වැඩියා කොට හොඳින් වාතය හා ආලෝකය ලැබෙන ලෙසට සාදා තිබිය යුතුය. හැම කාමරයකම බිමේ වර්ග ප්‍රමාණය යටත් පිරිසෙයින් වර්ග අඩි එක්සිය විස්සක් වත් විය යුතුවාත් හැර විවෘතකළ හැකි ජනේල්ද තිබිය යුතුය. ඒ ජනේල් විවෘත කළ විට ඒවායේ වර්ග ප්‍රමාණය බිමේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවිය යුතුය;

(2) හැම කාමරයකම කොයිම බිත්තියක්වත් උසින් අඩි හතකට අඩු නොවිය යුතුය. ඒ බිත්ති ගඩොලෙන් හෝ කළු ගලෙන් හෝ කබුක් ගලෙන් බැඳ තිබිය යුතුය, ඒවායේ ඇතුල් පැත්ත හුණු බදාමෙන් කපලාරුකොට සුදුහුණු ගා තිබිය යුතුය;

(3) වහල්පලය පොළෝ මට්ටමේ සිට යටත් පිරිසෙයින් අඩි 6ක් වත් උස්විය යුතුය;

(4) කල් පවතින ද්‍රව්‍යයකින් වහල සෙවිලි කොට තිබිය යුතුය;

(5) ලීදඬුවල තීන්ත හෝ සුදුහුණු ගා තිබිය යුතුය;

(6) බිම හැම තැනම සිමෙන්ති දමා තිබිය යුතුය;

(7) ස්ථානයෙහි සෑහෙන පමණ කානුද සමස්ථානුකූල කුණු බාල්දියක්ද සෑහෙන පමණ වැසිකිළිද තිබිය යුතුය.

3. (1) ඕනෑම බත්කඩයකට හෝ තේ කෝපි කඩයකට බලපත්‍රයක් දී තිබෙන කාලපරිච්ඡේදය ඇතුළත ඕනෑම වේලාවකදී ඒ බත්කඩය හෝ තේ කෝපි කඩය සඳහා පාවිච්චිකරන ඕනෑම ගොඩනැගිල්ලක් 2වැනි උපනීතියේ විධිවිධානයන්ට නොගැළපෙන තත්ත්වයකට පත් වුවහොත් ඒ ගොඩනැගිල්ල ඒ විධිවිධානයන්ට අනුකූල කරවීමට කළ යුතු හැම දෙයක්ම අසවල් දිනයට මත්තෙන් කළ යුතුයයි නියමකොට ඒ බත්කඩයේ හෝ තේ කෝපි කඩයේ බලපත්‍රකාරයා වෙත දැන්වීමක් යවන්ට සැලැස්වීමට සභාපතිහට බලය ඇත්තේය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබූ බලපත්‍රකාරයකු ඒ දැන්වීමේ නියමිත කාලපරිච්ඡේදය ඇතුළතදී එහි කියා ඇති කටයුතු නොකර සිටිය යුතු නොවේ.

(3) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේවූ ඕනෑම දැන්වීමක් (බලපත්‍රකාරයා) බත්කඩයේ හෝ තේ කෝපි කඩයේ කටයුතු කර ගෙන යන ස්ථානයෙහි ගැසුවහොත් නැතහොත් බලපත්‍රකාරයා ඒ ස්ථානයෙහි රක්ෂාවෙහි යොදවාගෙන සිටින යම් කිසිවකුට බාරදුන් හොත් බලපත්‍රකාරයාටම භාරදුන්නාකොට සැලකිය යුතුය.

4. බලපත්‍රයක් ලත් හැම බත්කඩයකම හෝ තේ කෝපි කඩයක බලපත්‍රකාරයා විසින් තමාගේ නම හා "බලපත්‍රයක් ලත් බත්කඩය" හෝ "බලපත්‍රයක් ලත් තේ කෝපි කඩය" යන්න සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මේ භාෂාත්‍රයෙන් ලෑල්ලක පැහැදිලි ලෙස පින්තාරුකොට ඒ ස්ථානයේ පිට පැත්තේ ප්‍රකට ස්ථානයක එල්ලා තබාගත යුතුය.

5. බලපත්‍රයක් ලත් හැම බත්කඩයකම හෝ තේ කෝපි කඩයකම බලපත්‍රකාරයා විසින් බත්කඩ හෝ තේ කෝපි කඩ පිළිබඳ උප නීති මාලාවේ සිංහල පිටපතක්ද දෙමළ පිටපතක්ද ඉංග්‍රීසි පිටපතක්ද බලපත්‍රයද රාමුවල දමා ඒ කඩයේ ප්‍රකට ස්ථානයක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. තවද ඔහු විසින් වැඩට ගන්නා සියලු සේවක යන්ගේ නම් හා ලිපිනයන් ලැයිස්තුවක් වශයෙන් ලියා සභාපතිහට හෝ ඔහුගෙන් බලය ලත් වෙන ඕනෑම කෙනෙකුට යුක්තිසහගත කොයි වේලාවකදී වුවත් පරීක්ෂාකර බැලීමට හැකිවන සේ ඒ කඩයේ තබා තිබීමට සැලැස්විය යුතුය.

6. බලපත්‍රයක් ලත් හැම බත්කඩයකම හෝ තේ කෝපි කඩයකම බලපත්‍රකාරයා විසින් ජූනි මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් අවුරුද්දකට දෙවතාවක් ඒ කඩයේ හැම කාමරයකම බිත්තිවල සුදුහුණු ගෑවීමත් මාර්තු මාසයේදී වරක්ද ජූනි මාසයේදී වරක්ද සැප්තැම්බර් මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් අවුරුද්දකට සතර වතාවක් සිලිමේ සුදුහුණු ගෑවීමත් කරවිය යුතුය. එසේම ලී දඬුවල තීන්ත ගා තිබේ නම් ජූනි මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් අවුරුද්දකට යටත්පිරිසෙයින් දෙවතාවක් හා සභාපතිතුමා නියම කරන සෙසු වතාවනුවලදී ඒ ලීදඬු සබන් හා උණුවතුරෙන් සේදවීමත් තීන්ත හා නැතිනම් එපරිද්දෙන්ම ඒවායෙහි සුදුහුණු ගෑවීමත් කරවිය යුතුය.

7. බලපත්‍රයක් ලත් හැම බත්කඩයකම හෝ තේ කෝපි කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයේ හැම තැනමත් එහි අමටෝ කානුත් ශුද්ධ පවිත්‍රකොට කැඩුම්බිඳුම් නැතිව මනා තත්ත්වයක තිබීමටද ඒ ස්ථානයේවූ යම් කානුවකින් හෝ වැසිකිළියකින් හෝ කසළවලකින් හෝ සෙසු අප්‍රිය දෙයකින් පැනනගින දුගඳින් තොරව තිබීමටද සැලැස්විය යුතුය. ආහාරපාන වර්ග පිළියෙල කිරීම හෝ විකිණීම හෝ කෑම බීම සඳහා පාවිච්චිකරන සියලු ලීබඩු, භාජන, උපකරණ යන මේවා ශුද්ධපවිත්‍ර ලෙසත් සෞඛ්‍යානුකූල ලෙසත් තබාගැනීමට ඔහු විසින් සැලැස්විය යුතුය.

8. බලපත්‍රයක් ලත් හැම බත්කඩයකම හෝ තේ කෝපි කඩයකම බලපත්‍රකාරයා ආහාරපාන පිළියෙල කිරීම හෝ විකිණීම හෝ කෑමබීම සඳහා ඒ ස්ථානයෙහි පාවිච්චි කරන සියලු භාජන යටත්පිරිසෙයින් පැය විසිහතරකට වරක් වත් සබන් හා උණු වතුරෙන් සේදවිය යුතුය.

9. බලපත්‍රයක් ලත් හැම බත්කඩයකම හෝ තේ කෝපි කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයට කෑමට බීමට එන කෙනෙකු භාජනයක් පාවිච්චිකල වහාම වෙන අයකු පාවිච්චි කරන්නට මත්තෙන් එය සේදවිය යුතුය.

10. බලපත්‍රයක් ලත් හැම බත්කඩයකම හෝ තේ කෝපි කඩයකම බලපත්‍රකාරයා විසින් ආහාරපානාදියෙන් අහක යන කොටස හා ඒ ස්ථානයෙහි එකතුවන කුණු රොඩු, පියනක් ඇති (වතුර උරා නොගන්නා) භාජනයකට දම්මවා දින පතා ඒ භූමිභාගයෙන් ඉවත්කරවිය යුතුය. කුණු රොඩු ඇතුලට දමන වේලාවේදී හැර සෙසු හැම විටම ඔහු විසින් ඒ භාජනය වසා තැබ්බවිය යුතුය. අහක දමන සියලු තේ රොඩු, හෝ කෝපි මණ්ඩි හෝ කිරි හෝ ඉඳුල් කෑම හෝ ආහාර ද්‍රව්‍යවලින් අහක යන දේ ඔහු විසින් බිම දමන්ට ඉඩ නොදී ඒ භාජනයට දමා එකතු කරවිය යුතුය.

11. බත්කඩයක හෝ තේ කෝපි කඩයක බලපත්‍රකාරයා විසින් තේ හෝ කෝපි හෝ කිරි දෙන කොයි කවුන්ටරයක් හෝ ස්ථානයක් වුවත් භුත්තනාගම් තහඩුවකින් හෝ දිය සීරාව නාල්ලන වෙන ද්‍රව්‍යයකින් වසා තිබෙතොත් මිස නැත්නම් ඒ සඳහා පාවිච්චි නොකල යුතුය.

12. බලපත්‍රයක් ලත් හැම බත්කඩයකම හෝ තේ කෝපි කඩයකම බලපත්‍රකාරයා විසින් එහි රක්ෂාවේ නියුක්තවූවන්ට හා ඒ ස්ථානයට පැමිණෙන ආගන්තුකයන්ටද පහසුවෙන් පාවිච්චිකල හැකිවන පරිද්දෙන් ඒ ස්ථානයෙහි සෞඛ්‍යානුකූල බාල්දියක්ද, යටත්පිරිසෙයින් පඩික්කම් දෙකක්ද නිතරම තැබ්බවිය යුතුය.

13. බලපත්‍රයක් ලත් හැම බත්කඩයකම හෝ තේ කෝපි කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානය මීයන් වැද්ද නොදී තබාගත යුතු වාත් හැර ඒ ස්ථානයේ මීගුල් තිබෙනවා දකින්ට ලැබුණොත් වහාම ඒවා සියල්ල වීදුරු කැබලිවලින් පුරවා සිමෙන්තියෙන් උපලාරුකොට වසා දම්ම විය යුතුය.

14. බලපත්‍රයක් ලත් හැම බත්කඩයකම හෝ තේ හා කෝපි කඩයකම බලපත්‍රකාරයා විසින් බීමට සුදුසු වතුර සෑහෙන තරමට ඒ ස්ථානයෙහි තබාගත යුතුය.

15. බලපත්‍රයක් ලත් 'කිසිම බත්කඩයක හෝ තේ කෝපි කඩයක බලපත්‍රකාරයා විසින් කිසිම ආහාර වර්ගයක් මැසි, කෘමි ආදී සතුන් හා දූවිලි නොවදින ලෙස සෑදූ භාජනවල දමා මිස විකිණීම පිණිස තැබීම හෝ රැස්කර තැබීම හෝ පෙනෙන්ට තැබීම නොකට යුතුය. ඔහු විසින් ඒ භාජන පිරිසිදු ලෙසත් සෞඛ්‍යානුකූල ලෙසත් තබාගත යුතුය.

16. කිසිම බත්කඩයක හෝ භෝජනාගාරයකට හෝ තේ කෝපි කඩයකට අයත් භූමිභාගයෙහි දූෂිත කිරි තබාගැනීම හෝ විකිණීම හෝ නොකට යුතුය.

මේ උපනීතිය සම්බන්ධයෙන් "දූෂිත කිරි" යන්නෙන් අදහස් කරන්නේ වතුර හෝ වෙන ඕනෑම බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයක් මිශ්‍ර කරනලද කිරිය; නැතහොත් මේදය තුවූ ක්ෂීර ධාතුව සියයට 8.50 කරනලද කිරිය; නැතහොත් මේදය සියයට 3.50 අඩුවූ එළකිරිය; නැතහොත් මේදය අඩුවූ හෝ මේදය සියයට 9කට අඩුවූ හෝ මේදය සියයට 70 අඩුවූ මී හරක් ක්ෂීරධාතුව සියයට 9කට අඩුවූ හෝ මේදය සියයට 70 අඩුවූ මී කිරිය. මේ ව්‍යවස්ථාව කඩ කළොත් ඒ ගැන යටත්වන්නේ බලපත්‍රකාරයාය.

17. බලපත්‍රයක් ලත් ස්ථානය ඇතුලත ජජික්කමකට මිස වෙන කිසිම තැනක කිසිවකු විසින් කෙළ නොගැසිය යුතුය.

18. යම්කිසි වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්මරෝගයකින් පෙළෙන්නාවූ හෝ ළඟදී පෙළුණාවූ හෝ ඒ රෝගයකින් පෙළෙන කෙනෙකුට ළඟදී සාත්තු කළාවූ කිසිවකු ඒ රෝගය බෝවෙන කාලපරිච්ඡේදය හා එහි රෝග බීජයන් මෝදුවී ගනවන කාලපරිච්ඡේදය ඉකුත්වී යන තෙක් බත්කඩයට හෝ තේ කෝපි කඩයට ඇතුල්වීම හෝ එහි ආහාරපාන වර්ග පිළියෙල කිරීමේ හෝ වෙළඳාම් කිරීමේ කටයුතුවලට සහභාගිවීම නොකල යුතුය.

19. කිසිම බත්කඩයක හෝ තේ කෝපි කඩයක බලපත්‍රකාරයා විසින් දැන දැනම කිසිවකුට 17 වැනි උපනීතියේ හෝ 18 වැනි උපනීතියේ විධිවිධාන කඩ කිරීමට ඉඩ නොදිය යුතුය.

20. කිසිම බත්කඩයක හෝ තේ කෝපි කඩයක බලපත්‍රකාරයා විසින් සභාපතිතුමා හට අත්සන් කල ලියාපදිංචිකිරීමේ කාඩ්පත්‍රයක් ළඟ ඇතුවද වැසූ පෙට්ටියක හෝ ටින් එකක හෝ වෙන සුදුසු භාජනයක දමා ගෙනද මිස නැත්නම් කිසිවකුට බලපත්‍රය ලත් ස්ථානයෙන් පිටතට විකිණීම සඳහා පිසූ ආහාර ගෙන යෑමට ඉඩදිය නොදිය යුතුය

21. ආහාර ගෙනයෑම සඳහා පාවිච්චි කරන සියලු රථවාහන හෝ පෙට්ටි හෝ ටින් හෝ සෙසු භාජන ආහාර දමන වේලාවේදී පිරිසිදුව තිබෙන බවට (බලපත්‍රයක් ලත්) හැම බත්කඩයකම හෝ තේ කෝපි කඩයකම බලපත්‍රකාරයා විසින් වග බලාගත යුතුය.

22. ඕනෑම බත්කඩයක හෝ තේ කෝපි කඩයක (පිසූ) ආහාර විකිණීමට යැවීම සඳහා රඳවාගෙන සිටින හැම පුද්ගලයකුගේම ළඟ තබාගැනීමට ආහාර රෙජිස්තර (ලියාපදිංචි කිරීමේ) කාඩ්පත් ඒ බත්කඩයේ හෝ තේ කෝපි කඩයේ බලපත්‍රකාරයා ඉල්ලූ විටෙක සභාපතිතුමා නොමිලයේ දිය යුතුය.

23. (1) සභාපතිහට හෝ ඔහු විසින් ඒ සඳහා සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරනලද (නගර සභාවේ) ඕනෑම නිලධාරියකුට යුක්ති සහගත ඕනෑම වේලාවකදී ඕනෑම බත්කඩයට හෝ තේ කෝපි කඩයකට ඇතුල්වී එය පරීක්ෂාකිරීමට බලය තිබිය යුතුය.

(2) බත්කඩයේ හෝ තේ කෝපි කඩයේ බලපත්‍රකාරයා විසින් හෝ එය භාරව සිටින තැනැත්තා විසින් සභාපතිහට හෝ ඔහුගෙන් ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියකුට ඒ ස්ථානයට ඇතුල්වී පරීක්ෂාකිරීමට ඉඩ දී ඒ සඳහා සභාපතිහට හෝ ඒ නිලධාරියාට වුවමනා විය හැකි හැම උපකාරයක්ම කල යුතුය.

24. බත්කඩ හෝ තේ කෝපි කඩ පිළිබඳ මෙ උපනීතිවලින් කවරක් වුවත් කඩකරන හැම ප්‍රස්තාවයකදීම රුපියල් දෙසිය පනහකට වැඩි නුවූ දඩයක් ගෑසීමෙන්ද ඒ කඩකිරීම ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීම ගැන සිගිපත් කරවා සභාපතිතුමා හෝ ඔහු විසින් බලය පවරනලද නිලධාරියකු දන්වීම පතක් භාර දුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහකට වැඩි නොවූ අමතර දඩයක් ගෑසීමෙන්ද දඬුවම් දියහැකි විය යුතුය.

25. බත්කඩ හෝ තේ කෝපි කඩ පිළිබඳ මේ උපනීතිවලින් කවරක් වුවත් කඩකිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයා කරනු ලැබූ බලපත්‍රකාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමටද ඊට අතිරේක වශයෙන් ඔහුට වෙන යම්කිසි දඬුවමක් දීමටද (සෑහෙන අධිකරණ බලය ඇති) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකර ගැනීමට බලපත්‍රකාරයාට කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## V වැනි කාණ්ඩය

### භෝජනාගාර පිළිබඳ උපනීති

1. (1) භෝජනාගාරයක් [illegible] ගැනීමට සභාපතිතුමාගෙන් ලත් බලපත්‍රයක් පිට මිස කිසිවකු විසින් භෝජනාගාරයක් (Restaurant) දමා නොගත යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දෙන හැම බලපත්‍රයක්ම 22 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස 31 වැනිදා අහෝසි විය යුතුය.

2. බලපත්‍රයක් දීමට තිබෙන ස්ථානය පහත සඳහන් කොන්දේසිවලට ගැලපෙතොත් මිස නැත්නම් භෝජනාගාරයක් දැමීම පිණිස බලපත්‍රයක් ලබාගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය:—

(1) ගොඩනැගිල්ල හොඳින් අලුත්වැඩියා කොට හොඳින් වාතය හා ආලෝකය ලැබෙන ලෙසට සාද තිබිය යුතුය. හැම කාමරයකම බිමේ වර්ග ප්‍රමාණය අවුම ගණනේ වර්ග අඩි 120ක් වත් විය යුතුවාත් හැර විවෘත කල හැකි ජනෙල්ද තිබිය යුතුය. ඒ ජනෙල් විවෘත කල විට ඒවායේ වර්ග ප්‍රමාණය බිමේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවිය යුතුය;

(2) හැම කාමරයකම කොයිම බිත්තියක් වත් උසින් අඩි හතකට අඩු නොවිය යුතුය. ඒ බිත්ති ගඩොලෙන් හෝ කළුගලෙන් හෝ කබුක් ගලෙන් බැද තිබිය යුතුය. ඒවායේ ඇතුල් පැත්ත ඉණු බදාමෙන් සපලාරු කොට සුදුහුණු ගා තිබිය යුතුය;

CamScanner

(3) වහල්පලය පොළෝ මට්ටමේ සිට අඩුම ගණනේ අඩි 6ක් වත් උස් විය යුතුය;

(4) තල් පවතින ද්‍රව්‍යයකින් වහල සෙවෙලි කොට තිබිය යුතුය;

(5) ඒ දඬුවල තීන්ත හෝ සුදුහුණු ගා තිබිය යුතුය;

(6) බිම හැම තැනම සිමෙන්ති දමා තිබිය යුතුය;

(7) ස්ථානයෙහි සෑහෙන පමණ කානුද සවස්ථානුකූල කුණු බාල්දි යක්ද සෑහෙන පමණ වැසිකිළිද තිබිය යුතුය.

3. (1) ඕනෑම භෝජනාගාරයකට බලපත්‍රයක් දී තිබෙන කාල පරිච්ඡේදය ඇතුළත ඕනෑම වේලාවකදී ඒ භෝජනාගාරය සඳහා පාවිච්චි කරන ඕනෑම ගොඩනැගිල්ලක් 2 වැනි උපනීතියේ විධිවිධාන යන්ට නොගැළපෙන තත්ත්වයකට පත්වුව හොත් ඒ ගොඩනැගිල්ල ඒ විධිවිධානයන්ට අනුකූල කරවීමට කළයුතු හැම දෙයක්ම අසවල් දිනයට මත්තෙන් කළ යුතුයයි නියමකොට ඒ භෝජනාගාරයේ බල පත්‍රකාරයා වෙත දැන්වීමක් යවන්ට සැලැස්වීමට සභාපති හට බලය ඇත්තේය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබූ බලපත්‍රකාරයකු ඒ දැන්වීමේ නියමිත කාලපරිච්ඡේදය ඇතුළතදී ඒ කටයුතු නොකර සිටිය යුතු නොවේ.

(3) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේවූ ඕනෑම දැන්වීමක් බලපත්‍රකාරයා භෝජනාගාරයේ කටයුතු කරගෙන යන ස්ථානයෙහි ගැසුව හොත් නැතහොත් බලපත්‍රකාරයා ඒ ස්ථානයෙහි රක්ෂාවෙහි යොදවාගෙන සිටින යම් කිසිවකුට භාරදුන්නොත් බලපත්‍රකාරයාටම භාරදුන් සේ සැලකිය යුතුය.

4. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම බලපත්‍රකාරයා විසින් භෝජනාගාර පිළිබඳ මේ උපනීති මාලාවේ සිංහල පිටපතක්ද දෙමළ පිටපතක්ද ඉංග්‍රීසි පිටපතක්ද බලපත්‍රයද රාමුවල දමා, ඒ ස්ථානයෙහි කාටත් පෙනෙන තැනක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. තවද ඔහු විසින් වැඩට ගන්නා සියලු සේවකයන්ගේ නම් හා ලිපිනයන් ලැයිස්තුවක් වශයෙන් ලියා සභාපතිහට හෝ ඔහුගෙන් බලය ලත් ඕනෑම කෙනෙකුට යුක්ති සහගත කොයි වේලාවකදී වුවත් පරීක්ෂාකර බැලීමට හැකිවන සේ ඒ ස්ථානයෙහි තබා තිබිය යුතුය.

5. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම බලපත්‍රකාරයා විසින් ජූනි මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් අවුරුද්දකට දෙවතාවක් ඒ ස්ථානයේ හැම කාමරයකම බිත්තිවල සුදුහුණු ගැවිය යුතුය. එසේම මාර්තු මාසයේදී වරක්ද ජූනි මාසයේදී වරක්ද සැප්තැම්බර් මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් අවුරුද්දකට හතර වතාවක් සිලිමේ සුදුහුණු ගැවීමත් ලීදඬුවල තීන්ත ගා තිබේ නම් ජූනි මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් අවුරුද්දකට යටත්පිරිසෙයින් දෙවතාවක් හා සභාපතිහු ලියවිල්ලකින් නියම කරන සෙසු වකවානුවලදී ඒ ලීදඬු සබන් හා උණු වතුරෙන් සේදවීමත් තීන්ත ගා නැති නම් එපරිද්දෙන්ම ඒවායේ සුදුහුණු ගැවීමත් කරවිය යුතුය.

6. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයේ හැම තැනමත් එහි අවටත් කාණුත් ශුද්ධපවිත්‍ර කොට කැඩුම් බිඳුම් නැතිව මනා තත්වයක තිබීමටද ඒ ස්ථානයේ වූ කානු වකින් හෝ වැසිකිළියකින් හෝ කසලවලකින් හෝ සෙසු අප්‍රිය දෙයකින් පැන නගින දුර්ගන්ධයෙන් තොරව තිබීමටද සැලැස්විය යුතුය. ආහාරපාන වර්ග පිළියෙල කිරීමට හෝ විකිණීමට හෝ කෑම බීමට පාවිච්චි කරන සියලු ලීබඩු, භාජන, උපකරණ යන මේවා ශුද්ධ පවිත්‍ර ලෙසත් සවස්ථානුකූල ලෙසත් තබාගැනීමට ඔහු විසින් සැලැස් විය යුතුය.

7. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම බලපත්‍රකාරයා විසින් තේ හෝ කෝපි හෝ කිරි දීම සඳහා පාවිච්චි කරන කවුන්ටරයෙහි හෝ තැනෙහි තුත්තනාගම් තහඩුවක් හෝ දිය සීරාව නාල්ලන වෙන ද්‍රව්‍යයක් ඇල්ලවිය යුතුය.

8. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම බලපත්‍රකාරයා විසින් ආහාරවර්ග පිළියෙල කිරීමට හෝ විකිණීමට හෝ තැබීමට පාවිච්චි කරන සියලු භාජන ශුද්ධපවිත්‍රව හා සවස්ථානුකූලව තිබීමට අවශ්‍ය [illegible] පරිදි සබන් ගාවා සේදවිය යුතුය. මේ සේදවීම පැ. විසිහතරකට [illegible] වරකට අඩු නොවිය යුතුය.

[illegible] බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම බලපත්‍රකාරයා විසින් [illegible] ස්ථානයට කෑමට බීමට එන කෙනෙකු පාවිච්චි කළ කොයි භාජන [illegible] වුවත් වෙන කෙනෙකු පාවිච්චි කරන්ට මත්තෙන් සේදවිය [illegible]

[illegible] බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම බලපත්‍රකාරයා විසින් [illegible] ස්ථානයෙහි සවස්ථානුකූල කුණු බාල්දියක්ද යටත්පිරිසෙයින් [illegible] දෙකක්ද නිතරම තබා තිබීමට සැලැස්විය යුතුය. ඔහු විසින් [illegible] තැබ්බවිය යුත්තේ ඒ ස්ථානයේ රක්ෂාවේ නියුක්තවූ [illegible] එහිදී කෑම බීම කන බොන අයට පහසුවෙන් ආ හැකි [illegible]

[illegible] බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම බලපත්‍රකාරයා විසින් [illegible] අහක යන කොටස හා ඒ ස්ථානයෙහි එකතුවන [illegible] (පියනක් ඇත්තාවූද වතුර උරා නොගන්නාවූද) [illegible] දිනපතා ඒ ස්ථානයෙන් ඉවත් කරවිය යුතුය.

අහක දමන සියලු තේ රොඩු හෝ කෝපි මණ්ඩි හෝ කිරි සේ ඉදුල් කෑම හෝ ආහාර ද්‍රව්‍යවලින් අහක යන දේ ඔහු විසින් ඒ භාජනයට දම්මවා, එකතු කරවිය යුතුය. කුණුරොඩු ඇතුළට දමන වේලාවලදී හැර සෙසු හැම විටම ඒ භාජනය වසා තැබ්බවිය යුතුය.

12. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානය මීයන් වැද්ද නොදී තබාගත යුතුවාත් හැර ඒ ස්ථානයේ මීගුල් තිබෙනවා දකින්ට ලැබුණොත් වහාම ඒවා සියල්ල විදුරු කැබලිවලින් පුරවා සිමෙන්තියෙන් තපලාරු කොට වසා දම්ම විය යුතුය.

13. ඕනෑම භෝජනාගාරයක බලපත්‍රකාරයා විසින් කිසිවකුට ඒ ස්ථානයේදී පඩික්කමකට මිස වෙන කිසිම තැනක කෙළ ගැසීමට ඉඩ නොදිය යුතුය. වසංගත රෝගයකින් හෝ චර්ම රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන හෝ ඒ රෝගයකින් පෙළෙන්නාවූ හෝ ළඟදී පෙළුනාවූ සිටියාවූ කිසිම කෙනකුට ඒ රෝගය බෝවීමට හා රෝග බීජ බෙදීමට ගතවන කාලපරිච්ඡේදයන් පසුවන තෙක් ඒ ස්ථානයට ඇතුල්වීමට හෝ ආහාර පාන වර්ග සකස් කිරීමේ හෝ විකිණීමේ කටයුතුවලට සහභාගීවීමට ඔහු විසින් ඉඩ නොදිය යුතුය.

14. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම බලපත්‍රකාරයා විසින්, බීමට සුදුසු වතුර සෑහෙන තරමට ඒ ස්ථානයෙහි තබාගත යුතුය.

15. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම බලපත්‍රකාරයා විසින් රස්කර තබන්නාවූ හෝ විකිණීම පිණිස පෙනෙන්ට තබන්නාවූ සියලු ආහාර මැස්සන්, කෘමි ආදී සතුන් හා දූවිලි නොවදින ලෙස භාජන වල දමා තැබීමට සැලැස්විය යුතුය. ඔහු විසින් ඒ භාජන නිතරම පිරිසිදු ලෙසත් සවස්ථානුකූල ලෙසත් තබාගත යුතුය.

16. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම පාවිච්චි කරන සීනි, කට පළල්වූද විදුරු මූඩියක් ඇත්තාවූද බෝතලවල දමා තැබීමට ඒ ස්ථානයේ බලපත්‍රකාරයා විසින් සැලැස්විය යුතුය.

17. ඕනෑම භෝජනාගාරයක බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයෙහි දූෂිත කිරි විකිණීම හෝ තබා ගැනීම නොකට යුතුය.

මේ උපනීතිය සම්බන්ධයෙන් "දූෂිත කිරි" යන්නෙන් අදහස් කරන්නේ වතුර හෝ වෙන ඕනෑම බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයක් මිශ්‍ර කරන ලද කිරිය; නැතහොත් මේධය නුවූ ක්ෂීරධාතුව සියයට 8.5ට අඩුවූ හෝ මේධය සියයට 3.5ට අඩුවූ එළකිරිය; නැතහොත් මේධය නුවූ ක්ෂීරධාතුව සියයට 9කට අඩුවූ හෝ මේධය සියයට 7ට අඩුවූ මීකිරිය.

18. ඕනෑම භෝජනාගාරයක බලපත්‍රකාරයා විසින් සභාපතිහු හා තමා අත්සන් කළ ලියාපදිංචි කිරීමේ පත්‍රයක් ළඟ ඇතිව වැසූ රථ වාහනයක හෝ පෙට්ටියක හෝ ටින් එකක හෝ වෙන සුදුසු භාජනයක දමාගෙන ගෙනයනොත් මිස නැත්නම් කිසිම කෙනෙකුට ඒ ස්ථාන යෙන් පිටතට විකිණීම සඳහා පිසූ ආහාර වර්ග ගෙනයෑමට ඉඩ නොදිය යුතුය. ඒ හැම රථවාහනයක්ම හෝ පෙට්ටියක්ම හෝ ටින් එකක්ම හෝ වෙන භාජනයක්ම නිතරම පිරිසිදු ලෙසත් සවස්ථානුකූල ලෙසත් තබා ගැනීමට ඒ බලපත්‍රකාරයා විසින් වගබලාගත යුතුය.

19. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම (පිසූ) ආහාර විකිණීමට යැවීම සඳහා රඳවාගෙන සිටින හැම පුද්ගලයකුගේම ළඟ තබාගැනීමට ලියාපදිංචි කිරීමේ පත්‍ර ඒ භෝජනාගාරයේ බලපත්‍රකාරයා ඉල්ලූ විටෙක සභාපතිහු විසින් නොමිලයේ දිය යුතුය.

20. (1) සභාපතිහට හෝ ඔහු විසින් ඒ සඳහා සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරන ලද නගර සභාවේ ඕනෑම නිලධාරියකුට යුක්ති සහගත ඕනෑම වේලාවකදී ඕනෑම භෝජනාගාරයකට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට බලය තිබිය යුතුය.

(2) භෝජනාගාරයේ බලපත්‍රකාරයා විසින් හෝ එය භාරව සිටින තැනැත්තා විසින් සභාපතිහට හෝ ඔහුගෙන් ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියකුට ඒ ස්ථානයට ඇතුල්වී පරීක්ෂා කිරීමට ඉඩ දී ඒ සඳහා වුවමනා විය හැකි හැම උපකාරයක්ම කළ යුතුය.

21. භෝජනාගාරයන් පිළිබඳ මේ උපනීතිවලින් කවරක් වුවත් කඩ කරන හැම ප්‍රස්තාවයකදීම රුපියල් දෙසිය පනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩකිරීම ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීම ගැන සිහිපත් කරවා සභාපතිහු හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු දැන්වීම් පතක් භාරදුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහකට වැඩි නුවූ අමතර දඩයක් ගැසීමෙන්ද දඬුවම් දියහැකි විය යුතුය.

22. භෝජනාගාරයන් පිළිබඳ මේ උපනීතිවලින් කවරක් වුවත් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයා කඩකිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයා කරනු ලැබූ බලපත්‍රකාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමටද ඊට අතිරේක වශයෙන් ඔහුට වෙන යම්කිසි දඬුවමක් දීමටද (සෑහෙන අධිකරණ බලය ඇති) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකර ගැනීමට බලපත්‍රකාරයාට කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## VI වැනි කාණ්ඩය

### භෝජනශාලා පිළිබඳ උපනීති

1. (1) සභාපතිතුමාගෙන් භෝජනශාලාවක් දමා ගැනීමට ලබාගත් බලපත්‍රයක් පිට මිස කිසිවකු විසින් භෝජනශාලාවක් දමා නොගත යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දෙන හැම බලපත්‍රයක්ම 22 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එක්වැනිදට අහෝසි විය යුතුය.

2. බලපත්‍රය ලබාගැනීමට තිබෙන ස්ථානය පහත සඳහන් කොන්දේසි වලට ගැළපෙතොත් මිස නැත්නම් භෝජනශාලාවක් දැමීමට බලපත්‍රයක් ලබාගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය:—

(1) ගොඩනැගිල්ල ශක්තිමත් ලෙස සාදන ලදින් යහපත් තත්වයක තිබිය යුතුය. එහි හැම කාමරයක්ම හොඳින් වාතය හා ආලෝකය ලැබෙන ලෙස සාදා තිබිය යුතුය. හැම කාමරයකටම විවෘත කළ හැකි ජනෙල් සවිකොට තිබිය යුතුය. ඒ ජනෙල් විවෘත කළ විට ඒවායේ වර්ග ප්‍රමාණය බිමේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවිය යුතුය. හැම කාමරයකම බිමේ වර්ග ප්‍රමාණය අඩුම ගණනේ වර්ග අඩි එකසිය විස්සක්වත් විය යුතුය;

(2) හැම කාමරයකම කොයි බිත්තියක් වත් උසින් අඩි දහයකට අඩු නොවිය යුතුය. ඒවායේ සුදුහුණු ගා තිබිය යුතුය;

(3) වහල්පලය පොළෝ මට්ටමේ සිට අඩුම ගණනේ අඩි හයක් වත් උස්විය යුතුය;

(4) වහල කල් පවතින ද්‍රව්‍යයකින් සෙවිලි කොට තිබිය යුතුය.

(5) ලීදඬුවල තීන්ත හෝ සුදුහුණු ගා තිබිය යුතුය;

(6) බිම හැම තැනම සිමෙන්ති දමා තිබිය යුතුය;

(7) ස්ථානයෙහි සෑහෙන පමණ කානු දමා තිබිය යුතුය;

(8) ගෙය අතුගා දමන කුණුරොඩු දැමීමට සෑහෙන පමණ උස මහත ඇතිවූද සවස්ථානුකූලවූද කුණුබාල්දි සෑහෙන ගණනකුත් සියලු සෞඛ්‍ය අවශ්‍යතාවන් පිරිමසාලීමට ප්‍රමාණවත්වන පරිදි නාන තැන් හා වැසිකිළිත් ස්ථානයෙහි තිබිය යුතුය. මේ වැසිකිළි ගණන වූකලී බලපත්‍රය දීමට තිබෙන ගොඩනැගිල්ලේ නවතින දහදෙනකුට යටත්පිරිසෙයින් තනි එකකට අඩු නොවන සංඛ්‍යාවක් විය යුතුය;

(9) ගොඩනැගිල්ලේ සෑහෙන තරම් ජලය ලබාගැනීමේ පහසුකම් තිබිය යුතුය. බීමට වතුර ගන්නා තැනුත් නාන තැනුත් පිහිටුවාගත යුත්තේ බීමට ගන්නා වතුර මිනිසුන්ගේ නාම නිසා අපවිත්‍ර නොවන ලෙසටය;

(10) ගොඩනැගිල්ලේ මුළුතැන්ගෙය වශයෙන් වෙනම කාමරයක් තිබිය යුතුය. එහි දුම හොඳින් පිටවී යෑමට විවරයක් හෝ මාර්ගයක් තිබිය යුතුය.

3. (1) ඕනෑම භෝජනශාලාවකට බලපත්‍රයක් දී තිබෙන කාල පරිච්ඡේදය ඇතුළත ඒ භෝජනශාලාව සඳහා පාවිච්චි කරන ඕනෑම ගොඩනැගිල්ලක් 2 වැනි උපනීතියේ විධිවිධානයන්ට නොගැළපෙන තත්වයකට ඕනෑම විටෙකදී පත්වුව හොත් ඒ ගොඩනැගිල්ල ඒ විධිවිධානයන්ට අනුකූල කරවීමට කළයුතු හැම දෙයක්ම අසවල් දිනයට මත්තෙන් කළ යුතුයයි නියමකොට ඒ භෝජනශාලාවේ බලපත්‍රකාරයා වෙත දැන්වීමක් යැවීමට සලස්වන්ට සභාපතිහට බලය ඇත්තේය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබූ (භෝජන ශාලාවක) බලපත්‍රකාරයකු විසින් ඒ දැන්වීමේ නියමිත කාලපරිච්ඡේදය ඇතුළතදී එහි කියා ඇති කටයුතු නොකළ යුතු නොවේ.

(3) මේ උපනීතියේ 1 වැනි ඡේදය යටතේ ඕනෑම දැන්වීමක් භෝජනශාලාවේ කටයුතු කරගෙන යන ස්ථානයෙහි ගැසුව හොත් නැතහොත් බලපත්‍රකාරයා ඒ ස්ථානයෙහි රක්ෂාවෙහි යොදවා ගෙන සිටින යම් කිසිවකුට භාරදුන්නොත් ඒ දැන්වීම බලපත්‍රකාරයාටම භාර දුන් බව අදාළව සැලකිය යුතුය.

4. බලපත්‍රයක් ලත් හැම භෝජනශාලාවකම බලපත්‍රකාරයා විසින් භෝජනශාලා පිළිබඳ මේ උපනීති මාලාවේ ඉංග්‍රීසි පිටපතක් හා සිංහල පිටපතක් හා දෙමළ පිටපතක්ද බලපත්‍රයද රාමුවල දමා ඒ භෝජන ශාලාවේ ප්‍රකට ස්ථානයක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. තවද ඔහු විසින් වැඩට ගන්නා සියලු සේවකයන්ගේ නම් හා ලිපිනයන් සභාපතිහට හෝ ඔහුගෙන් බලය ලත් ඕනෑම කෙනෙකුට යුක්ති සහගත කොයි වේලාවකදී වුවත් පරීක්ෂාකර බැලීමට හැකිවන සේ ඒ භෝජනශාලාවේ තබා තිබීමට සැලැස්විය යුතුය.

5. සභාපතිතුමා විසින් හැම භෝජනශාලාවකම බලපත්‍රයට ඒ ස්ථානයේ සැලැස්මක් ඇමිණිමට සලස්වා එහි ඇති නිදන කාමර හා (බිමේ වර්ගප්‍රමාණයෙන් එක් එක් සතරැස් අඩි 400 එක් පුද්ගලයකුට, වඩා වැඩි නොවන ලෙසට). ඒ එක් එක් කාමරයේ නිදාගැනීමට අවසර දී ඇති අයගේ ගණන දක්විය යුතුය. මේ උපනීතිය සම්බන්ධයෙන් වයස අවුරුදු 10ට අඩු ළමයින් දෙදෙනකු එක් පුද්ගලයකු වශයෙන් ගණන් ගත යුතුය.

6. බලපත්‍රයට අමුණා ඇති සැලැස්මෙහි විශේෂ වශයෙන් නිදාගැනීම සඳහා වෙන්කර ඇති කාමරයක මිස භෝජනශාලාවේ වෙන කිසිම තැනක කිසිවකුට නිදාගැනීමට භෝජනශාලාවක බලපත්‍රකාරයා විසින් ඉඩ නොදිය යුතුය.

7. සැලැස්මෙහි දක්වා ඇති පුද්ගලයන් ගණනට වඩා වැඩි ගණනකට කිසිම කාමරයක නිදාගැනීමට භෝජනශාලාවක බලපත්‍රකාරයා විසින් ඉඩ නොදිය යුතුය.

8. බලපත්‍රයක් ලත් හැම භෝජනශාලාවකම බලපත්‍රකාරයා විසින් තම භෝජනශාලාවේ නැවතී සිටින එක් එක් අයගේ නමය, රක්ෂාවය, උපන් ගමය, ඔහු එහි නැවතීමට එන්ට මත්තෙන් තාවකාලික වශයෙන් හෝ ස්ථිර වශයෙන් නැවතී සිටි ස්ථානය යන මේවා ලකුණු කොට ලේඛන පොතක් තබාගත යුතුය.

9. බලපත්‍රයක් ලත් හැම භෝජනශාලාවකම බලපත්‍රකාරයා විසින් එහි එක් එක් නිදන කාමරයේ ජනෙල් දිනපතා යටත්පිරිසෙයින් පැ හතරක් වත් සම්පූර්ණ වශයෙන් ඇරලා තැබීමට සැලැස් විය යුතුය.

එහෙත් කාලගුණයේ හැටියට ජනෙල් වසා තැබීම ආවශ්‍යකව පවතී නම් එකල්හි බලපත්‍රකාරයා විසින් ජනෙල් ඇරවීම හෝ ඇරලා තැබ්බවීම අවශ්‍ය නොවේ.

10. බලපත්‍රයක් ලත් හැම භෝජනශාලාවකම බලපත්‍රකාරයා විසින් මාර්තු, ජූනි, සැප්තැම්බර්, දෙසැම්බර් යන මේ එක් එක් මාසයේදී වරක් බැගින් අවුරුද්දකට සතර වරක්ද සභාපතිතුමා ලියුම්කින් දැනුම් කරන සෙසු වකවානුවලදීද හැම කාමරයකම ඇතුල් බිත්තිවලට සිලිමේ සුදුහුණු ගෑවීමටත් ලීදඬුවල සුදුහුණු ගෑවීමට හෝ ඒවා තීන්ත ගා තිබේ නම් ඒවා උණුවතුරෙන් සේදවීමටත් සැලැස් යුතුය.

11. බලපත්‍රයක් ලත් හැම භෝජනශාලාවකම බලපත්‍රකාරයා විසින් භෝජනශාලාවේ හැම තැනමත් එහි අවටත් කානුත් ශුද්ධපවිත්‍ර කොට කැඩුම්බිඳුම් නැතිව මනා තත්වයක තිබීමටද ඒ ස්ථානයේ වූ යම් කානුවකින් හෝ වැසිකිළියකින් හෝ කසළවලකින් හෝ සෙසු අප්‍රිය දෙයකින් පැනනගින දුර්ගන්ධයෙන් තොරකොට තබාගැනීමටද සැලැස්විය යුතුය. ඔහු විසින් භෝජනශාලාවෙහි වූ සියලු ලී බඩු භාජන, උපකරණ යන මේවා ශුද්ධපවිත්‍ර ලෙස හා සවස්ථානුකූල ලෙස තබාගැනීමටද සැලැස්විය යුතුය.

12. බලපත්‍රයක් ලත් හැම භෝජනශාලාවකම බලපත්‍රකාරයා විසින් එහි සියලු කාමර, ඵගම ගිණ (සොල්දර පඩි පෙළ), ඉස්තෝප්පු, කානු යන මේවා හා ඒ ස්ථානයට අයිති ඉඩම අඩුම ගණනේ දවසකට එක් වරක් වත් මධ්‍යාහ්නයට කලින් අතුගා දැමීමට සැලැස්විය යුතුය.

13. බලපත්‍රයක් ලත් හැම භෝජනශාලාවකම බලපත්‍රකාරයා විසින් සියලු කැළිකසළ, ගේ අතුගා දමන කුණුරොඩු යන මේවාත් සෙසු අප්‍රිය දේවලුත් පියන සහිතවූද සිදුරු රහිතවූද තුත්තනාගම් භාජනයකට හෝ ගැල්වනයිස් භාජනයකට වහාම දමමවා දිනපතා ඒ භූමි භාගයෙන් ඉවත් කරවිය යුතුය. ඒ කැළිකසළ කුණුරොඩු ආදිය දමන වේලාවේදී හැර අනික් කොයි වේලාවේදීත් ඒ භාජනය වසා තැබිය යුතුය.

14. බලපත්‍රයක් ලත් හැම භෝජනශාලාවකම බලපත්‍රකාරයා පිසූ සියලු ආහාර වර්ග මැස්සන් හෝ සෙසු කෘමීන් නොවදිනා ලෙස තැබ්බවිය යුතුය.

15. භෝජනශාලාවක බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයට වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන කිසිවකු වැද්ද නොගත යුතුය.

16. භෝජනශාලාවක නැවතී සිටින කෙනෙකුට යම් වසංගත රෝගයක් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයක් වැළඳුණොත් ඒ භෝජනශාලාවේ බලපත්‍රකාරයා විසින් ඒ බව ඒ භෝජනශාලාව පිහිටි කොට්ඨාශයේ සෞඛ්‍ය පරීක්ෂකතැනට හෝ සභාපතිහට වහාම දැන්විය යුතුය. ඒ භෝජනශාලාවේ සිටින අය එයින් අස්කළ යුතුයයි සභාපතිතුමා නියම කළොත් බලපත්‍රකාරයා විසින් එසේ කොට, එකී රෝගියා පාවිච්චිකළ ඇඳඇතිරිලිවලත් රෙදිපිළිවලත් සෙසු ද්‍රව්‍යවලත් විෂබීජ විනාශ කරවීමට හෝ අවශ්‍ය නම් ඒ ඇඳඇතිරිලි ආදිය විනාශ කරදැමීමටද සභාපතිතුමා නියමකරන ආකාරයකට පොදු අරමුදලෙන් ඒ ගෙයි බෙහෙත් දුම් ගස්වා විෂබීජ විනාශකොට සුදුහුණු ගෑවීමටද ඉඩ දිය යුතුය.

17. වසංගත රෝගයක් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයක් පැවතුණ භෝජනශාලාවක බලපත්‍රකාරයා ඒ ස්ථානය සභාපතිතුමා පරීක්ෂාකර රෝගබීජවලින් තොරයයි සහතික කරන තුරු ඒ ස්ථානයට කිසිම අයකු භාර නොගත යුතුය.

18. භෝජනශාලාවක බලපත්‍රකාරයා විසින් ඒ භෝජනශාලාව ඇතුළේ ගවයන් හෝ එළුවන් හෝ කුකුළන් තබාගැනීමට ඉඩ නොදිය යුතුය.

19. බලපත්‍රයක් ලත් හැම භෝජනශාලාවකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානය මීයන්ගෙන් තොරව තබාගැනීමටත් මීගුල් දකින්ට ලැබුණ විගස ඒවා සියල්ල වීදුරු කැබලිවලින් පුරවා සිමෙන්තියෙන් පෑස්සීමටත් සැලැස්විය යුතුය.

20. (1) සභාපතිගට හෝ ඔහු විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරනලද (නගර සභාවේ) මනාම නිලධාරියකුට යුක්ති සහගත මනාම වේලාවකදී මනාම භෝජනශාලාවකට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට බලය තිබිය යුතුය.

(2) භෝජනශාලාවේ බලපත්‍රකාරයා විසින් හෝ එය භාරව සිටින තැනැත්තා විසින් සභාපතිගට හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද මනාම නිලධාරියකුට ඒ ස්ථානයට ඇතුල්වී පරීක්ෂා කිරීමට අව දී ඒ සඳහා ප්‍රස්තාවයේ හැටියට සභාපතිගට හෝ ඒ නිලධාරියාට වුවමනා විය හැකි හැම උපකාරයක්ම කළ යුතුය.

21. භෝජනශාලා පිළිබඳ මේ උපනීතිවලින් කවරක් වුවත් කඩ කරන හැම ප්‍රස්තාවයකදීම රුපියල් දෙසිය පනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩකිරීම ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීම ගැන සිහිපත් කරවා සභාපතිහු හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු දැන්වීම් පතක් භාරදුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහකට වැඩි නුවූ අමතර දඩයක් ගැසීමෙන්ද දඬුවම් දිය හැකිය.

22. භෝජනශාලා පිළිබඳ මේ උපනීතිවලින් කවරක් වුවත් කඩ කිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයකු කරනු ලැබූ බලපත්‍රකාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමද ඊට අතිරේක වශයෙන් වෙන යම්කිසි දඬුවමක් දීමටද (සැහෙන අධිකරණ බලය ලත්) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකර ගැනීමට බලපත්‍රකාරයාට කිසිම අයිති වාසිකමක් නොතිබිය යුතුය.

## VII. වැනි කාණ්ඩය

### ලැගුම්හල් පිළිබඳ උපනීති

1. (1) ලැගුම්හලක් දමා ගැනීමට සභාපතිහුගෙන් ලත් බලපත්‍රයක් ඇතිව මිස කිසිවකු විසින් නගර සභා ප්‍රදේශය ඇතුළත කිසිම ලැගුම්හලක් දමා නොගත යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දෙන හැම බලපත්‍රයක්ම 24 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එක්වැනිදාට අහෝසි විය යුතුය.

2. (1) සභාපතිහු දෙන බලපත්‍රයක බලය යටතේ මිස කිසිවකු විසින් නගර සභා ප්‍රදේශය ඇතුළත කිසිම ලැගුම්හලක් දමා නොගත යුතුය.

(2) පහත සඳහන් අයුරු වුවහොත් මිස නැත්නම් ලැගුම්හලක් දැමීමට බලපත්‍රයක් ලබාගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය:—

(අ) යහපත් චරිතයක් ඇත්තකු බවට මහේස්ත්‍රාත් කෙනෙකු විසින් හෝ සමාදාන විනිශ්චයකාරයකු විසින් අත්සන් කරන ලද චරිත සහතිකයක් සභාපතිහු වෙත තැත්පත් කිරීම හෝ තමා යහපත් චරිතයක් ඇත්තකු බැව් සභාපතිහට පිළිගත හැකි ලෙස වෙන අන් දමකින් ඔප්පුකිරීම;

(ආ) බලපත්‍රය දීමට තිබෙන ස්ථානය පහත පෙනෙන කොන්දේසිවලට ගැළපීම:—

(1) ගොඩනැගිල්ල ශක්තිමත් ලෙස සාදන ලදින් යහපත් තත්වයක තිබිය යුතුය. එහි හැම කාමරයක්ම හොඳින් වාතය හා ආලෝකය ලැබෙන ලෙස සාද තිබිය යුතුය. හැම කාමරයකටම විවෘත කළහැකි ජනෙල් සවිකොට තිබිය යුතුය. ඒ ජනෙල් විවෘත කළ විට ඒවායේ වර්ගප්‍රමාණය බිමේ වර්ගප්‍රමාණයෙන් පහලොවෙන් පංගුවකට අඩු නොවිය යුතුය. හැම කාමරයකම බිමේ වර්ගප්‍රමාණය අඩුම ගණනේ වර්ග අඩි එකසිය විස්සක් වත් විය යුතුය;

(2) හැම කාමරයකම කොයිම බිත්තියක් වත් උසින් අඩි දහයකට අඩු නොවිය යුතුය. ඒවායේ සුදුහුණු ගා තිබිය යුතුය;

(3) වහල්පලය පොළෝ මට්ටමේ සිට අඩුම ගණනේ අඩි නයක් වත් උස් විය යුතුය;

(4) වහල තල් පවතින ද්‍රව්‍යයකින් සෙවිලි කොට තිබිය යුතුය;

(5) ලීදඬුවල තීන්ත හෝ සුදුහුණු ගා තිබිය යුතුය;

(6) බිම හැම තැනම සිමෙන්ති දමා තිබිය යුතුය;

(7) ස්ථානයෙහි සැහෙන පමණ කානු දමා තිබිය යුතුය;



(8) ගෙය අතුගා දමන කුණුරොඩු දැමීමට ස්ථානයේ සැහෙන පමණ උස මනත ඇතිවූද ස්වස්ථානුකූල මූද තුණු බාල්දි සැහෙන ගණනකුත් තාත හැත් ගා වැසිකිළිත් තිබිය යුතුය. මේ වැසිකිළි ගණන මුකට බලපත්‍රය දීමට තිබෙන ගොඩනැගිල්ලේ නවතින දහදෙනෙකුට හනී එකකට අඩු නොවන සංඛ්‍යාවක් විය යුතුය;

(9) ගොඩනැගිල්ලට හොඳට ජලය ලබාගැනීමේ පහසුකම් තිබිය යුතුය. බීමට වතුර ගන්නා තැනුත් නාන තැනුත් පිහිටුවා ගත යුත්තේ බීමට ගන්නා වතුර මිනිසුන්ගේ නෑම නිසා අපවිත්‍ර නොවන ලෙසය;

(10) ගොඩනැගිල්ලේ මුළුතැන්ගෙය වශයෙන් වෙනම කාමරයක් තිබිය යුතුය. එහි දුම හොඳින් පිටවී යෑමට විවරයක් හෝ මාර්ගයක් තිබිය යුතුය.

3. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා විසින් තමාගේ නමත්, "බලපත්‍රයක් ලත් ලැගුම්හල" යන්නත් සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මේ භාෂාත්‍රයෙන් ලෑල්ලක පැහැදිලි ලෙස පින්තාරුකොට ඒ ස්ථානයේ පිට පැත්තේ ප්‍රකට ස්ථානයක එල්ලා තබාගත යුතුය.

4. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා විසින් ලැගුම්හල් පිළිබඳ මේ උපනීතිමාලාවේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මේ එක් එක් භාෂාවෙන් පිටපතක් බැගින්ද බලපත්‍රයද රාමුවල දමා ලැගුම්හලේ ප්‍රකට ස්ථානයක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. තවද ඔහු විසින් වැඩට ගන්නා සියලු සේවකයන්ගේ නම් හා ලිපිනයන් ලැයිස්තුවක් වශයෙන් ලියා සභාපතිගට හෝ ඔහුගෙන් බලය ලත් මනාම කෙනෙකුට යුක්ති සහගත කොයි වේලාවකදී වුවත් පරීක්ෂා කර බැලිය හැකිවන සේ ඒ ලැගුම්හලේ තබා තිබීමට සැලැස්විය යුතුය.

5. ලැගුම්හලේ සැලැස්මෙහි නිදන කාමර වශයෙන් විශේෂයෙන් වෙන්කර ඇති කාමරවල මිස වෙන කිසිම කාමරයක කිසිවකුට නිදාගන්ට ලැගුම්හලක බලපත්‍රකාරයා විසින් ඉඩ නොදිය යුතුය. ඒ සැලැස්ම බලපත්‍රයට ඇමිණිය යුතුවා පමණක් නොව සභාපතිහු විසින් අත්සන් කළ යුතුද වන්නේය.

6. යම් කාමරයක නිදාගැනීමට සභාපතිහු සැලැස්මේ නියමකර ඇති අයගේ ගණනට වඩා වැඩි දෙනෙකුට ඒ කාමරයෙහි නිදාගැනීමට ලැගුම්හලක බලපත්‍රකාරයා විසින් ඉඩ නොදිය යුතුය. කාමරයක නිදාගැනීමට අවසර දෙන අයගේ ගණන ඒ කාමරයේ බිමේ වර්ග ප්‍රමාණයෙන් එක් එක් හතරැස් අඩි 36කට එක් පුද්ගලයකුට වඩා වැඩි නොවිය යුතුය. මේ උපනීතිය සම්බන්ධයෙන් වයස අවුරුදු 10ට අඩු ළමෝ දෙදෙනෙක් එක් පුද්ගලයෙකු වශයෙන් ගණන් ගනු ලැබෙත්.

7. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා විසින් එක් එක් කාමරයෙහි දිග පළල හා එහි නිදාගැනීමට ඉඩ දෙන අයගේ වැඩිම ගණනද දක්වා දැන්වීම් ලෑල්ලක් ඒ එක් එක් කාමරයෙහි එල්ලා තැබිය යුතුය.

8. ලැගුම්හලක බලපත්‍රකාරයා විසින් ස්වාමිපුරුෂයන්ට හා භාර්යාවන්ටද දෙමව්පියන්ට හා දූදරුවන්ටද හැර වයස අවුරුදු 10ට වැඩි ගැණු පිරිමින්ට එකම නිදන කාමරයක නැවතී සිටින්ට ඉඩ නොදිය යුතුය.

9. ලැගුම්හලක බලපත්‍රකාරයා විසින් තම ස්ථානය අයිඝයිත ක්‍රියා සඳහා පාවිච්චි කිරීමට ඉඩ නොදිය යුතුය. ඔහු විසින් ඒ ලැගුම්හල ඇතුළේ සංවරය හා ශිෂ්ටත්වය ආරක්ෂා කටයුතුය.

10. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා විසින් තම ලැගුම්හලේ නැවතී සිටින එක් එක් අයගේ නාමය, රක්ෂාව, උපන් ගමය, ඔහු එහි නැවතීමට එන්ට මත්තෙන් තාවකාලික වශයෙන් හෝ ස්ථිර වශයෙන් නැවතී සිටි ස්ථානය යන් මේවා ලකුණු කොට ලබන පොතක් තබාගත යුතුය.

11. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා විසින් එහි එක් එක් නිදන කාමරයේ ජනේල දිනපතා යටත් පිරිසෙයින් පැය හතරක් වත් සම්පූර්ණ වශයෙන් ඇරලා තැබීමට සැලැස්විය යුතුය. එහෙත්, කාලගුණයේ හැටියට ජනෙල් වසා තැබීම ආවශ්‍යකව පවතී නම් එකල්හි බලපත්‍රකාරයා විසින් ජනෙල් ඇරවීම හෝ ඇරලා තැබ්බවීම අවශ්‍ය නොවේ.

12. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා විසින් මාර්තු, ජූනි, සැප්තැම්බර්, දෙසැම්බර් යන මේ එක් එක් මාසයේදී වරක් බැගින් අවුරුද්දකට හතරවරක්ද සභාපතිහු ලියුමකින් නියම කරන සෙසු වකවානුවලදීද හැම කාමරයකම ඇතුල් බිත්තිවල හා සිලිමේ සුදු හුණු ගෑවීමටත් ලී දඬු සුදුහුණු ගෑවීමටත හෝ ඒවායේ තීන්ත ගා තිබේ නම් ඒවා සබන් හා උණු වතුරෙන් සේදවීමටත් සැලැස්විය යුතුය.

13. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා විසින් ලැගුම්හලේ හැම තැනමත් එහි අවටත් කානුත් ශුද්ධපවිත්‍ර කොට කැඩුම් බිඳුම් නැතිව මනා තත්වයක තිබීමටද ස්ථානයෙහිවූ යම් සනුවකින් හෝ වැසිකිළියකින් හෝ කසළවලකින් හෝ සෙසු අප්‍රිය දෙයකින් පැන නගින දුර්ගන්ධයෙන් තොර කොට තබා ගැනීමටද සැලැස්විය යුතුය. ඔහු විසින් සියලු ලිබවු, භාජන, උපකරණ යන මේවා ශුද්ධ පවිත්‍ර ලෙස හා ස්වස්ථානුකූල ලෙස තබාගැනීමටද සැලැස්විය යුතුය.

14. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා විසින් එහි සියලු කාමර, ගෙමං හිණ (සොල්දර පඩිපෙළ) ඉස්තෝප්පු, කානු යනා මේවා හා ඒ ස්ථානයට අයිති ඉඩම අවුම ගණනේ දවසකට එක් වරක් වත් මධ්‍යාහ්නයට කලින් අතුගාදැමීමට සැලැස්විය යුතුය.

15. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා විසින්, ළිසු ආහාර වගී මැස්සන් හෝ සෙසු සතුන් නොවදිනා ලෙස තැබිබ විය යුතුය.

16. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා, සියලු කැලි කසළ හෝ අතුගා දමන කුණුරොඩු හෝ සෙසු අප්‍රිය දේවල් පියන සහිතාවූද තුත්තනාගමෙන් හෝ ගැල්වනයිස් යකඩෙන් සාදන ලද්ද වූද භාජනයකට වහාම දම්මවා දින පතා ඒ භූමිභාගයෙන් ඉවත් කරවිය යුතුය. ඒ කැළිකසළ කුණුරොඩු ආදිය දමන වේලාවේදී හැර අනික් කොයි වේලාවේදීත් ඒ භාජනය වසා තැබිය යුතුය.

17. ලැගුම්හලක බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයට වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන කිසිවකු වැද්ද නොගත යුතුය.

18. (1) ලැගුම්හලක නැවතී සිටින කෙනෙකුට යම් වසංගත රෝගයක් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයක් හෝ චර්ම රෝගයක් වැළඳුණොත් ඒ ලැගුම්හලේ බලපත්‍රකාරයා විසින් ඒ බව ඒ ලැගුම්හල පිහිටි කොට්ඨාශයේ සෞඛ්‍ය පරීක්ෂකතැනට හෝ සභාපතිහට වහාම දන්විය යුතුය. ඒ ලැගුම්හලේ බලපත්‍රකාරයා විසින් සභාපතිහු කියන විදියකට පොදු අරමුදලෙන් ඒ ගෙයි බෙහෙත් දුම් ගස්වා විෂබීජ විනාශ කොට සුද්ධපවිත්‍ර ගැවීමටද සැලැස්විය යුතුය.

(2) (1) වැනි ඡේදයේ කී ලැගුම්හලක බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානය සභාපතිහු පරීක්ෂාකර බලා රෝග බීජවලින් තොරව තිබේයයි සහතික කරන තුරු ඒ ස්ථානයට කිසිවකු වැද්ද නොගත යුතුය.

19. ලැගුම්හලක බලපත්‍රකාරයා විසින් ඒ ගොඩනැගිල්ල ඇතුළත ගවයන් හෝ එළුවන් හෝ කුකුළන් තබා ගැනීමට ඉඩ නොදිය යුතුය.

20. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා විසින් ඒ ඉගට අයිති හැම දිය වැසිකිළියක හා පස්වැසිකිළියක වාඩිවෙන තට්ටුවය, බිමය, බිත්තිය යන මේවා පිරිසිදුව සෞඛ්‍යානුකූල ලෙස තබාගැනීමට අවශ්‍ය වන වාර ගණනක් ඒ ඒ වේලාවලදී ශුද්ධ කරවිය යුතුය.

21. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා විසින් ඒ ලැගුම්හලේ පාවිච්චි කරන සියලු පැදුරු, ඇඳඇතිරිලි, කොට්ට මෙට්ට ඇඳන් යන මේවා පිරිසිදුව සෞඛ්‍යානුකූල ලෙස තබාගැනීමට අවශ්‍ය වන වාර ගණනක් කලින් කල ශුද්ධපවිත්‍ර කරවිය යුතුය.

22. (1) සභාපතිහට හෝ ඔහු විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරනලද (නගර සභාවේ) ඕනෑම නිලධාරියකුට යුක්තිසහගත ඕනෑම වේලාවකදී ඕනෑම ලැගුම් හලකට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට බලය තිබිය යුතුය.

(2) ලැගුම්හලේ බලපත්‍රකාරයා හෝ එය භාරව සිටින තැනැත්තා සභාපතිහට හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරනලද ඕනෑම නිලධාරියකුට ලැගුම්හලට ඇතුල්වී පරීක්ෂා කිරීමට ඉඩ දී ඒ සඳහා ප්‍රස්තාවයේ හැටියට සභාපතිහට හෝ ඒ නිලධාරියාට වුවමනා විය හැකි හැම උපකාරයක්ම කළ යුතුය.

23. ලැගුම්හල් පිළිබඳ මේ උපනීතිමාලාවෙන් කවරක් වුවත් කඩ කරන හැම ප්‍රස්තාවයකදීම රුපියල් දෙසිය පණහකට වැඩිනුවූ දඩයක් ගැසීමෙන්ද, ඒ කඩකිරීම ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීම ගැන සිහිපත්කරවා සභාපතිහු හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු දන්වීම් පතක් භාරකර දුන් පසු ඒ කඩකිරීම කර ගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහකට වැඩි නුවූ අමතර දඩයක් ගැසීමෙන්ද දඬුවම් දිය හැකිවිය යුතුය.

24. ලැගුම්හල් පිළිබඳ මේ උපනීතිවලින් කවරක් වුවත් කඩකිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයාවූ බලපත්‍ර කාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමටද ඊට අතිරේක වශයෙන් ඔහුට වෙන දඬුවමක් දීමටද (සෑහෙන අධිකරණ බලය ලත්) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකර ගැනීමට බලපත්‍රකාරයාට කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## VIII වැනි කාණ්ඩය

### අප්‍රියවූද අන්තරායදායකවූද කර්මාන්ත පිළිබඳ උපනීති

1. මේ උපනීතිවල "අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක්" යන්නෙන් අදහස් කරන්නේ නගර සභාව විසින් අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක්ය යි ප්‍රකාශ කරන ලද ඕනෑම කර්මාන්තයකි.

2. (1) අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමකට සභාපතිහුගෙන් ලත් බලපත්‍රයක් පිට මිස කිසිවකු විසින් නගර සභා ප්‍රදේශය ඇතුළත අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කිසිම කර්මාන්තයක් නොකළ යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දෙන හැම බලපත්‍ර යක්ම 16 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එක්වෙනිදාට අහෝසිවිය යුතුය.

3. පහත පෙනෙන අයුරු වුවහොත් මිස නැත්නම් අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමට බලපත්‍රයක් ලබාගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය:—

(1) අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තය කරගෙන යාම බලාපොරොත්තුවන ස්ථානය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැන විසින් හෝ ඔහුගෙන් බලය ලත් යම් කිසිවකු විසින් අනුමත කරන ලද්දක් විය යුතුය; එසේම

(2) ඒ කර්මාන්තය කරගෙන යෑමට බලාපොරොත්තුවන ස්ථානය හා ගොඩනැගිල්ල පහත පෙනෙන කොන්දේසිවලට ගැළපෙන සේ තිබිය යුතුය:—

(අ) ගොඩනැගිල්ල කැඩුම් බිඳුම් කිසිවක් නැතිව යහපත් තත්වයක තිබිය යුතුය. ඊට හොඳින් වාතය හා ආලෝකය ලැබිය යුතුය. එහි හැම කාමරයකම විවෘත කළ විට ඒ කාමරයේ බිමේ වගී ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවන වගී ප්‍රමාණයක් ඇත්තාවූද විවෘත කළ හැකිවූද ජනෙල් තිබිය යුතුය;

(ආ) හැම කාමරයකම කොයිම බිත්තියක් වත් උසින් අඩි හතකට අඩු නොවිය යුතුය. ඒ බිත්ති ගඩොලෙන් හෝ ගලෙන් හෝ කබුක් ගලෙන් බැඳ තිබිය යුතුය. ඒ එක් එක් බිත්තියේ ඇතුල් පැත්ත පොළවේ සිට අඩි හතරක් උසට සිමෙන්තියෙන් කපලාරු කොට තිබිය යුතුය. එහි ඉතිරි හරිය හුණු බදාමෙන් කපලාරු කොට සුදුහුණු ගා තිබිය යුතුය;

(ඇ) වහලේ හැම පලයක්ම පොළවේ සිට අඩුම ගණනේ අඩි 6ක් වත් උස්විය යුතුය;

(ඈ) වහල කල් පවතින ද්‍රව්‍යයකින් සෙවෙලි කොට තිබිය යුතුය;

(ඉ) ලීදඬුවල තීන්ත හෝ සුදු හුණු ගා තිබිය යුතුය;

(ඊ) බිම හැම තැනම සිමෙන්ති දමා තිබිය යුතුය;

(උ) ස්ථානයෙහි සෑහෙන පමණ කානු දමා තිබිය යුතුය;

(ඌ) ස්ථානයෙහි සෞඛ්‍යානුකූල කුණු බාල්දියක්ද, සෑහෙන තරම් වැසිකිළිද තිබිය යුතුය.

4. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමට බලපත්‍රයක් ලත් කාවිසිනුත් ඒ කර්මාන්තය කරගෙන යෑමට වුවමනා වන සියලු ද්‍රව්‍ය දුර්ගන්ධයක් හෝ වෙන ගැහැටක් ඇති නොවන අන්දමකට නැත්පත් කර තබාගත යුතුය.

5. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමට බලපත්‍රයක් ලත් කාවිසිනුත් අප්‍රිය විය හැකිවූ හෝ දුර්ගන්ධයක් ඇතිවිය හැකිවූ යම් ද්‍රව්‍යයක්, යම් පොදු ස්ථානයක් හෝ මහ පාරක් දිගේ ගෙනයන විට දියසිරාව ඇද නොගන්නාවූද කිසිම ගැහැටක් ඇති නොවන්නාවූද භාජනවල දමා පියන්වලින් වසාගෙන ගෙනයා යුතුය.

6. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමට බලපත්‍රයක් ලත් කාවිසිනුත් ඒ කර්මාන්තයේ කොයිම අවස්ථාවකදී වුවත් නිකුත් වන අප්‍රිය වාෂ්ප හෝ වායු (ගෑස්) උපද්‍රවදායකවූ හෝ අප්‍රියවූ විපාක යක් ඇති නොකොට ඉහළ ගොස් බාහිර වාතය හා සම්මිශ්‍රවීමට හෝ කෙළින්ම ගින්නක් මැදින් යෑමට හෝ ඝනීකරණ උපකරණයක් ඇතුළට යැවීමට සැලැස්විය යුතුය.

7. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමට බලපත්‍රයක් දරණ කාවිසිනුත් ඒ කර්මාන්තය කරන ස්ථානයෙහි වතුර බැස යෑමට සෑහෙන පමණ කානු දම්මවාගෙන ඒ කානු මනා තත්වයක තබා ගැනීමටත් දිනපතා සේදීමටත් සැලැස්විය යුතුය.

8. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමට බලපත්‍රයක් ලත් කා විසිනුත් ඒ කර්මාන්තය කරන ගොඩනැගිල්ලේ බිම වතුර නාල්ලන ද්‍රව්‍යයකින් සාදවා නිසි පරිදි අලුත්වැඩියා කොට හොඳ හැටි තබා ගැනීමටත් දිනපතා ශුද්ධපවිත්‍ර කිරීමටත් සැලැස්විය යුතුය.

9. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමට බලපත්‍රයක් ලත් කාවිසිනුත් ඒ කර්මාන්තය කරන ගොඩනැගිල්ලේ බිත්ති කුණු නොබැඳෙන සේ මනා තත්වයක තබාගෙන ඒවායේ අවුරුදු පතා සුදුහුණු ගෑවිය යුතුය.

10. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමට බලපත්‍රයක් ලත් කාවිසිනුත් ඒ කර්මාන්තය සඳහා පාවිච්චි කරන මෙවලම් හා භාජන ඇතුළු සියලු උපකරණ ශුද්ධපවිත්‍රව තැබීමට සලස්වා හැකි නම් දිනපතා පිරිසිදු කරවිය යුතුය.

11. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමට බලපත්‍රයක් ලත් කාවිසිනුත් ඒ කර්මාන්තයෙන් අපතේ යන්නාවූද ඒ කර්මාන්තයේ වෙන අවස්ථාවක් සම්බන්ධයෙන් ඒ ස්ථානයේදී එකෙණෙහිම වැඩට නොගන්නාවූද ද්‍රව්‍ය හා උපද්‍රව්‍ය සමග සියලු කුණු රොඩු කැලිකසළ ආදිය [illegible] භාජනවල දමා ඒ කර්මාන්තය කරන ස්ථානයෙන් දිනපතා ඉවත් කරවිය යුතුය.

12. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමට බලපත්‍රයක් ලත් කා විසිනුත් හම් හෝ වෙන යම්කිසි ද්‍රව්‍යයක් පොගවන හෝ පෝදන වැත්කිවලින් දුර්ගන්ධයක් හට නොගන්නා පරිද්දෙන් ඒ වැත්කි නිතර නිතර හිස්කොට ශුද්ධපවිත්‍ර කළ යුතුය.

13. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමට බලපත්‍රයක් ලත් කා විසිනුත් කිසිම ගංගාවකට හෝ ඇළකට හෝ දෙළකට හෝ දියපාරකට හෝ ළිඳකට හෝ වැවකට හෝ වෙන අනාවරණ ජලාශයකට අපිරිසිදු හෝ දුර්ගන්ධය හමන්නාවූ හෝ අප්‍රිය ස්වභාවයෙන් යුක්ත වූ වතුර හෝ වෙන ද්‍රව්‍යයක් බැස්සවීමෙන් හෝ අප්‍රිය ඊට හැරීමෙන් හෝ යම් අප්‍රිය ද්‍රව්‍යයක් එහි විසිකිරීමෙන් හෝ හේදෙන්ට දැමීමෙන් හෝ වෙන යම්කිසි විදියකින් ඒ ගංගාව හෝ ඇළ හෝ දෙළ හෝ දියපාර හෝ ළිඳ හෝ වැව හෝ ජලාශය අපිරිසිදු නොකළ යුතුය.

14. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ ඕනෑම කර්මාන්තයක් කරන ඕනෑම ස්ථානයකට යුක්තිසහගත ඕනෑම වේලාවකදී ඇතුල්වී එය පරීක්ෂා කිරීමට සභාපතිහට හෝ ඔහු විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරන ලද නගර සභාවේ ඕනෑම නිලධාරියකුට බලය තිබිය යුතුය. ඒ පරීක්ෂාව කිරීමට බලපත්‍රකාරයා විසින් හෝ ඒ ස්ථානය බාරව සිටින තැනැත්තා විසින් අවසර දිය යුතුය.

15. අප්‍රියවූ හා අන්තරායදායකවූ කර්මාන්ත පිළිබඳ මේ උපනීතිවලින් කවරක් වුවත් කඩකරන හැම ප්‍රස්ථාවයකදීම රුපියල් පනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩකිරීම ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීම ගැන සිහිපත් කරවා සභාපතිහු හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු දැන්වීම් පතක් බාරදුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහකට වැඩි නුවූ අමතර දඩයක් ගැසීමෙන්ද දඬුවම් දිය හැකි විය යුතුය.

16. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්ත පිළිබඳ මේ උපනීති වලින් කවරක් වුවත් කඩකිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයා කරනු ලැබූ බලපත්‍රකාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමටද ඊට අතිරේක වශයෙන් ඔහුට වෙන දඬුවමක් දීමටද (නඩු අසන අධිකරණ බලය ලත්) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකර ගැනීමට බලපත්‍රකාරයාට කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## IX වන කාණ්ඩය

### (සෝඩා ලෙමනේඩ් ආදී) සිසිල් බීම කර්මාන්තශාලා පිළිබඳ උපනීති

1. (1) සභාපතිහුගෙන් (සෝඩා ලෙමනේඩ් ආදී) සිසිල් බීම කර්මාන්තශාලාවක් දමාගැනීමට ලබාගත් බලපත්‍රයක් පිට මිස කිසිවකු විසින් සිසිල් බීම කර්මාන්තශාලාවක් දමාගැනීම හෝ පවත්වාගෙන යෑම නොකළ යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දෙන හැම බලපත්‍රයක්ම 22 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එක්වැනිදාට අහෝසි විය යුතුය.

2. බලපත්‍රයක් දෙන්ට තිබෙන ස්ථානය පහත පෙනෙන කොන්දේසිවලට ගැළපෙනොත් මිස නැත්නම් (සෝඩා ලෙමනේඩ් ආදී) සිසිල් බීම කර්මාන්තශාලාවක් දමා ගැනීම සඳහා බලපත්‍රයක් ලබාගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය:—

(1) (අ) ගොඩනැගිල්ල කැඩුම් බිඳුම් කිසිවක් නැතිව යහපත් තත්වයක තිබිය යුතුය. ඊට හොඳින් වාතය හා ආලෝකය ලැබිය යුතුය. එහි හැම කාමරයකම ඇරිය හැකි ජනෙල් සවිකොට තිබිය යුතුය. ඒ ජනෙල් ඇරිය විට කාමරයේ බිමේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවිය යුතුය;

(ආ) හැම කාමරයකම කොයිම බිත්තියක් වත් උසින් අඩි හතකට අඩු නොවිය යුතුය. ඒ බිත්ති ගඩොළෙන් හෝ ගලෙන් හෝ කබුක් ගලෙන් බැඳ තිබිය යුතුය. එක් එක් බිත්තියේ ඇතුල් පැත්ත හුණු බදාමෙන් කපලාරු කොට තිබිය යුතුය. එහි සුදුහුණුද ගා තිබිය යුතුය;

(ඇ) වහල් පලය බිම සිට අවම ගණනේ අඩි හයක් වත් උස්විය යුතුය;

(ඈ) වහල කල් පවතින ද්‍රව්‍යයකින් සෙවිලිකොට තිබිය යුතුය;

(ඉ) ලිඳවුවල තීන්ත හෝ සුදුහුණු ගා තිබිය යුතුය;

(ඊ) බිම හැම තැනම සිමෙන්ති දමා තිබිය යුතුය;

(උ) ස්ථානයෙහි පැතෙන තරම් කානු දමා තිබිය යුතුය.

(2) සිසිල් බීම සෑදීම පිණිස අවම ගණනේ එක් කාමරයක් වත් වෙන්කොට තිබිය යුතුය.

(3) සිසිල් බීම සෑදීමට ගන්නා පැණි වැනි සුවඳ වැනි රසායන ද්‍රව්‍ය ආදී මේවා සකස්කර තැබීම සඳහා (මැස්සන්ට ඇතුල් විය නොහැකි ලෙස සාදනලද) වෙනම කාමරයක් තිබිය යුතුය.



(4) බෝතල් සේදීමට වෙනම ස්ථානයක් තිබිය යුතුය.

(5) කර්මාන්තශාලාවේ පාවිච්චියට ගන්නා ජලය අපිරිසිදු නොවන ලෙස සැහෙන පරිදි ආරක්ෂාකොට ඇති ස්ථානයකින් ලබාගත යුතුය. ඒ ජලය කර්මාන්තශාලාවට ගෙනා යුත්තේත් ඒ ගෙනීමේදී අපවිත්‍ර නොවන අන්දමකටය. එසේම ඒ ජලය කර්මාන්තශාලාවෙහි නිසි ලෙස බඳින ලද වැත්කිවල හෝ ජලාශයවල රැස්කර හඬාගත යුතුය.

(6) සිසිල්බීම සෑදීමට ගන්නාවූද (ඒ කටයුත්තේ කොයි අංශයකදී වුවත් පාවිච්චියට ගන්නාවූද) බෝතල් භාජන උපකරණ යනාදිය මේවා සේදීමට ගන්නාවූද ජලය වූකලී සභාපතිහු විසින් අනුමත කරන ලද්දාවූද යන්ත්‍රෝපකරණයට සම්බන්ධ කරන ලද්දාවූද සුදුසු පෙරන උපකරණයකින් පෙරීගෙන යා යුතුය. ඒ ජලය රාසායනික පරීක්ෂණයකින් හා ක්ෂුද්‍රජීව පරීක්ෂණයකින් පවිත්‍ර හා පථ්‍ය ජලය බව පෙනීගොස් තිබිය යුතුය. එසේ ගත් අනුමත කරනලද පොදු ජලාශයකින් ලබාගන්නා ජලය මේ උපනීතිගත කටයුතුවලින් නිදහස් කිරීමට සභාපතිහට බලය තිබිය යුතුය.

(7) (අ) සිසිල් බීම කර්මාන්තශාලාවෙහි සවස්ථානුකූල කුණු බාල්දියක්ද, අවම ගණනේ පඩික්කම් දෙකක්ද එහි රක්ෂාවෙහි යෙදී සිටින සේවකයන් දසදෙනෙකුට එකකට අඩු නොවන ගණනක් වැසිකිළිද තිබිය යුතුය.

(ආ) සිසිල් බීම කර්මාන්තශාලාව ඕනෑම වැසිකිළියක හෝ කසළ වළක හෝ ගවමඩුවක හෝ පෝර ගොඩක හෝ නොවසන ලද මල මූත්‍ර නාලිකාවක සිට අවම ගණනේ අඩි පනහක් වත් ඈතින් පිහිටා තිබිය යුතුය;

(ඇ) සිසිල් බීම කර්මාන්තශාලාව ඇතුළත හෝ ඊට කෙළින්ම සම්බන්ධවන පරිද්දෙන් කිසිම කසළ වළක් හෝ වැසිකිළියක් හෝ ගවමඩුවක් හෝ අපු වළක් නොතිබිය යුතුය.

3. (1) සිසිල් බීම කර්මාන්තශාලාවක් සම්බන්ධයෙන් බලපත්‍රයක් දී ඇති කාලපරිච්ඡේදය ඇතුළත ඕනෑම වේලාවකදී ඒ සිසිල් බීම කර්මාන්තශාලාව වෙනුවෙන් පාවිච්චි කරන කිසියම් ගොඩනැගිල්ලක් 2 වැනි උපනීතියේ විධිවිධානවලට නොගැළපෙන තත්වයකට පත්වුවහොත් බලපත්‍රකාරයා වෙත දැන්වීමක් යවා ඒ දැන්වීමේ නියම කරන දවසට කලින් ඒ ගොඩනැගිල්ල එකී විධිවිධානවලට ගැළපෙන අයුරු වීමට අවශ්‍යවන හැම දෙයක්ම කරවන මෙන් ඒ බලපත්‍රකාරයාට නිවේදනය කිරීමට සභාපතිහට බලය තිබිය යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දැන්වීම් පතක් භාර දෙනු ලැබූ (සිසිල් බීම කර්මාන්තශාලාවක) බලපත්‍රකාරයා විසින් ඒ දැන්වීමේ කියා ඇති දේ එහි සඳහන් කාලය ඇතුළතදී කිරීම පැහැර නොහැරිය යුතුය.

(3) (1) ඡේදය යටතේ ඕනෑම දැන්වීමක් සිසිල් බීම කර්මාන්තශාලාවේ කටයුතු කරන ස්ථානයේ ගැසුවහොත් නැතහොත් බලපත්‍රකාරයා ඒ ස්ථානයේ රක්ෂාවෙහි යොදවාගෙන සිටින යම් කිසිවකුට භාරදුන්නොත් ඒ දැන්වීම බලපත්‍රකාරයාටම භාරදුන්නා කොට සැලකිය යුතුය.

4. බලපත්‍රයක් ලත් හැම සිසිල් බීම කර්මාන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් තම නමත් "බලපත්‍රයක් ලත් සිසිල් බීම කර්මාන්තශාලාව" යන මේ වචනත් ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන මේ භාෂාවලින් පැහැදිලි ලෙස පින්තාරු කරනලද ලෑල්ලක් කර්මාන්තශාලාවේ පිට පැත්තේ ප්‍රකටව පෙනෙන තැනක එල්ලා තැබිය යුතුය.

5. බලපත්‍රයක් ලත් හැම සිසිල් බීම කර්මාන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් සිසිල් බීම කර්මාන්තශාලා පිළිබඳ මේ උපනීති මාලාවේ ඉංග්‍රීසි පිටපතක් හා සිංහල පිටපතක් හා දෙමළ පිටපතක් බලපත්‍රයද රාමුවල දමා කර්මාන්තශාලාවෙහි ප්‍රකට ස්ථානයක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. ඔහු විසින් (සිසිල් බීම විකුණන්නන් ඇතුළුව) එහි වැඩට ගන්නා සියලු සේවකයන්ගේ නම් හා ලිපිනයන් ලයිස්තුවක් වශයෙන් ලියා සභාපතිහට හෝ ඔහු විසින් බලය පවරන ලද ඕනෑම කෙනෙකුට යුක්තිසහගත කොයි වේලාවකදී වුවත් පරීක්ෂාකර බැලීමට පුළුවන්වන සේ ඒ කර්මාන්තශාලාවෙහි තබා තිබීමට සැලැස්විය යුතුය.

6. බලපත්‍රයක් ලත් හැම සිසිල් බීම කර්මාන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් සිසිල් බීම කර්මාන්තශාලාවට ඇතුළත් හැම කාමරයකම බිත්තිවල ජූනි මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් අවුරුද්දකට දෙවතාවක් සුදුහුණු ගෑවිය යුතුය. ලිඳවුවල තීන්ත ගා නැත්නම් එහි සුදුහුණු ගෑවීමද තීන්ත ගා තිබේ නම් ඒ ලිඳවු සබන් හා උණුවතුරෙන් සේදීමද ජූනි මාසයේදී වරක් හා දෙසැම්බර් මාසයේදී වරක් බැගින් අවම ගණනේ අවුරුද්දකට දෙවරකුත් සභාපතිහු ලියවිල්ලකින් නියමකරන වෙන වකවානුවලදීත් කරවිය යුතුය.

7. බලපත්‍රයක් ලත් හැම සිසිල් බීම කර්මාන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් ඒ කර්මාන්තශාලාවේ බිම අවම ගණනේ දවසකට වරක් බැගින්වත් සේදවිය යුතුය.

8. බලපත්‍රයක් ලත් හැම සිසිල් බීම කර්මාන්තශාලාවකම බලපත්‍ර කාරයා විසින් ඒ කර්මාන්තශාලාවේ පාවිච්චි කරන සියලු බෝතල් පහත සඳහන් අන්දමට සේදීමට සැලැස්විය යුතුය:—

බෝතල් සේදීමට වෙන වෙනම ටැන්කි දෙකක් තිබිය යුතුය. ඉන් එකක් ලේබල් ගලවා පළමු වරට බෝතල් සේදීමට පාවිච්චි කළ යුතුය. අනික බෝතල් ශුද්ධකොට අවසාන වරට සේදීමට පාවිච්චි කළ යුතුය. වතුර ලබාගන්නේ පයිප්ප මගින් නම් අවසාන වරට කරන සේදීම කළ යුත්තේ බෝතල් පයිප්පයට ඇල්ලීමෙනි.

9. බලපත්‍රයක් ලත් හැම සිසිල් බීම කර්මාන්තශාලාවකම බලපත්‍ර කාරයා විසින් කර්මාන්තශාලාවේ හැම තැනමත් අවටත් කානුත් ඒ බඳුත් භාජනත් සිසිල් බීම සෑදීමට පාවිච්චි කරන උපකරණත් ශුධ පවිත්‍රව හා යහපත් තත්වයක තබාගැනීමට සැලැස්විය යුතුය.

10. සිසිල් බීම කර්මාන්තශාලාවක බලපත්‍රකාරයා විසින් සිසිල් බීම සෑදීමට ගන්නා ද්‍රව්‍ය හා බඩු හැර අන් කිසි ද්‍රව්‍යයක් හෝ බඩුවක් ඒ කර්මාන්තශාලාව ඇතුළට ගෙනෙන්ට ඉඩ නොදිය යුතුය.

11. සිසිල් බීම කර්මාන්තශාලාවක බලපත්‍රකාරයා අපවිත්‍රවූ හෝ අපථ්‍යවූ හෝ අයහපත්වූ කිසිම ද්‍රව්‍යයක් කර්මාන්තශාලාවේ පාවිච්චියට නොගත යුතුය.

12. බලපයත්‍රක් ලත් හැම සිසිල් බීම කර්මාන්තශාලාවකම බලපත්‍ර කාරයා විසින් කර්මාන්තශාලාවේ පාවිච්චි කරන ද්‍රව්‍ය මී, කුරුමිණි, පණු ආදී සතුන්ට ඇතුල්විය නොහැකි පෙට්ටිවල හෝ රාක්කවල දමා තබාගත යුතුය.

13. බලපත්‍රයක් ලත් හැම සිසිල් බීම කර්මාන්තශාලාවකම බලපත්‍ර කාරයා විසින් සිසිල් බීම අඩංගු හැම බෝතලයකම පිටපැත්තේ ඒ බෝතලය ඇතුලේ තිබෙන සිසිල් බීම වර්ගයේ නමත් එය සාදන ලද ස්ථානයත් කර්මාන්තශාලාව අයිති පුද්ගලයාගේ හෝ සමාගමේ නමත් සභාපතිතුමා විසින් කර්මාන්තශාලාවට නියමකර තිබෙන අංකයත් සඳහන් ලේබලයක් අලවා තිබීමට සැලැස්විය යුතුය.

14. සිසිල් බීම කර්මාන්තශාලාවක බලපත්‍රකාරයා විසින් වයස අවුරුදු දහහතරෙන් පහළ කිසිවකු ඒ කර්මාන්තශාලාවේ වැඩට නොගත යුතුය.

15. වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙලෙන්නාවූ හෝ ලඟදී පෙළුණාවූ හෝ ඒ රෝගයකින් පෙළෙන කෙනෙකුට ලඟදී සාත්තු කිරීමෙහි යෙදී සිටියාවූ කිසිවකු, ඒ රෝගය බෝවීමට හා රෝග බීජ මේරීමට ගතවන කාල පරිච්ඡේදය පසුවන තෙක් සිසිල් බීම කර්මාන්තශාලාවට ඇතුල් වීම හෝ සිසිල් බීම සෑදීමේ හෝ වෙළඳාමේ හෝ ගෙනයෑමේ වැඩට සම්බන්ධවීම නොකළ යුතුය.

16. බලපත්‍රයක් ලත් හැම සිසිල් බීම කර්මාන්තශාලාවකම බලපත්‍ර කාරයා, සිසිල් බීම බෝතල්වල වත්කරන කාවත් එසේ වත්කරන වේලාවේදී මුහුණේ යකඩ දැල් වෙස් මුහුණක් හා අත්වල නම් මේස් දමාගැනීමට සැලැස්විය යුතුය.

17. බලපත්‍රයක් ලත් හැම සිසිල් බීම කර්මාන්තශාලාවකම බලපත්‍ර කාරයා පැණි හෝ සුවඳ ද්‍රව්‍ය හෝ රසායන ද්‍රව්‍ය හෝ සෙසු ද්‍රව්‍ය දැමීම පිණිස වීදුරුවලින් හෝ පිඟන් මැටියෙන් හෝ ඔප දමාපු මැටියෙන් සහ් ඉනැමල් ගාන ලද යකඩෙන් හෝ තුත්තනාගම් ගාන ලද යකඩෙන් හෝ බෙලෙක්වලින් සාදන ලද භාජන පාවිච්චිකළ යුතුය. ඔහු විසින් ඒ භාජන වෙන කටයුත්තකට පාවිච්චි නොකළ යුතුය. එසේම වෙනම තැනක තැබිවිය යුතුය.

18. බලපත්‍රයක් ලත් හැම සිසිල් බීම කර්මාන්තශාලාවකම බලපත්‍ර කාරයා විසින් ගොම, කුණුකසළ, මුත්‍ර, කුණුවතුර යන මේවා අඩුම ගණනේ දවසකට වරක් වත් ගව මඩුවෙන් හෝ වැසිකිළියෙන් හෝ කර්මාන්තශාලාවේ ඒ ඒ කොටස්වලින් ඉවත් කරවා ඒවායින් හැනැවිත් නොවන අයුරක් කරවිය යුතුය.

19. සිසිල් බීම කර්මාන්තශාලාවක බලපත්‍රකාරයා විසින් මොනම කාරණයක් සඳහාවත් ඒ ස්ථානයෙහි කිසිම සතකු හෝ කුරුල්ලකු තබා නොගත යුතුය.

20. සභාපතිට හෝ ඕනෑම සෞඛ්‍ය පරීක්ෂකයකුට හෝ සභාපතිතුමා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද ඕනෑම කෙනෙකුට සිසිල් බීම සෑදීම සඳහා විකිණීම සඳහා පාවිච්චි කරන ඕනෑම ස්ථානයක් ඇරලා තිබෙන ඕනෑම වේලාවක ඒ ස්ථානයට ඇතුල්වී එහි සාදන හෝ විකිණීමට තබා තිබෙන ඕනෑම වර්ගයක සිසිල් බීම බෝතලයක් එහි වටිනාකම ගෙවා සැම්පලයක් වශයෙන් ගැනීමට බලය තිබිය යුතුය. තවද බලපත්‍රකාරයා විසින් හෝ ස්ථානය භාරව සිටින කිසිම කෙනෙකු විසින් ඒ සැම්පලය ගෙනයෑමට ඉඩ දීමට බැරිය නොකිය යුතුය.

21. සිසිල් බීම කර්මාන්තශාලා පිළිබඳ මේ උප නීතිවලින් කවරක් වුවත් කඩකරන හැම ප්‍රස්තාවයකදීම රුපියල් දෙසිය පනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩකිරීම ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීම ගැන ලිඛිතව කරවා සභාපතිතුමා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු දන්වීම් පතක් භාරදුන් පසු ඒ කඩ කිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් පනහකට වැඩි නුවූ අමතර දඩයක් ගැසීමෙන්ද දඬුවම් දිය හැකිවිය යුතුයි.

22. සිසිල් බීම කර්මාන්තශාලා පිළිබඳ මේ උප නීතිවලින් කවරක් වුවත් කඩකිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරද කාරයා කරනු ලැබූ බලපත්‍රකාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමටද ඊට අතිරේක වශයෙන් ඔහුට වෙන දඬුවමක් දීමටද (නගර සභාවට අධිකරණ බලය ලත්) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකර ගැනීමට බලපත්‍රකාරයාට කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## X වැනි කාණ්ඩය

### අයිස් කර්මාන්තශාලා පිළිබඳ උපනීති

1. (1) සභාපතිතුමාගෙන් අයිස් කර්මාන්තශාලාවක් දමාගැනීමට ලබාගත් බලපත්‍රයක් පිට මිස කිසිවකු විසින් නගර සභා සීමාව ඇතුළත අයිස් කර්මාන්තශාලාවක් දමා නොගත යුතුය.

(2) මේ උපනීතියේ 1 වැනි ඡේදය යටතේ දෙන හැම බලපත්‍රයක්ම 17 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස් එක්වැනිදාට අහෝසිවිය යුතුය.

2. බලපත්‍රයක් දෙන්ට තිබෙන ස්ථානය පහත පෙනෙන කොන්දේසි වලට ගැළපෙනොත් මිස නැත්නම් කිසිවකුට අයිස් කර්මාන්තශාලාවක් දමා ගැනීම සඳහා බලපත්‍රයක් ලබාගැනීමට අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

(1) ගොඩනැගිල්ල—

(අ) කැඩුම් බිඳුම් නැතිව යහපත් තත්වයක තිබිය යුතුය. ඊට හොඳින් වාතය හා ආලෝකය ලැබිය යුතුය. එහි හැම කාමරයකටම ඇරිය හැකි ජනෙල් සවිකොට තිබිය යුතුය. ඒ ජනෙල් ඇරිය විට කාමරයේ බිමේ වර්ගප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවිය යුතුය;

(ආ) හැම කාමරයකම කොයි බිත්තියක්වත් උසින් අඩි හතකට අඩු නොවිය යුතුය. ඒ බිත්ති ගඩොලෙන් හෝ ගලෙන් හෝ කවුක් ගලෙන් බැඳ තිබිය යුතුය. එක් එක් බිත්තියේ ඇතුල් පැත්ත හුණු බදාමෙන් කපලාරු කොට තිබිය යුතුය. එහි සුදු හුණුද ගා තිබිය යුතුය;

(ඇ) වහල්පළිය බිම සිට අඩුම ගණනේ අඩි නයක් වත් උස්විය යුතුය;

(ඈ) වහල කල් පවතින ද්‍රව්‍යයකින් සෙවෙලිකොට තිබිය යුතුය;

(ඉ) ලීදඬුවල තීන්ත හෝ සුදුහුණු ගා තිබිය යුතුය;

(ඊ) බිම හැම තැනම සිමෙන්ති දමා තිබිය යුතුය;

(උ) ස්ථානයෙහි සෑහෙන තරම් කානු දමා තිබිය යුතුය;

(ඌ) ඒ කර්මාන්තශාලාවේ එක් කාමරයක් අයිස් සෑදීම සඳහාම වෙන්කර තිබිය යුතුය;

(එ) අපිරිසිදු නොවන ලෙස ආරක්ෂාකොට ඇති ස්ථානය කින් ලබාගන්නාවූද ගෙනීමේදී අපවිත්‍රවීමක් හෝ දූෂ්‍යවීමක් කිසි ලෙසකට ලක් නොවන ක්‍රමයකට ගෙනාහැකිවූද ජලය සෑහෙන හරමට ඒ ස්ථානයට ලැබිය යුතුය. ඒ වතුර රැස්කර තැබීම සඳහා නිසි පරිදි සාදන ලද ටැන්කි හෝ ජලාශ තිබිය යුතුය;

(ඒ) කර්මාන්තශාලාවේ සෞඛ්‍යානුකූලව කුණු බාල්දියක්ද අඩුම ගණනේ පඩික්කම් දෙකක්ද සෑහෙන තරමක් වැසිකිළිද තිබිය යුතුය;

(ඔ) කර්මාන්තශාලාව ඕනෑම වැසිකිළියක හෝ කසළ වළක හෝ ගවමඩුවක හෝ පෝරගොඩක හෝ නොවසන ලද මලමුත්‍ර නාලිකාවක සිට අඩුම ගණනේ අඩි පනහක් වත් ඈතින් පිහිටා තිබිය යුතුය;

(ඕ) කර්මාන්තශාලාව ඇතුළත හෝ ඊට කෙළින්ම සම් බන්ධවන පරිද්දෙන් කිසිම කසළවළක් හෝ වැසිකිළියක් හෝ ගවමඩුවක් හෝ අටුවලක් නොතිබිය යුතුය;

(2) අයිස් සාදන්නාවූ හෝ රැස්කර තබන්නාවූ හෝ ගෙනයෑමට තබා ඇත්තාවූ මොනම කාමරයක් වත් මැදින් නොගොස් දර ආදී ඉන්ධන ද්‍රව්‍ය උදුනට ගෙන යෑමට හෝ උදුනෙන් පිටතට ගෙනයෑමට පුළුවන්වන පරිදි ඒ ඉන්ධන ද්‍රව්‍ය රැස් කර තැබීම පිණිස විශේෂ කාමරයක් හෝ තැනක් තිබිය යුතුය;

(3) අයිස් සෑදීමට ගන්නා ජලය සභාපතිතුමා විසින් අනුමත කරන ලද්දාවූද යන්ත්‍රෝපකරණයට සම්බන්ධකරන ලද්දාවූද සුදුසු පෙරන උපකරණයකින් පෙරීගනයෑමට සැලැස්විය යුතුය. එසේත් අනුමත කරනලද පොදු ජලාශයකින් ලබාගන්නා ජලය මේ උපනීතිගත කටයුතුවලින් නිදහස් කිරීමට සභාපතිතුමාට බලය තිබිය යුතුය.

3. බලපත්‍රයක් ලත් හැම අයිස් කම්හල්තශාලාවකම බලපත්‍රකාරයා විසින් නම නමත් "බලපත්‍රයක් ලත් අයිස් කම්හන්තශාලාව" යන මේ නමත් ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන මේ භාෂාවලින් පැහැදිලි ලෙස ලියන්නාරු සරහලද ලැල්ලක් කම්හන්තශාලාවේ පිට පැත්තේ ප්‍රකටව පෙනෙන තැනක එල්ලා තැබිය යුතුය.

4. බලපත්‍රයක් ලත් හැම අයිස් කම්හන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් අයිස් කම්හන්තශාලා පිළිබඳ මේ උපනීති මාලාවේ ඉංග්‍රීසි පිටපතක් හා සිංහල පිටපතක් හා දෙමළ පිටපතක්ද බලපත්‍රයද රාමු වල දමා කම්හන්තශාලාවේ ප්‍රකට ස්ථානයක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. ඔහු වැඩට ගන්නා සියලු සේවකයන්ගේ නම හා ලිපිනයන් ලැයිස්තුවක් වශයෙන් ලියා සභාපතිගට හෝ ඔහු විසින් බලය පවරන ලද ඕනෑම කෙනෙකුට යුක්ති සහගත කොයි වේලාවකදී වුවත් පරීක්ෂාකර බැලීමට පුළුවන්වන සේ ඒ කම්හන්තශාලාවෙහි තබා තිබීමට සැලැස්විය යුතුය.

5. බලපත්‍රයක් ලත් හැම අයිස් කම්හන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් අයිස් කම්හන්තශාලාවට ඇතුලත් හැම කාමරයකම බිත්තිවල ජුනි මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් අවුරුද්දකට දෙවරක් සුදුහුණු ගෑවිය යුතුය. ලීදඬුවල තීන්ත ගා නැත් නම් එයි සුදුහුණු ගෑමද තීන්ත ගා තිබේ නම් ඒ ලීදඬු සබන් හා උණුවතුරෙන් සේදීමද ජුනි මාසයේදී වරක් හා දෙසැම්බර් මාසයේදී වරක් බැගින් අවුරුද්දට දෙවරකුත් සභාපතිහු ලියවිල්ලකින් නියම කරනු වෙන වකවානුවලදීත් කරවිය යුතුය.

6. බලපත්‍රයක් ලත් හැම අයිස් කම්හන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් කම්හන්තශාලාවේ බිම අඩු ගණනේ දවසකට එක වරක් වත් සේදවිය යුතුය

7. බලපත්‍රයක් ලත් හැම අයිස් කම්හන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් කම්හන්තශාලාවේ හැම තැනමත් අවටත් කැනුත් ලීබඩුත් භාජනත් අයිස් සෑදීමට පාවිච්චි කරන උපකරණත් ශුඩපවිත්‍රව කැඩුම බිඳුම් නැතිව යහපත් තත්ත්වයක තබාගැනීමට සැලැස්විය යුතුය.

8. අයිස් කම්හන්තශාලාවක බලපත්‍රකාරයා විසින්, අයිස් සෑදීමට පාවිච්චි කරන ද්‍රව්‍ය හා බඩු හැර අන් කිසි ද්‍රව්‍යයක් හෝ බඩුවක් ඒ කම්හන්තශාලාව ඇතුලට ගෙනෙන්ට ඉඩ නොදිය යුතුය.

9. අයිස් කම්හන්තශාලාවක බලපත්‍රකාරයා විසින් වයස අවුරුදු දහතරෙන් පහළ කිසිවකු ඒ කම්හන්තශාලාවේ වැඩට නොගත යුතුය.

10. වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන්නාවූ හෝ ඒ රෝගයකින් ළඟදී පෙළුණාවූ හෝ ඒ රෝගයකින් පෙළෙන ලෙඩෙකුට ළඟදී සාත්තු කිරීමෙහි යෙදී සිටියාවූ කිසිවකු ඒ රෝගය බෝවීමට හා රෝග බීජ මේරීමට ගතවන කාල පරිච්ඡේදය පසුවන තෙක් අයිස් කම්හන්ත ශාලාවට ඇතුල්වීම හෝ අයිස් සෑදීමේ හෝ අසුරනගෑමේ හෝ විකිණීමේ හෝ ගෙනයෑමේ වැඩකට සම්බන්ධවීම නොකළ යුතුය.

11. බලපත්‍රයක් ලත් හැම අයිස් කම්හන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් ගොම, කුණුකසළ, මුත්‍රා, කුණුවතුර යන මේවා අඩුම ගණනේ දවසකට වරක් වත් ගවමඩුවෙන් හෝ වැසිකිළියෙන් හෝ කම්හන්ත ශාලාවේ ඒ ඒ කොටස්වලින් ඉවත් කරවා එයින් ගැහැටක් නොවන අයුරක් කරවීමට සැලැස්විය යුතුය.

12. අයිස් කම්හන්තශාලාවක බලපත්‍රකාරයා විසින් මොනම කාරණයක් සඳහාවත් ඒ ස්ථානයෙහි කිසිම සතකු හෝ කුරුල්ලකු තබා නොගත යුතුය.

13. සභාපතිගට හෝ සෞඛ්‍ය පරීක්ෂකතැනට හෝ සභාපතිහු විසින් ලියවිල්ලකින් බලය පවරනලද ඕනෑම කෙනෙකුට ඕනෑම අයිස් කම්හන්තශාලාවක ඇරලා තිබෙන ඕනෑම විටක ඒ කම්හන්ත ශාලාවට ඇතුල්වී අයිස් සෑදීමට ගන්නා වතුර සැම්පලයක් හෝ එයි සාදන අයිස්වලින් උපදින වතුර සැම්පලයක් ගැනීමට බලය තිබිය යුතුය. තවද බලපත්‍රකාරයා විසින් හෝ ඒ කම්හන්තශාලාව භාරව සිටින කිසිම කෙනෙකු විසින් ඒ සැම්පලය ගෙනයාමට ඉඩ දීමට බැරිය නොකිය යුතුය.

14. කිසිම බලපත්‍රකාරයකු අපවිත්‍රවූ හෝ පරිභෝගයට නුසුදුසුවූ වතුර අයිස් සෑදීමට නොගත යුතුය.

15. (1) සභාපතිගට හෝ ඔහු විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරන ලද නගර සභාවේ ඕනෑම නිලධාරියකුට යුක්ති සහගත ඕනෑම වේලාවකදී ඕනෑම අයිස් කම්හන්ත ශාලාවකට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට බලය තිබිය යුතුය.

(2) අයිස් කම්හන්තශාලාවේ බලපත්‍රකාරයා විසින් හෝ එය භාරව සිටින අය විසින් සභාපතිගට හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද ඕනෑම නිලධාරියකුට අයිස් කම්හන්තශාලාවට ඇතුල්වී පරීක්ෂා කිරීමට ඉඩදී ඒ සඳහා ඔහුට වුවමනා හැම උදව්වක්ම කළ යුතුය.

16. අයිස් කම්හන්තශාලා පිළිබඳ මෙ උපනීතිවලින් කවරක් වුවත් කඩකරන හැම ප්‍රස්තාවයකදීම රුපියල් දෙසිය පනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩකිරීම ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීම ගැන සියිපත් කරවා සභාපතිහු හෝ ඔහු විසින් බලය පවරන ලද යම නිලධාරියකු දන්වීම පතක් භාර දුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහකට වැඩි නුවූ අමතර දඩයක් ගැසීමෙන්ද දඬුවම් දිය හැකි විය යුතුය.

17. අයිස් කම්හන්තශාලා පිළිබඳ මෙ උපනීතිවලින් කවරක් වුවත් කඩකිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයා කරනු ලැබූ බලපත්‍රකාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමටද ඊට අතිරේක වශයෙන් ඔහුට වෙන දඬුවමක් දීමටද (සෑහෙන අධිකරණ බලය ලත්) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකරගැනීමට බලපත්‍රකාරයාට කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## XI වැනි කාණ්ඩය

### කිරිපට්ටි හා කිරි විකිණීම පිළිබඳ උපනීති

1. (1) කිරිපට්ටියක් තබා ගැනීම සඳහා සභාපතිහුගෙන් ලබාගත් බලපත්‍රයක් පිට මිස කිසිවකු විසින් කිරිපට්ටියක් තබා නොගත යුතුය.

(2) මෙ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දෙන හැම බලපත්‍රයක්ම 34 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස් එක්වැනිදට අහෝසිවිය යුතුය.

2. (1) බලපත්‍රය දෙන්ට තිබෙන ස්ථානය පහත පෙනෙන කොන්දේසිවලට ගැළපෙනොත් මිස නැත්නම් කිසිවකුට කිරිපට්ටියක් තබා ගැනීම සඳහා බලපත්‍රයක් ලබාගැනීමට අයිතිවාසිකමක් නොතිබිය යුතුය:—

(අ) ගොඩනැගිලි කැඩුම්බිඳුම් කිසිවක් නැතිව යහපත් තත්ත්වයක තිබිය යුතුය. ඊට හොඳින් වාතය හා ආලෝකය ලැබිය යුතුය;

(ආ) ගොඩනැගිලිවල බිත්ති හා වහල කල් පවතින ද්‍රව්‍යයකින් සාද තිබිය යුතුය;

(ඇ) ලීදඬුවල තීන්ත හෝ සුදුහුණු ගා තිබිය යුතුය.

(ඈ) බිම හැම තැනම සිමෙන්ති දමා තිබිය යුතුය; නැතහොත් දඩිවූද දියසිරාව බී නොගන්නාවූද යම්කිසි ද්‍රව්‍යයක් අල්ලා තිබිය යුතුය.

(ඉ) භූමිභාගයෙහි වතුර බැසයෑම සඳහා සෑහෙන තරම කානු දමා තිබිය යුතුය.

(ඊ) කිරිපට්ටියේ පාවිච්චිය සඳහා (අපිරිසිදුවිය නොදී ආරක්ෂා කරනලද) පිරිසිදු වතුර සෑහෙන තරමට ඒ අසල තිබිය යුතුය;

(උ) ගවයන් බැඳ තැබීමට ඇති හැම ගොඩනැගිල්ලක්ම හෝ මඩුවක්ම ගඩොළෙන් හෝ ගලෙන් හෝ කබුක් ගලෙන් සාද තිබිය යුතුය. එයි බිත්ති හා කුළුණු සුදුහුණු ගාලා බිම සිට අඩි හතරක් උසට සිමෙන්තියෙන් කපලාරු කොට තිබිය යුතුය. වහල කල් පවතින ද්‍රව්‍යයකින් සෙවෙලිකර තිබිය යුතුය. බිම, සිමෙන්ති හෝ සිමෙන්ති කොන්ක්‍රීට් හෝ ගල්භාර දමා ගඩොළු හෝ ගල් අල්ලා තිබිය යුතුය. එයි මුත්‍රා හා සෝදන වතුර හා වැහි වතුර (පියන සහිත භාජනයකට හෝ ඊට වැඩි ගණනකට) ගලා යෑමට ඒ ද්‍රව්‍ය වලින් කානු දමා තිබිය යුතුය;

(ඌ) ගරක් මඩුවේ සිටත් වෙන ගොඩනැගිල්ලක සිටත් අඩි විසි පහකට නො අඩු දුරක් ඇත්තාවූද පුදුසුවූද තැනක කිරි කාමරය තිබිය යුතුය;

(එ) කිරිකාමරයේ බිම සිමෙන්ති දමා තිබිය යුතුය. එයි බිත්ති හා බිම සන්ධිවන තැන වටකුරු කොට තිබිය යුතුය. බිත්ති අඩි හතකට නොඅඩු උසට ගඩොළෙන් හෝ ගලෙන් හෝ කබුක් ගලෙන් බැඳ ඇතුල් පැති හුණු බදාමෙන් කපලාරු කොට සුදුහුණු ගා තිබිය යුතුය. අඩුම ගණනේ එයි දෙපැත්තේ බිත්ති දෙකක් වත් එළිමහන දෙසට තිබිය යුතුය. ඇතුළට දූලි වැටීම වළකෙන සේ දුම්ගු වද්ද ලැලි ගැසූ සිලිමක් වහලේ තිබිය යුතුය. ඒ සිලිමෙ තීන්ත ගා තිබිය යුතුය. වහල්පලය පොළෝ මට්ටමේ සිට අඩුම ගණනේ අඩි හයක් වත් උස්විය යුතුය. එයි අඩුම ගණනේ ජනේලයක් හා දොරක්ද තිබිය යුතුය. ජනේලයේ වර්ග ප්‍රමාණය බිමේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවිය යුතුය. මැස්සන් ඇතුල් නොවන්ට ජනේලයට දැල් ගසා තිබිය යුතුය. දොර තැබිය යුත්තේ ජනේලයට ප්‍රතිවිරුද්ධ පැත්තෙනි. ඒ දොර හොඳට හේත්තුවෙන්ට වැසිය [illegible]ක් විය යුතුය. මැස්සන්ට ඇතුල්විය නොහැකි ලෙස ඊටද දැල් ගසා තිබිය යුතුය;

(ඞ) කිරිගරුඬ හෝ ගල්ලැලි හෝ තුත්තනාගම් තහඩු හෝ අනුමත කරන ලද්දවූද දියකිරාව ඇද නොගන්නාවූද වෙන ද්‍රව්‍යක් හෝ උඩට ඇල්ලූ මේසයක් කිරිකාමරයෙහි තිබිය යුතුය;

(ඤ) කිරිකාමරයේ සවිස්තානුකූල කුණු බාල්දියක් තබා තිබිය යුතුය;

(ට) කිරිකාමරය ඕනෑම වැසිකිළියක හෝ කසලවලක හෝ පෝර ගොඩක හෝ නොවැසූ මලමූත්‍ර නාලිකාවක සිට අඩුම ගණනේ අඩි සියයක් වත් දුරින් විය යුතුය;

(ද) කිරිකාමරය තුළ හෝ ඊට කෙලින්ම සම්බන්ධවන පරිද්දෙන් කසලවලක් හෝ වැසිකිළියක් හෝ අඟුවලක් නොතිබිය යුතුය.

(2) බලපත්‍රයක් දෙන්ට තිබෙන එක් එක් කිරිපට්ටියේ සිටින දෙනුන් ගණන ඒ කිරිපට්ටිය වෙනුවෙන් බලපත්‍රය ඉල්ලන අයදුම් පතේ සඳහන් කළ යුතුය. එක් දෙනකට දිගින් අඩි අටක හා පලලින් අඩි පහක බිමද අඩුම ගණනේ ඝන අඩි 400ක වාතයද තිබෙන පරිදි ඒ දෙනුන් ගණන ගව මඩුවේ මහතාදෙහෙතාට ප්‍රමාණික විය යුතුය.

3. (1) යම් කිරිපට්ටියක් වෙනුවෙන් බලපත්‍රයක් දෙන ලද කාල සීමාවක් ඇතුලත ඒ කිරිපට්ටිය සඳහා පාවිච්චි කරන යම් ගොඩනැගිල්ලක් 2 වැනි උපනීතියේ විධිවිධානවලට නොගැළපෙන තත්ත්වයට යම් විටෙකදී පත්වුව හොත් ඒ ගොඩනැගිල්ල ඒ විධිවිධානවලට ගැලපෙන අයුරු තිබීමට අවශ්‍ය හැම දෙයක්ම අසවල් දිනයට මත්තෙන් කළ යුතුයයි නියම කොට ඒ කිරිපට්ටියේ බලපත්‍රකාරයා වෙත දැන්වීමක් යවන්ට සැලැස්වීමට සභාපතිහට බලය තිබේ.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ කිරිපට්ටි බලපත්‍රකාරයකු ඒ දැන්වීමේ දක්වා ඇති දේ එහි සඳහන් කාලය ඇතුලතදී කිරීම පැහැර හැරිය යුතු නොවේ.

(3) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ වූ ඕනෑම දැන්වීමක්, බලපත්‍රකාරයා කිරිපට්ටිය පිළිබඳ කටයුතු කරගෙන යන ස්ථානයෙහි ගැසුවහොත් නැතහොත් බලපත්‍රකාරයා ඒ ස්ථානයෙහි රැකාවේ යොදවාගෙන සිටින යම් කිසිවකුට භාර දුන්නොත් ඒ දැන්වීම බලපත්‍රකාරයාට භාරදුන්නා කොට සැලකිය යුතුය.

4. බලපත්‍රයක් ලත් හැම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් ඒ කිරිපට්ටියේ පිටපැත්තේ කාටත් පෙනෙන තැනක ඔහුගේ නම හා "බලපත්‍රයක් ලත් කිරිපට්ටිය" යන්න සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මේ භාෂාවලින් පැහැදිලි ලෙස පින්තාරු කරවා ලැල්ලක් ගසා තැබීමට සැලැස්විය යුතුය.

5. බලපත්‍රයක් ලත් හැම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් කිරිපට්ටි පිළිබඳ මේ උපනීතිමාලාවේ සිංහල පිටපතක් හා දෙමළ පිටපතක් හා ඉංග්‍රීසි පිටපතක්ද බලපත්‍රයද රාමුවල දමා ඒ කිරිපට්ටිය තුළ කාටත් පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. තවද ඔහු විසින් කිරිපට්ටියේ වැඩට ගන්නා සියලු සේවකයන්ගේ (කිරි විකුණන්නන්ද ඇතුළුවයි.) නම් හා ලිපිනයන් ලැයිස්තුවක් වශයෙන් ලියවා සභාපතිහට හෝ ඔහුගෙන් බලය ලත් ඕනෑම කෙනෙකුට යුක්සහගත කොයි වේලාවකදී වුවත් පරීක්‍ෂාකර බැලීමට හැකිවන සේ කිරිපට්ටියේ තැබ්බවිය යුතුය.

6. බලපත්‍රයක් ලත් හැම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් ජුනි මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් අවුරුද්දකට දෙවරක් කිරිපට්ටියේ හැම කාමරයකම බිත්තිවල සුදුහුණු ගෑවිය යුතුය. ඔහු විසින් එසේ ලිදවූ ජුනි මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් අඩුම ගණනේ අවුරුද්දකට දෙවරකුත් සභාපතිහු නියම කරන වෙන වකවානුවලදීත් සබන් හා උණුවතුරෙන් සේදවිය යුතුය.

7. බලපත්‍රයේ ලත් හැම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් බිම හා කිරිකාමරයේ ඇති මේසයේ උඩුතට්ටුව දවසකට වරක් බැගින් වත් සේදවිය යුතුය.

8. බලපත්‍රයක් ලත් හැම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් කිරිපට්ටියේ පාවිච්චි කරන හෝ කිරිපට්ටියට අයිති සියලු භාජන, ලීබඩු, පෙසු උපකරණ යන මේවා පිරිසිදුව තබාගැනීමට සැලැස්විය යුතුය.

9. බලපත්‍රයක් ලත් හැම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් කිරිපට්ටියේ හැම තැනමත් එහි අවටත් කානුත් ශුඩපවිත්‍රකොට කැඩුම් බිඳුම් නැතිව තිබීමට සැලැස්විය යුතුය.

10. බලපත්‍රයක් ලත් හැම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් කිරි වක්කර පිටත යවන හැම භාජනයක්ම පිරිසිදු කරවා පිරිසිදු වැස්මකින් සුදුසු පරිදි වස්සවා කිරි එහා මෙහා ගෙනයෑමේදී අපිරිසිදුවීම වළක්වාලීමට අවශ්‍ය සියලු විධිවිධාන යෙදවිය යුතුය.

11. බලපත්‍රයක් ලත් හැම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් කිරි වක්කර තැබීම සඳහා විදුරු භාජන හෝ පිඟන් මැටි භාජන හෝ ඔප දැමූ මැටි භාජන හෝ ඇනමල් ගා යකඩ භාජන හෝ තුත්තනාගම් ගා යකඩ භාජන හෝ බෙලෙක් භාජන පාවිච්චි කළ යුතුය. ඔහු ඒ භාජන ගවමඩුවේ තැන්පත් කර තැබීමට ඉඩ නොදිය යුතුය.

12. බලපත්‍රයක් ලත් හැම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් සියලු ගොම්, කුණුකසළ, මූත්‍ර, කුණුවතුර යන මේවා කිරිපට්ටියෙන් අඩුම ගණනේ දවසකට වරක් වත් ඉවත් කොට ඒවායින් කැතවක් නොවන අයුරක් කරවිය යුතුය.

13. කිරිපට්ටියක බලපත්‍රකාරයා විසින් මොනම කරුණක් නිසාවත් කිසිම සතකු හෝ කුරුල්ලකු කිරි කාමරයේ තබා නොගත යුතුය.

14. කිරිපට්ටියක බලපත්‍රකාරයා විසින් කිරිපට්ටියේ ඇති කිරි වත් කරන භාජන හෝ වෙඩරු දමන භාජන හෝ වෙඩරු සාදන භාජන (යන්ත්‍ර) හෝ යොදය වෙන් කරන යන්ත්‍ර හෝ පෙසු බඩු නියමිත කටයුතුවලට හැර වෙන කටයුත්තකට ගැනීමට ඉඩ නොදිය යුතුය. ඔහු විසින් ඒවා අඩුම ගණනේ දවසකට වරක් වත් උණුවතුරෙන් සේදවිය යුතුය.

15. වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චම් රෝගයකින් පෙලෙන්නාවූ හෝ ළඟදී පෙළුණාවූ හෝ ඒ රෝගයකින් පෙලෙන කෙනෙකුට ළඟදී සාත්තු කිරීමෙහි යෙදී සිටියාවූ කිසිවකු ඒ රෝගය බෝවීමට හා රෝග බීජ මෙරීමට ගතවන කාලපරිච්ඡේදය පසුවන තෙක් කිරිපට්ටියකට ඇතුල්වීම වත් එහි කිරි පිළියෙල කිරීමේ හෝ විකිණීමේ හෝ ගෙනයෑමේ කටයුත්තකට සම්බන්ධවීම වත් නොකළ යුතුය.

16. බලපත්‍රයක් ලත් හැම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් හෝ එය භාරව සිටින්නාවූ හෝ පාලනය කරන්නාවූ තැනැත්තා විසින් යම් වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චම් රෝගයකින් පෙලෙන්නාවූ හෝ ළඟදී පෙළුණාවූ හෝ ඒ රෝගයකින් පෙලෙන කෙනෙකුට ළඟදී සාත්තු කිරීමෙහි යෙදී සිටියාවූ කිසිවකු ඒ රෝගය බෝවීමට හා එහි රෝග බීජ මෙරීමට ගතවන කාලපරිච්ඡේදය පසුවන තෙක් දන දනම කිරිපට්ටියේ වැඩට ගැනීම හෝ එය ඇතුලට වැද්ද ගැනීම නොකළ යුතුය.

17. බලපත්‍රයක් ලත් හැම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් ඒ කිරිපට්ටියේ ප්‍රයෝජනය සඳහා ජලය ලබාගත යුත්තේ—

(අ) පොදු ජලසම්පාදන ක්‍රමයක් පිහිටුවා තිබේ නම් එයිනි. එසේ වූවිට ළඟින්ම පිහිටි ප්‍රධාන ජල මාර්ගයට දියනල සම්බන්ධ කරවා වතුර පයිප්ප ගොඩනැගිල්ල ඇතුලේ සවිකරවාගෙන ඒ මගිනි,

(ආ) පොදු ජලසම්පාදන ක්‍රමයක් නැත්තේ වී නම් පිරිසිදු වතුර සෑහෙන ප්‍රමාණයක් ලබාගත හැකි සුදුසු ස්ථානයකිනි.

18. බලපත්‍රයක් ලද්දවූද පොදු ජලසම්පාදනයක් නොවන ජලසම්පාදනයකින් වතුර ලබාගන්නාවූද හැම කිරිපට්ටියකම බලපත්‍රකාරයා පොදු ජලසම්පාදනයක් ඇතිවූ වහාම අනික් ජලසම්පාදනයෙන් වතුර ගැනීම නවත්වා ඒ පොදු ජලසම්පාදනයෙන් වතුර ගත යුතුය.

19. කිරි දෝනා වේලාවේදී දෙනගේ බුරුල්ල හා තනපුඩු ශුඩපවිත්‍ර වද කිරි දෝනා තැනැත්තාගේ අත් පිරිසිදුව සියලු රෝග බීජයන්ගෙන් තොරවද තිබෙනොත් මිස නැත්නම් කිසිම දෙනකුගෙන් විකිණීම සඳහා කිරි දෙවීමට කිරිපට්ටියක බලපත්‍රකාරයාට ඉඩ නොදිය යුතුය.

20. බලපත්‍රයක් ලත් හැම කිරිපට්ටියකම බලපත්‍රකාරයා කිරිපට්ටියේ වැඩට යොදවාගෙන සිටින මිනිසුන්ගෙන් කවරෙකුට වුවත් යම් වසංගත රෝගයක් හෝ චම් රෝගයක් වැළඳුණේ නැතහොත් වැළඳුනේ ඒ රෝගයකැයි සැකයක් ඇතිවුව හොත් ඒ බව වහාම සභාපතිහට දැන්විය යුතුය.

21. (1) බලපත්‍රයක් ලත් හැම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් කිරිපට්ටියේ සිටින කොයි ගවයකුට වුවත් ස්පර්ශයෙන් බෝවෙන රෝගයක් හෝ වසංගත රෝගයක් වැළඳුණොත් ඒ බව වහාම සභාපතිහට දැන්විය යුතුය. තවද බලපත්‍රකාරයා තම කිරිපට්ටියේ සිටින්නාවූද ඒ ඕනෑම වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් පෙලෙන්නාවූ හෝ පෙලෙතැයි සැක කරනු ලබන්නාවූද ඕනෑම සතකු ඒ රෝගය බෝවීම වළක්වාලීම සඳහා අනික් සතුන් සිටින තැනින් ඉවතට ගත යුතුය; නැතහොත් ඉවත් කරවිය යුතුය.

(2) බලපත්‍රයක් ලත් හැම කිරිපට්ටියකම බලපත්‍රකාරයා යම් වසංගත රෝගයක් හෝ බෝවෙන රෝගයක් ඇතිවූ විට ඒ රෝගය මර්දනය කිරීම සඳහා සභාපතිහු හෝ වෙන නියි බලධාරියකු කලින් කල නිකුත් කරන නියමයන් පිළිපැදිය යුතුය.

(3) බුරුල්ලේ යෝ වේවා වෙන තැනක හෝ වේවා හටගත් ක්‍ෂය රෝගයෙන් හෝ බුරුල්ලේ තද දැවිල්ලෙන් හෝ කුර ලෙඩෙන් හෝ කට ලෙඩෙන් හෝ "ඇන්ත්‍රැක්ස්" වසංගතයෙන් හෝ බුරුල්ලේ සාදෙන "ඇක්ටිනොමයිකෝසිස්" රෝගයෙන් පෙලෙන කිසිම දෙනකුගේ කිරි විකිණීම හෝ විකිණීමට ඉඩ දීම නැතහොත් මනුෂ්‍යයන්ගේ පරිභෝජය පිණිස විකිණීමට ගන්නා වෙන (සතුන්ගේ) කිරි සමග මිශ්‍ර කිරීම හෝ මිශ්‍ර කිරීමට ඉඩ දීම කිරිපට්ටියක බලපත්‍රකාරයා විසින් නොකළ යුතුය.

22. බලපත්‍රයක් ලත් හැම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් තණකොළ හා විදුරු හැර පෙසු සියලු ගව ආහාර මීයන්ට ඇතුල්විය නොහැකි සුදුසු භාජනයක දමා තැබීමට සැලැස්විය යුතුය.

CamScanner

23. (1) විකිණීමට තිබෙන කිරි, කිරි කාමරයෙන් පිට කිරීම නැතක ... කිරිපට්ටියක බලපත්‍රකාරයා ඉඩ නොදිය යුතුය.

(2) කිරි එකතුකර හැකීම හා සකස් කිරීම හැර වෙන මොනයම් කටයුත්තක් සඳහා වත් කිරිකාමරයක පාවිච්චිකිරීම හෝ පාවිච්චි කිරීමට ඉඩ දීම කිරිපට්ටියක බලපත්‍රකාරයා විසින් නොකළ යුතුය.

24. කිරිපට්ටියක බලපත්‍රකාරයා විසින් වතුර හෝ වෙන බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයක් මිශ්‍රකොට කිරි දූෂණය කිරීම වත් ඒ දූෂිත කිරි විකිණීම වත් විකිණීමට ඉදිරිපත් කිරීම වත් විකිණීමට තැබීම වත් නැතින් තැන ගෙන ගොස් විකිණීම වත් භාරදීම වත් නොකළ යුතුය.

25. "යොදය ඉවත් කළ" යන්න සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මේ භාෂාවලින් හොඳට පැහැදිලිව ලියනලද ලේබලයක් කාටත් පෙනෙන්ට පිට අලවා ඇති භාජනයක බහා යොදය ඉවත් කළ කිරි බව අඟවා මිස නැත්නම් යොදය ඉවත් කළ කිසිම කිරක් කිරිපට්ටියක බලපත්‍රකාරයා විසින් විකිණීම හෝ විකිණීමට ඉදිරිපත් කිරීම හෝ විකිණීමට තැබීම හෝ නැතින් තැන ගෙන ගොස් විකිණීම හෝ භාරදීම නොකළ යුතුය.

26. බලපත්‍රයක් ලත් කිරිපට්ටියක සිටින දෙනුන් හැර වෙන දෙනුන් ගෙන් ලබාගත් කිරි, කිරිපට්ටියක බලපත්‍රකාරයා විසින් විකිණීම හෝ සැපයීම නොකළ යුතුය.

27. සභාපතිහට හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනට හෝ සවසාතා පරීක්ෂක තැනට හෝ සභාපතිහු විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් බලය පවරන ලද වෙන යම් නිලධාරියකුට විග්‍රහකර බැලීම පිණිස සැම්පලයක් වශයෙන් කිරි ටිකක් වටිනාකම ගෙවා ඕනෑම කිරිපට්ටියකින් නැතහොත් කිරි විකුණන්නාවූ හෝ විකිණීම පිණිස ඉදිරිපත් කරන්නාවූ හෝ නැතින් තැන ගෙනගොස් විකුණන්නාවූ හෝ භාරදෙන්නාවූ තැනැත්තකුගෙන් ඕනෑම වේලාවකදී ලබාගැනීමට බලය තිබිය යුතුය. තවද මුදල් ගෙවා ඒ කිරි සැම්පලය ඉල්ලූ විට, කිරිපට්ටියක බලපත්‍රකාරයා හෝ ලියාපදිංචි කරනු ලැබූ කිරි විකුණන්නකු හෝ අන් කිසිවකු විසින් ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප නොකළ යුතුය.

28. සභාපතිහු විසින් දෙනලද බලපත්‍රයක් පිට මිස කිසිවකු විසින් නගර සභා ප්‍රදේශය ඇතුළත වූ කිසිම තැනක්, පිටතින් ලබාගන්නා කිරි විකිණීම සඳහා පාවිච්චි නොකළ යුතුය.

29. කිරි ලබාගැනීමට අදහස් කරනු ලබන කිරිපට්ටිය යම් ප්‍රාදේශීය සභාවක සභාපති කෙනෙකුගේ පාලන ප්‍රදේශය ඇතුළත පිහිටියේ නම් ඔහු විසින් හෝ එවැනි ප්‍රාදේශික සභාවක් නැති නම් ඒ කිරි පට්ටිය පිහිටි දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැන විසින් හෝ පරීක්ෂාකොට නිදශීනයක් කළොත් මිස නැත්නම් 28වැනි උපනීතිය යටතේ බලපත්‍රයක් ලබාගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

30. 28වැනි උපනීතිය යටතේ දෙන හැම බලපත්‍රයක්ම එය දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එකවැනිද වනතෙක් වලංගුව පැවතිය යුතුය.

31. සභාපතිහු විසින් තත් වර්ෂය වෙනුවෙන් විධිවූ පරිදි දුන් ලියාපදිංචි කිරීමේ පත්‍රයක් තමා ළඟ ඇතිව මිස කිසිවකු නගර සභා ප්‍රදේශය ඇතුළත කිරි භාරදීම හෝ විකිණීම පිණිස ගෙනයෑම හෝ නැතින් තැන ගෙන ගොස් විකිණීම නොකළ යුතුය.

32. සභාපතිහු නියම කරන වෛද්‍ය නිලධාරියකු විසින් පරීක්ෂාකර බලා වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්ම රෝගයකින් තොරව සිටින බවට සහතික කරනතුරු 31වැනි උපනීතිය යටතේ කවරකුට වුවත් ලියාපදිංචි කිරීමේ පත්‍රයක් දීම ප්‍රතික්ෂේප කිරීමට සභාපතිහට බලය ඇත්තේය.

33. 31වැනි උපනීතිය යටතේ සභාපතිහු දෙන හැම ලියාපදිංචි කිරීමේ පත්‍රයකම පහත සඳහන් කරුණු අඩංගු විය යුතුය:—

(අ) ස්වාමියාගේ නම හා ලෙඛනගත අංකය;

(ආ) මෙහෙකරුවාගේ හෝ නියෝජිතයාගේ නම හා මගපට ඇඟිල්ලේ සලකුණ.

34. නගර සභා ප්‍රදේශය ඇතුළත කිරි භාරදෙන හෝ විකිණීම පිණිස ගෙනයන හෝ නැතින් තැන ගෙනගොස් විකුණන කිසිවකු තත් වර්ෂය සඳහා තමාට ලැබී ඇති ලියාපදිංචි කිරීමේ පත්‍රය පරීක්ෂාකර බැලීමට ඉදිරිපත් කරන මෙන් සවසාතා පරීක්ෂකයකු හෝ ඒ සඳහා සභාපතිහුගෙන් විශේෂ වශයෙන් හෝ සාමාන්‍ය වශයෙන් බලය ලත් ඕනෑම කෙනෙකු නියම කළ කල මොන යම් කරුණක් නිසා වත් එසේ නොකර සිටීම හෝ කරන්ට බැරිය කීම නොකළ යුතුය.

35. ගිසිවකු විසින් නගර සභා ප්‍රදේශය ඇතුළත මෙහි පහත පෙනෙන අයුරුවූ කිරි විකිණීම හෝ විකිණීම් වශයෙන් භාරදීම හෝ විකිණීමට තැබීම හෝ විකිණීමට ගෙනයෑම හෝ නැතින් තැන ගෙන ගොස් විකිණීම හෝ විකිණීමට ඉදිරිපත් කිරීම නොකළ යුතුය:—

(1) (අ) තෙල හැර මිදෙන කොටස සියයට 8.5කට අඩුවෙන් අන්තර්ගතවූ හෝ තෙල සියයට 3.5කට අඩුවෙන් අන්තර්ගතවූ එළකිරි;

(ආ) තෙල හැර මිදෙන කොටස සියයට 9කට අඩුවෙන් අන්තර්ගතවූ හෝ තෙල සියයට 7කට අඩුවෙන් අන්තර්ගතවූ මීකිරි.

(2) "යොදය ඉවත්කළ" යන්න සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මේ භාෂාවලින් හොඳට පැහැදිලිව ලියනලද ලේබලයක් කාටත් පෙනෙන්ට පිට අලවා ඇති භාජනයක බහා යොදය ඉවත් කළ කිරිබව අඟවා මිස නැත්නම් යොදය ඉවත්කළ කිසිම කිරක්;

(3) වතුර හෝ වෙන බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයක් සමග මිශ්‍රකොට දූෂණය කරනලද කිරි: එහෙත් තේ කඩයකදී හෝ කෝපි කඩයකදී හෝ බත් කඩයකදී පරිභොග කිරීම පිණිස තේ හෝ කෝපි හෝ කොකෝවා සමග මිශ්‍රකරනලද කිරි මේ උපනීතිය සම්බන්ධයෙන් දූෂිත කිරි වශයෙන් නොසැලකිය යුතුය.

(4) කබෙදුයියකින් හෝ දියබිරාව ඇද නොගන්නා වෙන යම් ද්‍රව්‍යයකින් කට නොවැසූ බෝතල්වල වක්කර තිබෙන කිරි.

36. (1) සභාපතිහට හෝ ඔහු විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරනලද (නගර සභාවේ) ඕනෑම නිලධාරියකුට යුක්තිසහගත ඕනෑම වේලාවකදී ඕනෑම කිරි පට්ටියකට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට බලය තිබිය යුතුය.

(2) කිරිපට්ටියේ බලපත්‍රකාරයා හෝ එය භාරව සිටින තැනැත්තා සභාපතිහට හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරනලද ඕනෑම නිලධාරියකුට කිරිපට්ටියට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට ඉඩ දී ප්‍රස්තාවයේ හැටියට සභාපතිහට හෝ ඒ නිලධාරියාට වුවමනා විය හැකි හැම උපකාරයක්ම කළ යුතුය.

37. කිරිපට්ටි පිළිබඳ මේ උපනීති මාලාවෙන් කවරක් වුවත් කඩ කරන හැම ප්‍රස්තාවයකදීම ඒ හැම කඩකිරීමකට රුපියල් දෙසිය පනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩකිරීම ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීම සිශිපත් කරවා සභාපතිහු හෝ ඔහු විසින් බලය පවරනලද නිලධාරියකු දන්වීම් පතක් භාරදුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද දඩුවම් දිය හැකි විය යුතුය.

38. කිරිපට්ටි හා කිරි විකිණීම පිළිබඳ මේ උපනීති මාලාවෙන් කවරක් වුවත් කඩකිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයා වූ බලපත්‍රකාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමටද ඊට අතිරේක වශයෙන් ඔහුට වෙන දඩුවමක් දීමටද (සෑහෙන අධිකරණය බලය ලත්) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකර ගැනීමට බලපත්‍රකාරයාට කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## XII වැනි කාණ්ඩය

### කරනැවුම් මැදිරි හා බාබර් සාප්පු පිළිබඳ උපනීති

1. (1) කරනැවුම් මැදිරියක් හෝ බාබර්-සාප්පුවක් දමා ගැනීම සඳහා සභාපතිහුගෙන් ලත් බලපත්‍රයක් පිට මිස කිසිවකු විසින් කරනැවුම් මැදිරියක් (Hair Dressing Saloon) හෝ බාබර් සාප්පුවක් දමා නොගත යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දෙන හැම බලපත්‍රයක්ම 14වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එක්වැනිදට අහෝසි විය යුතුය.

2. කරනැවුම් මැදිරියක් හෝ බාබර් සාප්පුවක් සඳහා පාවිච්චි කිරීමට අදහස් කරන ගොඩනැගිල්ල හෝ ගොඩනැගිල්ලේ කොටසද ඒ ස්ථානයේ හෝ සාප්පුවේ උපකරණද පහත පෙනෙන කොන්දේසිවලට හා නියමයන්ට ගැළපෙතොත් මිස නැත්නම් ඒ මැදිරියක් හෝ සාප්පුවක් දමා ගැනීම පිණිස බලපත්‍රයක් ලබාගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය—

(1) ඒ ගොඩනැගිල්ල හෝ ගොඩනැගිල්ලේ කොටස:—

(අ) ශක්තිමත් ලෙස සාද තිබිය යුතුය. එහි බිම වර්ග අඩි එකසිය විස්සකට අඩු නොවිය යුතුය;

(ආ) බිත්ති පුණු බදමෙන් කපලාරු කොට තිබිය යුතුය, ඒවායෙහි සුදුහුණු ගා තිබිය යුතුය, සුදු තීන්ත ගෑ ලෑලිවලින් හෝ එවැනි වෙන ද්‍රව්‍යයකින් සාදනලද සිලිමක් වහලට ගසා තිබිය යුතුය. බිමේ සිමෙන්ති දමා තිබිය යුතුය, බිත්ති හා බිම සන්ධිවන තැන සිමෙන්තියෙන් වටකුරු කර තිබිය යුතුය;

(ඇ) ඊට හොඳින් ආලෝකය හා වාතය ලැබිය යුතුය;

(ඈ) එහි හොඳ කාණු දමා තිබිය යුතුය, ගොඩනැගිල්ල ඇතුළතම හෝ ඒ ඉඩමේම, සෑහෙන තරම් වැසිකිළි තිබිය යුතුය.

3. [illegible] කරනැවුම් මැදිරි හෝ බාබර් සාප්පු පිළිබඳ මේ උප[illegible] මාලාව නගර සභාව විසින් වැළඳගත් දිනය වන විට පවත්වා [illegible] දමාගෙන තිබුණ කරනැවුම් මැදිරියක් හෝ බාබර් [illegible] තිබීම ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් (අ) උප[illegible] නියමයන් අදාල නොවිය යුතුය.

(2) ගොඩනැගිල්ලේ කිසියම් කොටසක් නිවාසස්ථානයක් වශයෙන් පාවිච්චි කරනොත් එසේ නැත්නම් එසේ පාවිච්චිකිරීමට අදහස් කරනොත් ඒ කොටස නිවාස හා නගර සංවිධාන ආඥාපනතේ (199 වැනි පරිච්ඡේදයේ) විධිවිධානවලට අනුකූලව විය යුතුය.

(3) කරනැවුම් මැදිරියෙහි හෝ බාබර් සාප්පුවේ—

(අ) (හිසකේ හා රැවුල් කැපීමට ඇරලා තිබෙන කොයි වේලාවේදීත්) සෑහෙන තරම් ජලයද;

(ආ) දිනපතා පාවිච්චි කරන මෙවලම් හෝ උපකරණ සේදීම පිණිස හෝ ඒවායේ ඇති විෂබීජ විනාශ කිරීම පිණිස උණුවතුර හෝ විෂබීජ නාශක ද්‍රව සෑහෙන තරම් ලබාගැනීමට මාගීයක් ද;

(ඇ) හිසකේ කපන්නන්ට හෝ බාබර්වරුන්ට තම වැඩ පල කරන අතරම අත් සෝදා ගැනීමට තැන්ද;

(ඈ) මෙවලම් හෝ උපකරණ සේදීමට ගන්නා විෂබීජ නාශක ද්‍රව වක්කර තැබීමට සෑහෙන තරම භාජනද;

(ඉ) හිසකේ රැවුල් කප්පවා ගැනීමට එන අයගේ ප්‍රයෝජනය සඳහා තුවා හා උඩවැසුම් සෑහෙන ගණනක්ද;

(ඊ) හිසකේ, රැවුල් කප්පවා ගැනීමට එන අයට හා සේවකයන්ට පහසුවෙන් කෙළ ගැසීමට පුළුවන් වෙන පරිදි පුටු ළඟ තබා තිබෙන පඩික්කම සෑහෙන ගණනක්ද;

(උ) කැපී යන හිසකේ කොට, රැවුල් ගස් හා සෙසු කුණු කසළ දැමීමට (තුත්තනාගම් හෝ) යකඩෙන් හෝ දියසිරාව නාල්ලන වෙන ද්‍රව්‍යයකින් සාදන ලද්දවූද තැනින් තැන ගෙනයා හැකිවූද මූඩියක් සහිතවූද කුණුබාල්දියක්ද;

තිබිය යුතුය.

3. කරනැවුම් මැදිරියක හෝ බාබර් සාප්පුවක බලපත්‍රකාරයා විසින් :—

(අ) කරනැවුම් මැදිරියේ හෝ බාබර් සාප්පුවේ පිටපැත්තේ කාටත් පෙනෙන තැනක ප්‍රස්තාවයේ හැටියට "බලපත්‍රයක් ලත් කරනැවුම් මැදිරිය හෝ බලපත්‍රයක් ලත් බාබර් සාප්පුව" යන මේ වචන පින්තාරු කරනලද දැන්වීම් පුවරුවක් සවිකොට තබාගත යුතුය.

(ආ) කරනැවුම් මැදිරි හෝ බාබර් සාප්පු පිළිබඳ මේ උපනීති මාලාවේ සිංහල පිටපතක් හා දෙමළ පිටපතක් හා ඉංග්‍රීසි පිටපතක් හා වෙන වෙනම රාමුවල දමීමවා ඒ මැදිරියේ හෝ සාප්පුවේ පිට පැත්තේ කාටත් පෙනෙන තැනක එල්ලා තැබිය යුතුය.

4. කරනැවුම් මැදිරියක හෝ බාබර් සාප්පුවක බලපත්‍රකාරයා විසින් :—

(අ) සමසකට වරක් බැගින් වත් ඒ මැදිරියේ හෝ සාප්පුවේ බිත්තිවල සුදුහුණු ගෑවීමට හා සිලිමේ තීන්ත ගෑවීමටත් ;

(ආ) ඒ මැදිරියේ හෝ සාප්පුවේ බිම, බිත්ති, සිලිම සවිකළ දේවල්, ලී බඩු, උපකරණ යන මේවා නිතරම පිරිසිදුව තබාගැනීමටත්

සැලැස්විය යුතුය.

5. කරනැවුම් මැදිරියක හෝ බාබර් සාප්පුවක බලපත්‍රකාරයා විසින් තමා එහි වැඩට ගන්නා හැම කරනැවුමියකුටම—හෝ බාබර් කෙනෙකුටම—

(අ) ශරීර හා ඇඳුම් ශුබපවිත්‍රව තබාගැනීමටත් ;

(ආ) ඇඟිලිවල නියපොතු කොටවෙන්ට කපා කුණු නැතිව තබා ගැනීමටත් ;

(ඇ) හිසකේ, රැවුල් කප්පවා ගැනීමට එන එක් එක් තැනැත්තාට කරනැවුම්කම් කරන්ට මත්තෙන් සබන් හා උණුවතුරෙන් අත් සෝදා ගැනීමටත්

සැලැස්විය යුතුය.

6. කරනැවුම් මැදිරියක හෝ බාබර් සාප්පුවක බලපත්‍රකාරයා විසින් :—

(අ) ඒ මැදිරියේ හෝ සාප්පුවේ තිබෙන හැම පඩික්කමක්ම පිරිසිදුව සවස්ථානුකූලව තබා ගැනීමටත් ;

(ආ) ඒ මැදිරියේ හෝ සාප්පුවේ හිසකේ පිසදැමීම සඳහා පාවිච්චි කරන හැම බුරුසුවක් හෝ හිසකෙස් පීරන හැම පනාවක්ම හැමදම සෝදා හෝ ශුබපවිත්‍රකොට විෂබීජ විනාශකොට හෝ වදකොට නිතරම පිරිසිදුව සවස්ථානුකූලම තබාගැනීමටත් ;

(ඇ) ඒ මැදිරියේ හෝ සාප්පුවේ පාවිච්චියට ගන්නා සබන් දිය කරන ජෝගු හෝ කෝප්ප, බුරුසු, හිසකේ කපන යන්ත්‍ර, දැළිපිහිය හෝ (හිසකේ කපන) සෙසු උපකරණ යන මේවා පාවිච්චියට ගන්නා එක් එක් වතාවෙන් පසු හොඳට උණු වතුරේ දමා සෝදා පවිත්‍ර කරවීමටත් ;

(ඈ) හිසකේ හා රැවුල් කප්පවා ගැනීමට එන එක් එක් තැනැත්තාට කරනැවුම්කම් කළ පසු හිසකේ කොට හා කුණු කසළ එකතු කරවා (ඒ සඳහා එහි තබා ඇති) කුණු බාල්දියකට දැමීමටත් ;

සැලැස්විය යුතුය.

7. කරනැවුම් මැදිරියක හෝ බාබර් සාප්පුවක බලපත්‍රකාරයා විසින් හිස රැවුල් කප්පවා ගැනීමට එන මොනම කෙනෙකුගේ වත් කැපුමකින් ලේ නැවැත්වීම පිණිස :—

(අ) ලේ නැවැත්වීමට පොදුවේ පාවිච්ච කරන ඖෂධයක් හෝ (Styptic Peneil) පුයර මලක් හෝ මුදු හත්තක් (Sponge) ; නැතහොත්

(ආ) ඵිනක්කාරම හෝ වෙන යම් ද්‍රව්‍යයක් කුඩුකර හෝ දියකර තිබෙතොත් මිස නැත්නම් ;

පාවිච්චි කිරීම හෝ ඒ මැදිරියේ හෝ සාප්පුවේ වැඩට ගෙන සිටින කිසිම බාබර් කෙනෙකුට හෝ හිසකේ කපන්නකුට පාවිච්චි කිරීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

8. කරනැවුම් මැදිරියක හෝ බාබර් සාප්පුවක බලපත්‍රකාරයා විසින් ඒ මැදිරියට හෝ සාප්පුවට එන කිසිවකුගේ පාවිච්චියට වරක් පාවිච්චි කළ තුවායක් හෝ අපිරිසිදු උඩවැස්මක් නොදිය යුතුය.

9. කරනැවුම් මැදිරියක හෝ බාබර් සාප්පුවක බලපත්‍රකාරයා විසින් :—

(අ) කිසිම වසංගත රෝග විශෙෂයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝග විශෙෂයකින් පෙළෙන්නාවූ හෝ ඒ රෝගයකින් පෙළෙන කෙනෙකුට ළඟදී සාත්තු කිරීමෙහි යෙදී සිටියාවූ හෝ කිසිවකුට මොනම කරුණක් නිසාවත් ඒ මැදිරියට හෝ සාප්පුවට ඇතුල්වීමට දැන දැනම ඉඩ නොදිය යුතුය;

(ආ) (අ) ඡේදයෙහි සඳහන් කිසිවකු ඒ මැදිරියේ හෝ සාප්පුවේ මොනම වැඩකට වත් නොගත යුතුය ;

(ඇ) මැදිරියේ හෝ සාප්පුවේ රක්ෂාව කරන කිසිම බාබර් කෙනෙකුට ~~හෝ හිස රැවුල් කපන්නකුට~~ (අ) ඡේදයෙහි සඳහන් කිසිවකුගේ හිස රැවුල් කැපීමට දැන දැනම ඉඩ නොදිය යුතුය;

(ඈ) ඒ බාබර් කෙනෙකු හෝ හිස රැවුල් කපන්නකු වැරදීමකින් හෝ අගම්බෙන් (අ) ඡේදයේ සඳහන් කිසිවකුගේ හිස රැවුල් කැපුවොත් ඔහුට අත් සෝදා ශුබපවිත්‍ර කර නොගෙන වෙන කෙනෙකුගේ හිස රැවුල් කැපීමට ඉඩ නොදිය යුතුය:

(ඉ) (අ) ඡේදයේ සඳහන් කිසිවකුගේ හිස රැවුල් කැපීමට ගන්නා ලද මොනම මෙවලමක් වුවත් විෂබීජ විනාශ කර දමන තුරු වෙන කෙනෙකුගේ හිස රැවුල් කැපීම සඳහා පාවිච්චි කිරීමට ඉඩ නොදිය යුතුය.

10. කිසිවකු කිසිම කරනැවුම් මැදිරියක් හෝ බාබර් සාප්පුවක් ඇතුළත පඩික්කමකට මිස වෙන තැනක කෙළ නොගැසිය යුතුය.

11. කරනැවුම් මැදිරියක හෝ බාබර් සාප්පුවක බලපත්‍රකාරයා විසින්. ඒ ස්ථානය :—

(අ) මොනම වේලාවකදී වත් ආහාර ගන්නා ස්ථානයක් වශයෙන් හෝ ;

(ආ) රාත්‍රිකාලය තුළ ඒ ස්ථානයෙහි හිස රැවුල් කැපීම නොකරන විට හැර නිදාගැනීමේ ස්ථානයක් වශයෙන්

පාවිච්චි කිරීම හෝ වෙන කෙනෙකුට එසේ පාවිච්චි කිරීමට ඉඩ දීම නොකළ යුතුය.

12. (1) සභාපතිහට හෝ ඔහු විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශෙෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරනලද නගර සභාවේ ඕනෑම නිලධාරියකුට යුක්තිසහගත ඕනෑම වේලාවකදී ඕනෑම කරනැවුම් මැදිරියකට හෝ බාබර් සාප්පුවකට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට බලය තිබිය යුතුය.

(2) කරනැවුම් මැදිරියේ හෝ බාබර් සාප්පුවේ බලපත්‍රකාරයා හෝ එය බාරව සිටින තැනැත්තා සභාපතිහට හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද ඕනෑම නිලධාරියකුට එකී ස්ථානයට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට ඉඩ දී ඒ සඳහා වුවමනාවන හැම උපකාරයක්ම කළ යුතුය.

13. කරනැවුම් මැදිරි හෝ බාබර් සාප්පු පිළිබඳ උපනීති මාලාවෙන් කවරක් වුවත් කඩකරන හැම ප්‍රස්තාවයකදීම රුපියල් දෙසියපනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩකිරීමක් ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීමක් ගැන සිහිපත්කරවා සභාපතිහු හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු දැන්වීම් පහක් බාරදුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියහොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද දඬුවම් දිය හැකිවිය යුතුය.

14. කරනැවුම් මැදිරි හෝ බාබර් සාප්පු පිළිබඳ මේ උපනීතිමාලාවෙන් කවරක් වුවත් කඩකිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයාවූ බලපත්‍රකාරයකුගේ බල පත්‍රය අවලංගු කිරීමටද ඊට අතිරේක වශයෙන් ඔහුට වෙන දඬුවමක් දීමටද (සෑහෙන අධිකරණ බලය ලත්) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකරගැනීමට බලපත්‍රකාරයාට කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## XIII වැනි කාණ්ඩය

### මාලු විකිණීම පිළිබඳ උපනීති

1. (1) මාලු විකිණීම සඳහා සභාපතිතුගෙන් ලත් බල පත්‍රයක් මිස කිසිවකු විසින් මාලු විකිණීම පිණිස (මාරකැටවුවත් හැර වෙන) කිසිම කඩයක් හෝ ස්ථානයක් පාවිච්චි නොකළ යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දෙන හැම බල පත්‍රයක්ම 24 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකළොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එක් වැනිදට අහෝසි විය යුතුය.

2. බලපත්‍රය දීමට තිබෙන ස්ථානයත් ඒ ස්ථානයේ ඇති උපකරණත් පහත පෙනෙන කොන්දේසිවලට ගැළපෙහොත් මිස නැත්නම් කිසිවකු මාලු කඩයක් දමාගැනීම පිණිස බල පත්‍රයක් ලබාගැනීමට අයිති වාසිකමක් නොතිබිය යුතුය:—

(1) ගෙවනැගිල්ල කැඩුම් බිඳුම් නැතිව මනා තත්ත්වයක තිබිය යුතුය. ඊට හොඳ වාතය හා ආලෝකය ලැබිය යුතුය. එහි හැම කාමරයකම ඇරියහැකි ජනේල තිබිය යුතුය. ඒ ජනේලවල වර්ගප්‍රමාණය බිමේ වර්ගප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවිය යුතුය;

(2) හැම කාමරයකම කොයි බිත්තියක් වත් උසින් අඩි හතකට අඩු නොවිය යුතුය. ඒවායේ පිගන් ගඩොල් ඇල්ලූ කොටස් හෝ සිමෙන්තියෙන් කපලාරුකළ කොටස් හැර සෙසු හැම තැනම හුණු බදාමෙන් කපලාරුකොට සුදුහුණු ගා තිබිය යුතුය;

(3) හැම වහල්පලයක්ම බිම සිට අඩුම ගණනේ අඩි හයක් වත් උස්විය යුතුය;

(4) සියලු ලී දඬුවල තීන්ත ගා තිබිය යුතුය; නැතහොත් සුදුහුණු ගා තිබිය යුතුය;

(5) බිම සිමෙන්ති දමා මැදලා (වැටෙන) වතුර හොඳින් බැසයන පරිදි කානුවක් දෙසට බෑවුමට තිබිය යුතුය. ඒ කානුව සිමෙන්තියෙන් බැඳ සිමෙන්තියෙන් කපලාරුකොට තිබිය යුතුවා පමණක් නොව බාල්දියකට හලා බැස්ස යුතුය;

(6) මාලු තබන හැම මේසයකම උඩුපැත්තේ හුත්තනාගම් තහඩු හෝ දියසීරාව ඇද නොගන්නා වෙන ද්‍රව්‍යයක් ගසා තිබිය යුතුය;

(7) ස්ථානයෙහි සවස්ථානුකූල කුණු බාල්දියක් හා සෑහෙන පමණ වැසිකිළි තිබිය යුතුය;

(8) ස්ථානය යම්කිසි වැසිකිළියක හෝ කසළ වළක හෝ පෝර ගොඩක හෝ නොවැසූ මලමූත්‍ර නාලිකාවක සිට අඩුම ගණනේ අඩි පනහක් වත් ඈතින් පිහිටා තිබිය යුතුය;

(9) ස්ථානය ඇතුළත හෝ ඊට කෙළින්ම සම්බන්ධවෙන්ට කිසිම කසළ වළක් හෝ වැසිකිළියක් හෝ අලුවළක් නොතිබිය යුතුය.

3. බලපත්‍රයක් ලත් හැම මාලු කඩයකම බලපත්‍රකාරයා විසින් තමාගේ නම හා "බලපත්‍රයක් ලත් මාලුකඩය" යන්න සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මේ භාෂාවලින් පැහැදිලි ලෙස පින්තාරුකොට ලෑල්ලක් ඒ ස්ථානයේ පිටපැත්තේ කාටත් පෙනෙන තැනක ගසා තැබිය යුතුය.

4. බලපත්‍රයක් ලත් හැම මාලු කඩයකම බලපත්‍රකාරයා විසින් මාලුකඩ පිළිබඳ මේ උපනීතිමාලාවේ සිංහල පිටපතක් හා දෙමළ පිටපතක් හා ඉංග්‍රීසි පිටපතක් වෙන වෙනම රාමුවල දම්මවා ඒ ස්ථානයේ කාටත් පෙනෙන තැනක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. තවද කොයි වේලාවකදී වුවත් පරීක්ෂාකර බැලීමට හැකිවන සේ (මාලු විකුණන්නන් ඇතුළුව එහි සිටින) සියලු සේවකයන්ගේ නම හා ලිපිනයන් ලැයිස්තුවක් වශයෙන් ලියා ඔහු විසින් ඒ ස්ථානයේ තබා ගත යුතුය.

5. බලපත්‍රයක් ලත් හැම මාලු කඩයකම බලපත්‍රකාරයා විසින් මාර්තු, ජූනි, සැප්තැම්බර්, දෙසැම්බර් යන මේ එක් එක් මාසයේදී වරක් බැගින් අඩුම ගණනේ අවුරුද්දකට සතර වරකුත් සභාපතිතු ලියවිල්ලකින් නියම කරන වෙන වකවානුවලදීත් ඒ මාලුකඩේ හැම කාමරයකම බිත්තිවල පිඟන් ගඩොල් අල්ලා ඇති කොටස් හා සිමෙන්තියෙන් කපලාරුකොට ඇති කොටස් හැර සෙසු සියලු කොටස් වල සුදුහුණු ගෑවීමද ලී දඬුවල තීන්ත ගා තිබේ නම් සබන් හා උණු වතුරෙන් සේදවීමද ඒවායේ තීන්ත ගා නැත්නම් සුදුහුණු ගෑවීමද කරවිය යුතුය.

6. බලපත්‍රයක් ලත් හැම මාලු කඩයකම බලපත්‍රකාරයා විසින් දවසකට වරක් බැගින් බලපත්‍රයේ සඳහන් කොට ඇති වේලාවේදී මාලුකඩයේ බිමද, බිත්තිවල පිඟන් ගඩොල් ඇල්ලූ හෝ සිමෙන්තියෙන් කපලාරු කළ කොටස්ද, මේසවල උඩුපැතිද, මාලුකොලොම්බුද පිරුවටයකින් හොඳින් උලා සේදීමට සැලැස්විය යුතුය. තවද ඔහු විසින් මාලු එල්ලා තැබීමට පාවිච්චිකරන සියලු හොකු මලකඩ නොකන අන්දමට හොඳට පිරිසිදු කොට තැබ්බවිය යුතුය.

7. බලපත්‍රයක් ලත් හැම මාලු කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ කඩයේ හැම තැනක්ද, එහි උපකරණද භාජනද ලීබඩුද මාලු දමා තැබීම හා සකස්කිරීම හා විකිණීම සඳහා පාවිච්චි කරන භාජන හා උපකරණද කැලුම් බිඳුම් නැතිව ශුද්ධ පවිත්‍ර කොට මනා තත්ත්වයක තබාගත යුතුය. එසේම සෑම කානුවකින් හෝ වැසිකිළියකින් හෝ කසළ වළ ඩෝන් හෝ වෙන අප්‍රසන්න දෙයකින් නැගෙන දුර්ගන්ධයක් ඒවාට වැදෙන්ට ඔහු විසින් ඉඩ නොහැරිය යුතුය.

8. බලපත්‍රයක් ලත් හැම මාලු කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයෙහි සවස්ථානුකූල කුණුබාල්දියක් හා අඩුම ගණනේ එක් පඩික්කමක්ද සේවකයන්ට පහසුවෙන් පාවිච්චි කළ හැකි වන සේ තැබ්බවීමට සැලැස්විය යුතුය.

9. බලපත්‍රයක් ලත් හැම මාලු කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයෙහි ඇති කුණුරොඩු හා නොවිකිණිය හැකි කටු, බොකු, බඩ වැල් ආදී දේ දියසීරාව බී නොගන්නාවූද පියනක් සහිතවූද භාජනය කට වහාම දම්මවා දින පතා ඒ ස්ථානයෙන් ඉවත් කරවීමට සැලැස් විය යුතුය. කුණු රොඩු ආදිය දමන වේලාවලදී හැර අනිත් කොට වේලාවේදීත් ඒ භාජනය වසා තැබීමට ඔහු විසින් සැලැස්විය යුතුය.

10. බලපත්‍රයක් ලත් හැම මාලු කඩයකම ලබපත්‍රකාරයා විසින් ඒ ස්ථානය මියන් වැද්ද නොදී තබාගත යුතුවාත් හැර මීගුල් තිබෙනවා දයින්ට ලැඹිණු වහාම වීදුරු කැබලි පුරවා සිමෙන්ති දමා කපලාරු කොට වසා දැමීමට සැලැස්විය යුතුය.

11. බලපත්‍රයක් ලත් ස්ථානයෙහි කොතනම කරුණක් නිසා වත් කිසිවකු විසින් කිසිම සතකු වත් කුරුල්ලකු වත් තබා නොගත යුතුය.

12. මාලු කඩයක් ඇතුළත තබා තිබෙන පඩික්කමකට මිස ඒ කඩයේ වෙන තැනක කිසිවකු විසින් කෙළ නොගැසිය යුතුය.

13. වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවන රෝගයකින් හෝ චම රෝගයකින් පෙළෙන්නාවූ හෝ ළඟදී පෙළුණාවූ හෝ ඒ රෝගයකින් පෙළුණ කෙනෙකුට ළඟදී සාත්තු කළාවූ කිසිවකු මාලු කඩයකට ඇතුල්වීම හෝ එහි මාලු රැස්කර තැබීමේ හෝ සකස් කිරීමේ හෝ විකිණීමේ කටයුත්තකට සම්බන්ධවීම හෝ ඒ මාලු කඩයට මාලු ගෙනඊමට හෝ ඒ මාලු කඩේ සිට මාලු ගෙනයෑමට සම්බන්ධවීම නොකළ යුතුය.

14. මාලු කඩයක බලපත්‍රකාරයා විසින් කිසිවකුට වත් 11 වැනි උපනීතිය හෝ 12 වැනි උපනීතිය හෝ 13 වැනි උපනීතිය කඩ කිරීමට ඉඩ දීම හෝ ඒ කඩ කිරීමක් ඉවසීම නොකළ යුතුය.

15. බලපත්‍රයක් ලත් මාලු කඩයෙහි මාලු දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට පාවිච්චි කරන දේවල් හැර කිසිම ලී බඩුවක් වත් ඇඳුමක් වත් නිදාගන්නා පැදුරක් වත් වෙන දෙයක් වත් තබා නොගත යුතුය.

16. මාලු කඩේම කොටසක්වූද, ඒ මට්ටමටම පිහිටියාවූද කිසිම තැනක් බිම සිට වහලේ සිලිම දක්වා පාරිෂත් බිත්තියකින් හොඳට වෙන්වී බිමේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවන වර්ග ප්‍රමාණයකින් යුත් (පිටතට ඇරිය හැකි) ජනේලයක් ඇතිව තිබෙහොත් මිස නැත්නම් නිදාගැනීමේ ස්ථානයක් වශයෙන් පාවිච්චි කිරීමට මාලු කඩයක බලපත්‍රකාරයා විසින් ඉඩ නොදිය යුතුය.

17. බලපත්‍රයක් ලත් හැම මාලු කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයෙහි බීමට සුදුසු වතුර සෑහෙන තරමට තබාගත යුතුය.

18. බලපත්‍රයක් ලත් හැම මාලු කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානය මාලු විකිණීම සඳහා දිනපතා ඇරලා තබාගත යුතුය.

19. මාලු කඩයක බලපත්‍රකාරයා විසින් කිසිවකුට සභාපතිතුත් තමාත් අත්සන් කළ ලියාපදිංචිකිරීමේ පත්‍රයක් ළඟ තබා නොගෙන තමාගේ මාලු කඩයෙන් විකිණීම් සඳහා මාලු ගෙන යෑමට ඉඩ නොදිය යුතුය.

20. ආවරණය කළ රථයක හෝ වැසූ පෙට්ටියක හෝ බෙලෙක් බඳුනක හෝ වෙන සුදුසු භාජනයක දමාගෙන මිස මාලු කඩයෙන් විකිණීම පිණිස පිටතට මාලු ගෙන යෑමට මාලු කඩයක බලපත්‍රකාරයා විසින් කිසිවකුට ඉඩ නොදිය යුතුය. තවද ඔහු විසින් ඒ රථය හෝ පෙට්ටිය හෝ බෙලෙක් බඳුන හෝ භාජනය හැම වේලේහිම ශුද්ධ පවිත්‍ර කොට සවස්ථානුකූල ලෙස තබා ගැනීමට සැලැස්විය යුතුය.

21. මාලු කඩයක බලපත්‍රකාරයා ඉල්ලූ විට සභාපතිතු විසින් ඒ බල පත්‍රකාරයා යටතේ වෙළඳාම සඳහා මාලු එහා මෙහා ගෙනයෑමට රඳවාගෙන සිටින කාටත් ලියාපදිංචිකිරීමේ පත්‍ර නොමිලයේ දිය යුතුය.

22. (1) සභාපති හට හෝ ඔහු විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරන ලද නගර සභාවේ ඕනෑම නිලධාරියකුට යුක්ති සහගත ඕනෑම වේලාවකදී ඕනෑම මාලු කඩයකට හෝ මාලු විකුණන ස්ථානයකට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට බලය තිබිය යුතුය.

(2) මාලු වෙළඳාම් කරන කඩයේ හෝ ස්ථානයේ බලපත්‍රකාරයා හෝ එය බාරව සිටින තැනැත්තා සභාපතිහට හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද ඕනෑම නිලධාරියකුට ඒ ස්ථානයට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට ඉඩ දී ඒ සඳහා වුවමනා හැම උපකාරයක්ම කළ යුතුය.

23. මාලු වෙළඳාම පිළිබඳ මේ උපනීතිමාලාවෙන් කවරක් වුවත් කඩ කරන හැම ප්‍රස්තාවයකදීම රුපියල් දෙසිය පනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩ කිරීමක් ගැන වරදකාරයා බව ඔප්පු වූ පසු හෝ ඒ කඩ කිරීමක් ගැන සියිපත් කරවා සභාපතිහු හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු දන්වීම් පතක් බාරදුන පසු ඒ කඩ කිරීම කරගෙන ගියොත් එසේ කඩ කරන එක් එක් දවසට රුපියල් විසිපහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද දඬුවම් දිය හැකි විය යුතුය.

24. මාලු වෙළඳාම පිළිබඳ මෙ උපනීතිමාලාවෙන් කවරක් වුවත් කඩ කිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයා වූ බලපත්‍රකාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමට අතිරේක වශයෙන් ඔහුට වෙන දඬුවමක් දීමටද (සෑහෙන අධිකරණ බලය ලත්) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකර ගැනීමට බලපත්‍රකාරයාට කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## XIV වැනි කාණ්ඩය

### මස් විකිණීම පිළිබඳ උපනීති

1. (1) මස් විකිණීම පිණිස සභාපතිතුගෙන් ලත් බලපත්‍රයක් ඇට මිස කිසිවකු විසින් මස් විකිණීම පිණිස (මාර්කැට්වුවත් හැර වෙන) කිසිම කඩයක් හෝ ස්ථානයක් පාවිච්චි නොකළ යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දෙන සෑම බලපත්‍රයක්ම 25 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එක්වැනිදාට අහෝසි විය යුතුය.

2. බලපත්‍රය දෙන්ට තිබෙන ස්ථානයත් ඒ ස්ථානයේ ඇති උපකරණත් පහත පෙනෙන කොන්දේසිවලට ගැළපෙනොත් මිස නැත්නම් මස් විකිණීම පිණිස කඩයක් දමා ගැනීම සඳහා බලපත්‍රයක් ලබාගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය—

(1) ගොඩනැගිල්ල කැඩුම් බිඳුම් නැතිව මනා තත්ත්වයක තිබිය යුතුය. ඊට හොඳින් වාතය හා ආලෝකය ලැබිය යුතුය. එහි හැම කාමරයකම ඇරිය හැකි ජනේල තිබිය යුතුය. ඒ ජනේලවල වර්ග ප්‍රමාණය කාමරයේ බිමේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවිය යුතුය;

(2) හැම කාමරයකම කොයි බිත්තියක් වත් උසින් අඩි හතකට අඩු නොවිය යුතුය. ඒවා ගඩොලෙන් හෝ කළු ගලෙන් හෝ කබුක් ගලෙන් බැඳ තිබිය යුතුය. ඒවායේ ඇතුල් පැත්ත හුණු බදාමෙන් කපරාරුකොට සුදුහුණු ගා තිබිය යුතුය. එක් එක් බිත්තියේ ඇතුල් පැත්තේ පොළොවේ සිට අඩි හතරක් උසට සිමෙන්තියෙන් කපරාරුවක් දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතුය;

(3) හැම වහල් පලයක්ම බිම සිට අවුම ගණනේ අඩි හයක් වත් උස් විය යුතුය;

(4) වහළ කල් පවතින ද්‍රව්‍යයකින් සෙවෙලිකර තිබිය යුතුය;

(5) සියලු ලී දැවවල තීන්ත හෝ සුදුහුණු ගා තිබිය යුතුය;

(6) බිම හැම තැනම සිමෙන්ති දමා තිබිය යුතුය;

(7) ස්ථානයෙහි වතුර බැසයාම සඳහා සෑහෙන තරම් කානු දමා තිබිය යුතුය;

(8) බිත්ති හා බිම ශුද්ධ පවිත්‍ර කළ හැකි වන සේ මේස හා යෙසු සියලු ලී බඩු එහා මෙහා කරන්ට පුළුවන් කම තිබිය යුතුය;

(9) මස් තබන හැම මේසයකම උඩු පැත්තේ තුත්තනාගම් තහඩු හෝ දිය සිරාව බී නොගන්නා වෙන ද්‍රව්‍යයක් ගසා තිබිය යුතුය;

(10) සවස්ථානුකූල කුණු බාල්දියකුත් අවුම ගණනේ එක පඩික්කමක් වත් සෑහෙන පමණ වැසිකිළිත් ස්ථානයෙහි තිබිය යුතුය;

(11) ස්ථානය, ඔනෑම වැසිකිළියක හෝ කසළ වළක හෝ පෝර ගොඩක හෝ නොවැසූ මල මූත්‍ර නාලිකාවක සිට අවුම ගණනේ අඩි පනහක් වත් ඈතින් පිහිටා තිබිය යුතුය;

(12) ස්ථානය ඇතුළත හෝ ඊට කෙළින්ම සම්බන්ධවන සේ කිසිම කසළ වළක් හෝ වැසිකිළියක් හෝ අලු වළක් නොතිබිය යුතුය.

3. බලපත්‍රයක් ලත් හැම මස් කඩයකම බලපත්‍රකාරයා විසින් තමාගේ නම හා "බලපත්‍රයක් ලත් මස් කඩය" යන්න සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි යන මේ භාෂාවලින් පැහැදිලි ලෙස පින්තාරුකොට ලෑල්ලක් ඒ ස්ථානයේ පිට පැත්තේ කාටත් පෙනෙන තැනක ගසා තැබිය යුතුය.

4. බලපත්‍රයක් ලත් හැම මස් කඩයකම බලපත්‍රකාරයා විසින් මස්කඩ පිළිබඳ මේ උපනීතිමාලාවේ සිංහල පිටපතක් හා දෙමළ පිටපතක් හා ඉංග්‍රීසි පිටපතක් වෙන වෙනම රාමුවල දමමින් ඒ ස්ථානයේ කාටත් පෙනෙන තැනක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. තවද කොයි වේලාවකදී වුවත් පරීක්ෂාකර බැලිය හැකි වන සේ මස් විකුණන්නන් ඇතුළු සියලු සේවකයන්ගේ නම් හා ලිපිනයන් ලැයිස්තුවක් වශයෙන් ලියා ඔහු විසින් ඒ ස්ථානයේ තබාගත යුතුය.

5. බලපත්‍රයක් ලත් හැම මස් කඩයකම බලපත්‍රකාරයා විසින් මාර්තු, ජූනි, සැප්තැම්බර්, දෙසැම්බර් යන මේ එක් එක් මාසයේදී වරක් බැගින් අවුම ගණනේ අවුරුද්දකට සතර වරකුත් සභාපතිතු ලියවිල්ලකින් නියම කරන වෙන විකවානුවලදීත් ඒ මස් කඩයේ හැම කාමරයකම බිත්තිවල පිඟන් ගඩොල් අල්ලා ඇති කොටස් හා සිමෙන්තියෙන් කපරාරුකොට ඇති කොටස් හැර සෙසු සියලු කොටස්වල සුදුහුණු ගෑවීමද ලී දැවවල තීන්ත යා තිබේ නම් සබන් හා උණු වතුරෙන් සේදවීමද ඒවායේ තීන්ත ගා නැති නම් සුදුහුණු ගෑවීමද කරවිය යුතුය.

6. බලපත්‍රයක් ලත් හැම මස් කඩයකම බලපත්‍රකාරයා විසින් දවසකට වරක් බැගින් බලපත්‍රයේ සඳහන් කොට ඇති වේලාවේදී මස්කඩයේ බිමද, බිත්තිවල පිඟන් ගඩොල් ඇල්ලූ හෝ සිමෙන්තියෙන් කපරාරු කළ කොටස්ද, මේසවල උඩුපැතිද මස් කොලොම්බුද බුරුසුවකින් හොඳින් උලා සේදවීමට සැලැස්විය යුතුය. තවද ඔහු විසින් මස් එල්ලා තැබීමට පාවිච්චි කරන සියලු කොකු, මලකඩ නොකන අන්දමට හොඳට ශුද්ධ කොට තැබිබවිය යුතුය.

7. බලපත්‍රයක් ලත් හැම මස් කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ කඩයේ හැම තැනමද එහි පරිසරයද කානුද ලී බඩුද මස් දමා තැබීම හා යකස් කිරීම හා විකිණීම සඳහා පාවිච්චි කරන භාජන හා උපකරණද කැඩුම් බිඳුම් නැතිව ශුද්ධ පවිත්‍ර කොට තබාගත යුතුය. එසේම යම් කානුවකින් හෝ වැසිකිළියකින් හෝ කසළ වළකින් හෝ වෙන අප්‍රසන්න දෙයකින් නැගෙන දුර්ගන්ධයක් ඒවාට වැදෙන්ට ඔහු විසින් ඉඩ නොදිය යුතුය.

8. බලපත්‍රයක් ලත් හැම මස් කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයෙහි සවස්ථානුකූල කුණුබාල්දියක් හා අවුම ගණනේ එක් පඩික්කමක්වත් සේවකයන්ට පහසුවෙන් පාවිච්චි කළ හැකි වන සේ තැබ්බවීමට සැලැස්විය යුතුය.

9. බලපත්‍රයක් ලත් හැම මස් කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයෙහි ඇති කුණු රොඩු, ගා විකිණිය නොහැකි කටු ආදී දේ, දියසිරාව බී නොගන්නාවූද පියනක් සහිතවූද තුත්තනාගම් තහඩුවලින් හෝ තුත්තනාගම් ගෑ යකඩ තහඩුවලින් සාදන ලද්දවූද භාජනයකට වහාම දමමවා දින පතා ඒ ස්ථානයෙන් ඉවත්කරවීමට සැලැස් විය යුතුය. ඇතුළට කුණු රොඩු ආදිය දැමීමට පාවිච්චි කරන වේලාවලදී හැර අනික් කොයි වේලාවේදීත් ඒ භාජනය වසා තැබීමට ඔහු විසින් සැලැස්විය යුතුය.

10. බලපත්‍රයක් ලත් හැම මස් කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානය මීයන් වැද්ද නොදී තබාගත යුතුවාත් හැර මීගුල් තිබෙනවා දකින්ට ලැබුණ වහාම වීදුරු කැබලි පුරවා සිමෙන්ති දමා කපරාරුකොට වසා දැමීමට සැලැස්විය යුතුය.

11. බලපත්‍රයක් ලත් ස්ථානයෙහි මොනම කරුණක් නිසා වත් කිසිවකු විසින් කිසිම සතකු වත් කුරුල්ලකු වත් තබා නොගත යුතුය.

12. මස් කඩයක් ඇතුළත හබා තිබෙන පඩික්කමකට මිස ඒ කඩයේ වෙන තැනක කිසිවකු විසින් කෙළ නොගැසිය යුතුය.

13. යම්කිසි වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන්නාවූ හෝ ළඟදී පෙළුණාවූ හෝ ඒ රෝගයකින් පෙළුණ කෙනෙකුට ළඟදී සාත්තු කළාවූ කිසිවකු මස් කඩයකට ඇතුල්වීම හෝ එහි මස් රැස්කර තැබීමේ හෝ යකස් කිරීමේ හෝ විකිණීමේ කටයුත්තකට සම්බන්ධ වීම හෝ මස් කඩයට මස් ගෙන ඊමට හෝ මස් කඩයේ සිට මස් ගෙනයෑමට සම්බන්ධවීම නොකළ යුතුය.

14. මස් කඩයක බලපත්‍රකාරයා විසින් කිසිවකුට 12 වැනි උපනීතිය හෝ 13 වැනි උපනීතිය කඩ කිරීමට ඉඩ නොදිය යුතුය.

15. බලපත්‍රයක් ලත් මස් කඩයෙහි මස් දමා තැබීමට හෝ යකස් කිරීමට හෝ විකිණීමට පාවිච්චි කරන දේවල් හැර කිසිම ලී බඩුවක් හෝ ඇඳුමක් හෝ නිදගන්නා පැදුරක් හෝ වෙන දෙයක් තබා නොගත යුතුය.

16. මස් කඩයක බලපත්‍රකාරයා විසින්, මස් කඩේම කොටසක්වූද ඒ මට්ටමටම පිහිටියාවූද, කිසිම තැනක් බිම සිට වහලේ සිලිම දක්වා පාවිෂන් බිත්තියකින් හොඳට වෙන්වී බිමේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවන වර්ග ප්‍රමාණයකින් යුත් (පිටතට ඇරිය හැකි) ජනේලයක් ඇතිව තිබෙනොත් මිස නැත්නම් නිදාගැනීමේ ස්ථානයක් වශයෙන් පාවිච්චිකිරීමට ඉඩ නොදිය යුතුය.

17. බලපත්‍රයක් ලත් හැම මස් කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයෙහි බිමට සුදුසු වතුර සෑහෙන තරමට තබාගත යුතුය.

18. මස් කඩයක බලපත්‍රකාරයා විසින් සභාවේ පාලන ප්‍රදේශය ඇතුළත පිහිටියාවූද මෙහි සතුන් මැරීම පිළිබඳ ආඥාපනතේ (201 වැනි [illegible]) 21 වැනි වගන්තිය යටතේ ප්‍රකාශකොට ප්‍රසිද්ධ කරනු [illegible]වූද පොදු වධශාලාවකදී (slaughter-house) මරන ලද හෝ [illegible] සතුන් මැරීම සඳහා එකී ආඥාපනතේ 11 වැනි වගන්තිය යටතේ නිසි පාලන මණ්ඩලයෙන් නියම කරන ලද ස්ථානයකදී මරන ලද හෝ එකී ආඥාපනතේ 14 වැනි වගන්තිය යටතේ [illegible] ප්‍රදේශයෙන් පිට මරන ලද සතුන්ගේ මස් හැර වෙන කිසිම මසක් ඒ මස් කඩය තුළ විකිණීම හෝ විකිණීමට තැබීම නොකළ යුතුය.

19. බලපත්‍රයක් ලත් හැම මස් කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ කඩය මස් විකිණීම සඳහා පෙරවරු 7 සිට පෙරවරු 10 දක්වාත් පස්වරු 3 සිට පස්වරු 7 දක්වාත් දිනපතා ඇරලා තැබිය යුතුය.

20. මස් කඩයක බලපත්‍රකාරයා විසින් තමා ලග රක්ෂාවේ යොදවා ගෙන සිටින සියලුම සභාපතිනුත් තමාත් අත්සන් කල ලියාපදිංචි කිරීමේ පත්‍රයක් ලග තබාගෙන මිස විකිණීම සඳහා ඒ කඩයෙන් මස් ගෙනයැමට ඉඩ නොදිය යුතුය.

21. මස් කඩයක බලපත්‍රකාරයා විසින් තමා ලග රක්ෂාවෙහි යෙදවා ගෙන සිටින කිසිවකුට ආවරණය කල රථයක හෝ වැසූ පෙට්ටියක හෝ බෙලෙක් බඳුනක හෝ වෙන සුදුසු භාජනයක දමාගෙන මිස ඒ කඩයෙන් විකිණීම පිණිස පිටතට මොනම මසක් වත් ගෙන යැමට ඉඩ නොදිය යුතුය. තවද ඔහු විසින් ඒ රථය හෝ පෙට්ටිය හෝ බෙලෙක් බඳුන හෝ භාජනය කොයි වේලාවේදීත් ශුද්ධපවිත්‍ර ලෙස හා සවස්ථාවයක ලෙස තබාගැනීමට සැලැස්විය යුතුය.

22. මස් කඩයක බලපත්‍රකාරයා ඉල්ලූ විට සභාපතිනු ඒ බලපත්‍රකාරයා යටතේ වෙළදාම සඳහා මස් එහා මෙහා ගෙනයැමට රදාගෙන සිටින කාටත් ලියාපදිංචිකිරීමේ පත්‍ර දිය යුතුය.

23. (1) සභාපතිගට හෝ ඔහු විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශෙෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරන ලද නගර සභාවේ ඕනෑම නිලධාරියකුට මස් විකුණන ඕනෑම කඩයකට හෝ ස්ථානයකට යුක්තිසහගත ඕනෑම වේලාවකදී ඇතුල්වී එය පරීක්ෂා කිරීමට බලය තිබිය යුතුය.

(2) මස් විකුණන ඕනෑම කඩයක හෝ ස්ථානයක බලපත්‍රකාරයා විසින් හෝ එය බාරව සිටින තැනැත්තා විසින් සභාපතිගට හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද ඕනෑම නිලධාරියකුට ඒ ස්ථානයට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට ඉඩ දී ඒ සඳහා වුවමනාවන හැම උපකාරයක්ම කල යුතුය.

24. මස් විකිණීම පිළිබඳ මේ උපනීති මාලාවෙන් කවරක් වුවත් කඩ කරන හැම ප්‍රස්ථාවයකදීම රුපියල් දෙසිය පනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩ කිරීමක් ගැන වරදකාරයා බව ඔප්පු වූ පසු ඒ කඩ කිරීමක් ගැන සිහිපත් කරවා සභාපතිනු හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු දන්වීම් පතක් බාරදුන් පසු ඒ කඩ කිරීම කරගෙන ගියොත් එසේ කඩ කරන එක් එක් දවසට රුපියල් විසිපහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද දඬුවම් දිය හැකි විය යුතුය.

25. මස් විකිණීම පිළිබඳ මේ උපනීතිමාලාවෙන් කවරක් වුවත් කඩ කිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයාවූ බලපත්‍රකාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමටද ඊට අතිරේක වශයෙන් ඔහුට වෙන දඬුවමක් දීමට (සෑහෙන අධිකරණ බලය ලත්) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකර ගැනීමට බලපත්‍රකාරයාට කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## XV වැනි කාණ්ඩය

### හරක් ගාල් පිළිබඳ උපනීති

1. (1) හරක් ගාලක් තබාගැනීමට සභාපතිනුගෙන් ලත් බලපත්‍රයක් පිට මිස කිසිවකු විසින් හරක් ගාලක් තබා නොගත යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දෙන හැම බලපත්‍රයක්ම 11 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එක්වැනිදාට අහෝසිවිය යුතුය.

2. බලපත්‍රයක් දෙන්ට තිබෙන ස්ථානය පහත පෙනෙන කොන්දේසිවලට සැලපෙනොත් මිස නැත්නම් ගාලක් දමාගැනීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය—

(1) භූමිභාගය සමතලාකොට තිබිය යුතුය. එහි වතුර බැසයෑමේ පහසු කම් තිබිය යුතුය. තදට හා සමතලාවට ඊමෙන ලේ බිමේ කළු ගල් අල්ලා තිබිය යුතුය; නැතහොත් බිම කළුගල් අතුරා තල තිබිය යුතුය.

(2) ගොම හරකුන් දැමීමට තිබෙන හැම කොටනැගිල්ලක්ම [illegible] මුළුමනින්ම කොන්ක්‍රීට් හෝ ගලෙන් හෝ ගඩොලෙන් හෝ සාදා තිබිය යුතුය. එහි බිත්ති හා කුලුණු බිම සිට අඩි [illegible] උසට සිමෙන්තියෙන් සපලරුකොට සුදුහුණු හා [illegible] යුතුය. වහල සැල් පවතින ද්‍රව්‍යයකින් පෙවෙලිකොට තිබිය යුතුය. බිම සිමෙන්ති හෝ කොන්ක්‍රීට් හෝ ගල් කාර දමා [illegible] හෝ ගල් අල්ලා තිබිය යුතුය. හෝ මුත්‍රා [illegible] වතුර, වැසිවතුර යන මේවා බැස්සවීමට [illegible] නිර්දේශ කළ [illegible] කානු තිබිය යුතුය. [illegible] හෝ ඊට වැඩි ගණනකට ඒ කානු වැටිය යුතු—

(3) බිමෙන් ස්ථානය ජේදීමෙන් ඒ ස්ථානයෙහි සෑහෙන තරම් [illegible] තිබිය යුතුය.

(4) ස්ථානයෙහි සෑහෙන තරම් වැසිකිලි තිබිය යුතුය.



3. බලපත්‍රයක් ලත් හැම හරක් ගාලකම බලපත්‍රකාරයා විසින් "බලපත්‍රයක් ලත් ගාල" යන්නත් තමාගේ නමත් සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන එම භාෂාවලින් පැහැදිලි ලෙස පින්තාරුකොට ලෑල්ලක ගාලේ පිටපැත්තේ කාටත් පෙනෙන හැටියට ගසා තැබිය යුතුය.

4. බලපත්‍රයක් ලත් හැම ගාලකම බලපත්‍රකාරයා විසින් ගාල් පිළිබඳ මේ උපනීතිමාලාවේ සිංහල පිටපතක් දෙමල පිටපතක් හා ඉංග්‍රීසි පිටපතක් වෙන වෙනම රාමුවල දමමින් ඒ ස්ථානයෙහි කාටත් පෙනෙන තැනක එල්ලා තැබිය යුතුය.

5. බලපත්‍රයක් ලත් හැම ගාලකම බලපත්‍රකාරයා විසින් මාර්තු, ජූනි, සැප්තැම්බර්, දෙසැම්බර් යන මේ එක් එක් මාසයේදී වරක් බැගින් අවුරුද්දකට හතර වරක් ගාලේ බිත්තිවල හා කුලුණුවල සුදුහුණු හෝ තාර ගෑවීමට සැලැස්විය යුතුය.

6. බලපත්‍රයක් ලත් හැම ගාලකම බලපත්‍රකාරයා විසින් ගාලත් එහි තිබෙන සියලු ගොඩනැගිලිත් කැඩුම් බිඳුම් නැතිව ශුද්ධපවිත්‍රකොට සවස්ථානුකූලව තබාගෙන දිනපතා සෝද අතුගෑවීමට සැලැස්විය යුතුය.

7. බලපත්‍රයක් ලත් හැම ගාලකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානය ශුද්ධපවිත්‍රව සවස්ථානුකූලව තබාගැනීම පිණිස ඒ ස්ථානයෙහි ඇති සියලු ගොම හා සෙසු කැලිකසල දිනපතා කලට වේලාවට එකතුකරවා එසේ එකතුකරනලද ඒ ගොම හා කැලිකසල (දියසීරාව බී නොගන්නා ද්‍රව්‍යයකින් සාදන ලද්දාවූද වසන ලද්දාවූද) භාජන එකකට හෝ ඊට වැඩි ගණනකට දැමීමට සැලැස්විය යුතුය.

8. බලපත්‍රයක් ලත් හැම ගාලකම බලපත්‍රකාරයා විසින් සියලු ගොම, කැලිකසල, මුත්‍ර සේදී යන වතුර යන මේවා අඩුම ගණනේ දවසකට වරක් බැගින් වත් ගාලෙන් ඉවත්කරවා කිසිවකුට වත් එයින් ගැහැටක් නොවන පරිද්දෙන් ඒවාට පිළිවෙලක් කරවිය යුතුය.

9. (1) සභාපතිගට හෝ ඔහු විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශෙෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරනලද නගර සභාවේ ඕනෑම නිලධාරියකුට ඕනෑම ගාලකට යුක්තිසහගත ඕනෑම වේලාවකදී ඇතුල්වී එය පරීක්ෂා කිරීමට බලය තිබිය යුතුය.

(2) ගාලේ බලපත්‍රකාරයා විසින් හෝ එය බාරව සිටින තැනැත්තා විසින් සභාපතිගට යෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද ඕනෑම නිලධාරියකුට ගාලට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට ඉඩ දී ඒ සඳහා වුවමනා වන හැම උපකාරයක්ම කල යුතුය.

10. ගාල් පිළිබඳ මේ උපනීතිමාලාවෙන් කවරක් වුවත් කඩකරන හැම ප්‍රස්තාවයකදීම රුපියල් දෙසිය පනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩකිරීමක් ගැන සිහිපත් කරවා සභාපතිනු හෝ ඔහු විසින් බලය පවරනලද නිලධාරියකු දන්වීම් පතක් භාරදුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහට වැඩි නුවූ අතිරේක දඩයක් ගැසීමෙන්ද දඬුවම් දියහැකි විය යුතුය.

11. හරක් ගාල් පිළිබඳ මේ උපනීතිමාලාවෙන් කවරක් වුවත් කඩ කිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයාවූ බලපත්‍රකාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමටද ඊට අතිරේක වශයෙන් වෙන දඬුවමක් දීමටද (සෑහෙන අධිකරණ බලය ලත්) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන මොනම අලාභයක් වත් අය කර ගැනීමට ඒ බලපත්‍රකාරයාට අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## XVI වැනි කාණ්ඩය

### පොදු මාර්කැට්වු පිළිබඳ උපනීති

1. මේ උපනීතිමාලාවේ "මාර්කැට්වු ප්‍රදේශය" යන්නෙන් අදහස් කරන්නේ පොදු මාර්කැට්වුවක වෙළෙද ප්‍රදේශය වශයෙන් නගර සභාව විසින් මෙයයි ප්‍රකාශ කරනලද ප්‍රදේශයයි.

2. මේ උපනීති යටතේ සභාපතිනු දුන් හෝ ඔහුගේ බලය යටතේ දුන් අවසර පත්‍රයක් හෝ ප්‍රවේශ පත්‍රයක් දරන්නකු හෝ ඔහුගේ (දරන්නාගේ) සේවකයකු හෝ නියෝජිතයකු වී ඒ අවසර පත්‍රයේ හෝ ප්‍රවේශ පත්‍රයේ කොන්දේසිවලට හා නියමයන්ට අනුකූල වුවහොත් මිස නැත්නම් කිසිවකු විසින් පොදු මාර්කැට්වුවේ කිසිම කඩයක් හෝ බංකුවක් හෝ බිමක් පාවිච්චි කිරීම හෝ වුත්ති විදීම නොකල යුතුය. එසේම ඒ සේවකයාගේ හෝ නියෝජිතයාගේ නම නගර සභා කාර්යාලයෙහි ලියාපදිංචිකර තිබෙනොත් මිස නැත්නම් ඔහු ඒ කිසිම කඩයක් හෝ බංකුවක් හෝ බිමක් පාවිච්චි කිරීම හෝ වුත්ති විදීම නොකල යුතුය.

3. (1) පොදු මාර්කැට්වුවේ කඩයක හෝ බංකුවක හෝ බිමක බද්ද මාසයකට නොඅඩු කාල පරිච්ඡේදයක් සඳහා වූ විට මෙහි පහත සඳහන් "අ" උපලේඛනයේ සඳහන් "අ" පෝරමයේ ප්‍රකාරයට අවසර පත්‍රයක් දිය යුතුය.

(2) පොදු මාර්කැට්වුවේ කඩයක් හෝ බංකුවක් හෝ බිමක් මාසයකට වඩා අඩු ඕනෑම කාලපරිච්ඡේදයකට පාවිච්චි කිරීමට හෝ වුත්ති විදීමට බලය දිය යුත්තේ මෙහි පහත සඳහන් "අ" උපලේඛනයේ "ආ" පෝරමයේ ප්‍රකාර දිනපතා දෙන්නාවූද දෙන කාලපරිච්ඡේදයට පමණක් වලංගුවන්නාවූද ප්‍රවේශ පත්‍රයකිනි.

4. අවසර පත්‍රයක් හෝ ප්‍රවේශ පත්‍රයක් දරණ තා විසිනුත් නගර සභාව ඒ සඳහා දවසකට හෝ මාසයකට හෝ මෙපමණය නියා නියම කරන රේතක් අනුව බද්දක් හෝ ගාස්තුවක් ගෙවිය යුතුය.

5. මාර්කැට්ටුවේ ස්ථාන පාවිච්චි කිරීම සඳහා ගෙවිය යුතු බදු හා ගාස්තු එකතුකිරීම පිණිස නගර සභාව නිලධාරියකු නොයොදවතොත්—

(අ) පුද්ගලික ගිවිසුමකින්, හෝ

(ආ) වෙන්ඩර් ඉල්ලීමෙන්, හෝ

(ඇ) ප්‍රසිද්ධ වෙන්දේසියේ දැමීමෙන්

අනුමත කරන ලද ඕනෑම කෙනෙකුට ඒ බදු හා ගාස්තු එකතුකිරීමේ අයිතිවාසිකම් බදුදීමට ඒ සභාවට බලය තිබේ.

6. (1) පොදු මාර්කැට්ටුවේ එක් එක් කඩය හෝ බංකුව හෝ බිම වෙනුවෙන් ගෙවිය යුතු බද්ද හෝ ගාස්තුව සභාපතිහට හෝ ඒ බද්ද හෝ ගාස්තුව එකතු කිරීමට නගර සභාව විසින් පත්කරන ලද නිලධාරියාට හෝ බදුකාරයාට හෝ සභාපතිතුමාගෙන් ලියවිල්ලකින් අනුමතිය ලබාගෙන බදුකාරයා විසින් පත්කරන ලද කෙනෙකුට මෙහි පහත පෙනෙන කාලයේදී ගෙවිය යුතුය.

(2) එකී බද්ද හෝ ගාස්තුව වූකලී—

(අ) අවසර පත්‍රයක් දෙන විට ඒ දෙන වේලාවේදීම හෝ ඒ අවසර පත්‍රය යම් කාලපරිච්ඡේදයක් වෙනුවෙන් දෙනොත් එයි එක් එක් මාසයේ මුල දිනයේදී මාස් පතා හොවද් වශයෙන්ද,

(ආ) අවසර පත්‍රයක් දෙන විට එය දෙන වේලාවේදීමද

ගෙවිය යුතුය.

එසේවුව වුවත්, අවසර පත්‍රයක් දරණ ඕනෑම කෙනෙකුට සෑහෙන හේතුවක් පිට බද්දක් ගෙවීම සඳහා සතියකට නොවැඩි කාලයක් දිය හැකිය. ඒ අවසර පත්‍රය දරන්නා ඒ කාලය ඉකුත්වූ පසු ඒ බද්ද ඉල්ලූ විටක ගෙවීමට යටත් විය යුතුය. එසේ යටත් විය යුත්තේ අවසර පත්‍රයට ඇතුළත් කාලපරිච්ඡේදයේ බද්දක් හිඟයිට එක් එක් දිනය වෙනුවෙන් ශත දහය බැගින් අතිරේක බද්දක් ගෙවීමටය.

7. (1) අවසර පත්‍රයක් හෝ ප්‍රවේශ පත්‍රයක් දරණ කිසිවකු විසින් සභාපතිතු අවසර දී එවූ ලිපුමක් නැතිව—

(අ) ඒ අවසර පත්‍රය හෝ ප්‍රවේශ පත්‍රය අන් කිසිවකුට පැවරීම, හෝ

(ආ) තමාට දෙන ලද කඩයේ හෝ බංකුවේ හෝ බිමේ කිසිම කොටසක් වෙන කෙනෙකුට නැවත බදුදීම, හෝ

(ඇ) තමාට දෙන ලද කඩයේ හෝ බංකුවේ හෝ බිමේ කිසිම කොටසක් නගර සභා කායසිලයේ නම ලියාපදිංචි කරන ලද තමාගේ සේවකයකුට හෝ නියෝජිතයකුට හැර අන් කිසිවකුට පාවිච්චි කිරීමට හෝ බුත්තිවිඳීමට ඉඩ දීම,

නොකළ යුතුය.

(2) වෙන කෙනෙකු පවරා දුන් න්‍යාය හෝ නැවත බදු දුන් න්‍යාය යන නීම පිට සභාපතිතුමාගෙන් ලිඛිත අවසරය ලබා නොගෙන කිසිවකු විසින් පොදු මාර්කැට්ටුවක කිසියම් කඩයක් හෝ බංකුවක් හෝ බිමක් හෝ ඒ කඩයක හෝ බංකුවක හෝ බිමක කිසිම කොටසක් පාවිච්චි කිරීම හෝ බුත්තිවිඳීම නොකළ යුතුය.

8. මාසයකට වැඩි ඕනෑම කාලපරිච්ඡේදයක් සඳහා අවසර පත්‍රයක් දරණ ඕනෑම කෙනෙකු තම බද්ද අවසන් කිරීමට තමා අදහස් කරන බව සභාපතිතු වෙත මාසයකට කලින් දන්විය යුතුය; නැතහොත් මාසයක ගාස්තුව ගෙවිය යුතුය.

9. අවසර පත්‍රයක් දරණ තා විසිනුත්—

(අ) ආහාර ද්‍රව්‍ය හෝ බීම වශී තබන හෝ විකිණීම පිණිස ඉදිරිපත් කර තබන හැම බංකුවක්ම හෝ රාක්කයක්ම හෝ කවුන්ටරයක්ම හෝ මේසයක්ම දිනපතා හොඳින් ශුද්ධපවිත්‍ර කිරීම වත් මස් හෝ මාලු තබන හෝ විකිණීම පිණිස ඉදිරිපත් කර තබන හැම ලෑල්ලක්ම දිනපතා හොඳට සූරා සේදීමටත්,

(ආ) තමා බුත්තිවිඳින කඩය හෝ බිම හා ඒ කඩයට හෝ බිමට එන පාර වැට් ඇති ගිස් බිම හෝ කඩයට හෝ බිමට ඇතුළුවන දොරටුව දිනපතා අතුගෑමට හෝ අතුගෑවීමටත්,

(ඇ) හොඳින් හේත්තුවී පියවෙන මූඩියක් ඇත්තාවූද මැස්සන් නොවැද්ද හැකිවූද භාජනයක් තමාගේ කඩය හෝ බිම ලඟ තබාගෙන අතුගා ඉත දමන සියලු කුණුරොඩු, කැලිකසල ආදිය ඒ භාජනයට දැමීමටත්,

සැලැස්විය යුතුය.

10. අවසර පත්‍රයක් හෝ ප්‍රවේශ පත්‍රයක් දරන කිසිවකු විසින්—

(අ) පොදු මාර්කැට්ටුවකට එන කිසිම කෙනෙකු කිසියම් අපහාසයකට හෝ යිරිහැරයකට හෝ කෝපයකට හෝ ප්‍රමාදයකට භාජනය කිරීම, නැතහොත්

(ආ) තමා යම් වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ වම් රෝගයකින් පෙළෙමින් සිටියදී ඒ කඩයේ හෝ බංකුවේ හෝ බිමේ සිටීම හෝ එයි මොනම වෙළඳාමකට වත් සහභාගිවීම නැතහොත් ඒ රෝගයකින් පෙළෙන්නාවූ කිසිම කෙනෙකු ඒ කඩයේ හෝ බංකුවේ හෝ බිමේ සිටවීම හෝ ඒ තැනැත්තාට එයි මොනම වෙළඳාමකට වත් සහභාගිවීමට ඉඩ දීම, නැතහොත්

(ඇ) සභාපතිතුමාගෙන් ලබාගත් ලිඛිත අවසරයක් නැතිව ඒ කඩයේ හෝ බංකුවේ හෝ බිමේ කිසියම් කොටසක් කොටුකිරීම හෝ එහි තාවකාලිකව හෝ ස්ථිරව පවතින ලෙසට යම් ආවරණයක් හෝ පැලැල්ලක් සෑදීම, නැතහොත්

(ඈ) නගර සභාවේ දේපලක් වූවූ යම් පෙට්ටියක් හෝ මේසයක් හෝ පුටුවක් හෝ එබඳු වෙන ලිබඩුවක් තමාගේ කඩය හෝ බංකුව හෝ බිම ඇතුළට ගෙනවීම හෝ එයි තබාගැනීම නැතහොත් සභාපතිතුමාගෙන් ලිඛිත අවසරයක් ලබා නොගෙන ඒ කඩයේ හෝ බංකුවේ හෝ බිමේ කිසිම රාක්කයක් හෝ වෙන යම් දෙයක් සවිකිරීම, නැතහොත්

(ඉ) තමාගේ අවසර පත්‍රයේ හෝ ප්‍රවේශ පත්‍රයේ සඳහන් වූවූ හෝ නගර සභාව විසින් කකනම් කරන ලද්දවූ හෝ අපද්‍රව්‍ය වූ හෝ කොයිම් විධියකින් වත් මහාජන සෞඛ්‍යයට අන්තරායදායකවූ කිසිම බඩුවක් තමාගේ කඩයේ හෝ බංකුවේ හෝ බිමේ වෙළඳාමට තැබීම හෝ ඉදිරිපත් කර තැබීම, නැතහොත්

(ඊ) මාලු කටු හෝ මාලු වරල් හෝ මාලු කොර හෝ කුණු රොඩු හෝ කැලිකසල මාර්කැට්ටුවට අයිති ස්ථානයේ කිසිම තැනකට හෝ කානුවකට විසිකිරීම, නැතහොත්

(උ) මාර්කැට්ටුවට අයිති භූමිභාගයේ කිසිම තැනක මොනම පහෙතු ගේ වත් ගම හෝ වරල් වියලීම හෝ සකස් කිරීම, නැතහොත්

(ඌ) මාර්කැට්ටුවට අයිති ස්ථානයෙහි කිසිම තැනක මාලු වියලීම හෝ ලුණු දැමීම හෝ අයිස් දැමීම,

නොකළ යුතුය.

11. කිසිවකු විසින් පොදු මාර්කැට්ටුව ඇතුළත හෝ පොදු මාර්කැට්ටුවට අයිති භූමිභාගය ඇතුළත—

(අ) ආහාර පිසීම, හෝ

(ආ) බීමත්කමින් හෝ නොමනා අන්දමින් හැසිරීම හෝ මොනම අන්දමේ ඝෝෂාවක් හෝ කලබලයක් කිරීම හෝ වෙන කෙනෙකු සමග දබර කිරීම හෝ අපහාස වචන හෝ අශිෂ්ට වචන හෝ අසභ්‍ය වචන පාවිච්චි කිරීම, හෝ

(ඇ) හිඟමන් ඉල්ලීම, හෝ

(ඈ) තමා ගැන පිළිගත හැකි විස්තරක් කියන්ට නැතිව ඔබ මොබ හැසිරීම හෝ මාර්කැට්ටු පාලකයා හෝ නගර සභාවේ නිලධාරියකු හෝ ගම්මුලාදෑනියා හෝ පොලිස් කොස්තාපල් කෙනෙකු හෝ සභාපතිතුමාගේ නීත්‍යනුකූල ආඥාවක් යටතේ ක්‍රියාකරන කිසිවකු ඉවත්වී යැමට තමාට නියම කළ පසු නැවතී සිටීම,

නොකළ යුතුය.

12. කිසිවකු විසින්—

(අ) මාර්කැට්ටු ගොඩනැගිල්ලේ කිසිම කොටසක් හෝ පොදු මාර්කැට්ටුවක් ඇතුළත හෝ එයි අවට තිබෙන්නාවූද නගර සභාවට අයිතිවූද ලිබඩු හෝ ලාම්පු හෝ වෙන දේපල පලුදු කිරීම හෝ විරූප කිරීම, හෝ

(ආ) පොදු මාර්කැට්ටුවේ ප්‍රයෝජනය සඳහා සපයා ඇති වතුර අපිරිසිදු කිරීම හෝ නරක් කිරීම හෝ අපතේ යැවීම හෝ ඒ වතුරෙන් තමාගේ ශරීරය හෝ කිසිම සතකු හෝ ඇඳුම් හෝ බඩු සේදීම, හෝ

(ඇ) මාර්කැට්ටුවට අයිති භූමිභාගය ඇතුළට කිසිම බල්ලකු හෝ රථවාහනයක් ගෙනීම,

නොකළ යුතුය.

13. (1) පොදු මාර්කැට්ටුවක කඩයක් හෝ බිමක් හෝ බංකුවක් බුත්තිවිඳීම සඳහා ගෙවිය යුතු බදු හෝ ගාස්තු පිළිබඳ ලැයිස්තුවක් සභාපතිතු විසින් ඒ මාර්කැට්ටුවේ කාටත් පෙනෙන තැනක එල්ලා තැබීමට සැලැස්විය යුතුය.

(2) මාර්කැට්ටු පාලකයා විසින් හෝ බදුකාරයා විසින් හෝ බදු හෝ ගාස්තු අයකිරීම පිණිස බදුකාරයා විසින් පත්කළ කිසිවකු විසින්—

(අ) යථෝක්ත ලැයිස්තුවෙහි බද්ද හෝ ගාස්තුව වශයෙන් සඳහන් මුදලට වඩා වැඩි මුදලක් ඉල්ලීම හෝ ගැනීම, හෝ

(ආ) තමා කෙරෙහි පවරා තිබෙන්නාවූ හෝ තමාට දී තිබෙන්නාවූ යම් බලයක් ක්‍රියාවේ යෙදීමක් හෝ රාජකාරියක් කිරීම වශයෙන් අගවා කිසිවකු සම්බන්ධයෙන් නුසුදුසු ලෙසින් ක්‍රියා කිරීම හෝ කිසිවකු කරදරයකට භාජන කිරීම,

නොකළ යුතුය.

14. ඕනෑම බද්දක් හෝ ගාස්තුවක් පිළිබඳ ඕනෑම ආරාවුලක් ගැන පෝදිඩිසර බලා සුන්තිසගහනයයි තමාට පෙනීයන ආඥාවක් කිරීමට සභාපතිහට බලය තිබිය යුතුය.

15. (1) සභාපතිහට හෝ ඔහු විසින් විධිවූ පරිදි බලය පවරන ලද වෙන ඕනෑම නිලධාරියකුට පොදු මාර්කැට්ටුවක් පරීක්ෂා කිරීමටත් එයි ඕනෑම කඩයක් හෝ [illegible] හෝ බිමක් පාවිච්චි කරන හෝ බුත්ති විඳින ඕනෑම කෙනෙකුගේ අවසර පත්‍රය හෝ ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කිරීමට දෙන ලෙස නියම කිරීමටත් බලය තිබිය යුතුය.

CamScanner

(2) සභාපතිතුමා හෝ ඔහු විසින් විධිවූ පරිදි බලය පවරනලද වෙනත් ඕනෑම නිලධාරියකු ඒ අවසර පත්‍රය හෝ ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කිරීමට දෙන ලෙස කියා සිටි වහාම ඒ අවසර පත්‍රය හෝ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත්කිරීම එය දරන ඕනෑම කෙනෙකුගේ යුතුකම විය යුතුය.

## පුද්ගලික මාර්කැට්වු හා බලය ලත් වෙන ස්ථාන

16. (1) කොයි පොදු මාර්කැට්වුවක වත් වෙළෙඳ ප්‍රදේශය ඇතුළත කිසිවකු විසින් ඒ මාර්කැට්වුව හැර වෙන මොනම ස්ථානයක වත් තබාගෙන කිසිම මසක් හෝ කුකුළු, තාරා ගණයට අයිති සතකු හෝ මාලු වර්ගයක් හෝ පලතුරක් හෝ එළවළුවක් නොවිකිණිය යුතුය; නැතහොත් විකිණීමට ඉදිරිපත් නොකළ යුතුය.

එසේවුවද මේ උපනීතියේ ඉහත සඳහන් විධිවිධාන—

(අ) වෙළඳාම් කිරීම පිණිස නියම ස්ථානයක් නැත්තාවූ හෝ මහ පාරේ හෝ සෙසු පොදු ස්ථානවල තබාගෙන වෙළෙඳාම් නො කොට තැනින් තැන ගොස් වෙළෙඳාම් කරන්නාවූ වෙළෙඳුන් කරන කුකුළු, තාරා ගණයේ සතුන් විකිණීම හෝ පලතුරු විකිණීම හෝ එළවළු විකිණීම, නැතහොත්

(ඉ) බලපත්‍රයක් ඇත්තාවූද තැනින් තැන ගොස් වෙළෙඳාම කරන්නාවූද වෙළෙඳුන් මාර්කැට්වු ප්‍රදේශය ඇතුළත කරන මාලු විකිණීම, නැතහොත්

(උ) බත් කඩයක හෝ තේ, කෝපි කඩයක බලපත්‍රකාරයා වෙනුව අයට ඒ ස්ථානයේදීම අනුභව කිරීම සඳහා කරන පලතුරු විකිණීම, නැතහොත්

(එ) කවරකු විසින් වුවත් කරන කුරුම්බා විකිණීම, නැතහොත්

(ඔ) පොදු මාර්කැට්වුව හැර වෙන ඕනෑම ස්ථානයකදී කරන ඌරු මස් විකිණීම හෝ පලතුරු විකිණීම හෝ එළවළු විකිණීම සම්බන්ධයෙන් අදාළ නොවිය යුතුය.

මේ ඡේදයේ "බලපත්‍රයක් ලත් ස්ථානය" යන්නෙන් අදහස් කරන්නේ සභාපතිතුමා විසින් දෙන ලද බලපත්‍රයකින් බලය පවරන ලද ඕනෑම ස්ථානයකි.

(2) (1) (ඔ) වැනි ඡේදයේ සඳහන් හැම බලපත්‍රයක්ම—

(අ) මෙහි සඳහන් "ඉ" උපලේඛනයේ සඳහන් පෝරමයේ ප්‍රකාරයට විය යුතුය.

(ඉ) එසේම බලපත්‍රයේ දක්වන පරිදි මාස එකකට වඩා අඩු නොවන්නාවූද මාස දොළහකට වඩා වැඩි නොවන්නාවූද කාලපරිච්ඡේදයකට වලංගුවිය යුතුය.

(3) නගර සභාව නියම කරන ගාස්තුවක් ගෙවන තුරු (1) (ඔ) වැනි ඡේදය යටතේ බලපත්‍රයක් නොදිය යුතුය.

(4) හැම බලපත්‍රකාරයාම විසින් තමාගේ නම හා තම වෙළෙඳ අතවැසියන්ගේ නම් නගරසභා කාර්යාලයේ ලියාපදිංචි කරනැබිය යුතුය.

(5) නගරසභා කාර්යාලයේ නම ලියාපදිංචි නොකළ කිසිම වෙළෙඳ අතවැසියකු බලය ලත් කිසිම ස්ථානයක කිසිම වෙළෙඳාමකට සහභාගි නොවිය යුතුය.

17. සභාපතිතුමා විසින් දෙනලද බලපත්‍රක් ඇතොත් මිස නැත්නම් කිසිවකු විසින් වෙළෙඳ ප්‍රදේශය ඇතුළත තැනින් තැන ගොස් මස් හෝ මාලු නොවිකිණිය යුතුය. කිසිම වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් පෙළෙන කෙනෙකුට ඒ බලපත්‍රයක් නොදිය යුතුය.

## සාමාන්‍ය

18. පොදු වධ්‍යශාලාවක නොමරණ ලද කිසිම සතෙකුගේ මළකුණක් හෝ මසක් නගර සභා පාලන ප්‍රදේශ සීමාව ඇතුළත වූ කිසිම පොදු මාර්කැට්වුවකට හෝ පුද්ගලික මාර්කැට්වුවකට හෝ වෙන ස්ථානයකට ගෙනඒම හෝ විකිණීම පිණිස එහි තැබීම හෝ එහිදී විකිණීම නොකළ යුතුය.

එහෙත් පිටරටින් මෙරටට ගෙනෙන ලද්දවූද ශීත කරන ලද්දවූද මස් හෝ දඩ මස් විකිණීම සම්බන්ධයෙන් මේ උපනීතිය අදාළ නොවේ.

19. (1) පොදු මාර්කැට්වුවේ කඩයක් සම්බන්ධයෙන් අවසර පත්‍රයක් දරණ කෙනෙක් යුතුකම විය යුත්තේ මහජනයාට වුවමනාවන බඩුවක් ගැනීම සඳහා ඒ කඩය පෙරවරු 6 සිට පස්වරු 9 දක්වා ඇරලා තැබීමය.

(2) ඒ අවසර පත්‍රයක් දරණ කවරකු වත් විසින් සභාපතිතුමාගෙන් ලිඛිත අවසරයක් ලබා නොගෙන මහජනයාට බඩු විකිණීම පැහැර හැරීම හෝ ප්‍රතික්ෂේප කිරීම ඕනෑකමින්ම නොකළ යුතුය.

20. (1) මේ උපනීතිවලින් කවරක් වුවත් කඩකිරීම ගැන අවසර පත්‍රය දරන්නා දෙවැනි වරට හෝ ඊට පසුව (සෑහෙන අධිකරණ බලය ඇති) උසාවියකින් වරදකාරයා කරනු ලැබූ විට මේ උපනීති යටතේ නිකුත් කරනලද ඕනෑම අවසර පත්‍රයක් අවලංගු කිරීමට ඒ උසාවියට බලය තිබිය යුතුය.

(2) සභාපතිතුමා—

(අ) අවසර පත්‍රය අවලංගු කරනු ලැබුවාවූ හෝ මේ උපනීතිවලින් කවරක් වුවත් කඩකිරීම ගැන වරදකාරයා කරනු ලැබුවාවූ කිසිවකුට අලුත් අවසර පත්‍රයක් දීමට, හෝ

(ඉ) මේ උපනීතිවලින් කවරක් වුවත් කඩකිරීම ගැන වරදකාරයා කරනු ලැබුවාවූ කිසිවකුට අලුත් ප්‍රවේශ පත්‍රයක් දීමට

බැරිය කීමට බලය ඇත්තේය.

21. සභාපතිට හෝ ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන නගර සභාවේ ඕනෑම නිලධාරියකුට ඕනෑම මාර්කැට්වුවක් පරීක්ෂා කොට එහි වෙළඳාම පිණිස ඉදිරිපත්කර තිබෙන්නාවූ හෝ තබා තිබෙන්නාවූ ඕනෑම ආහාර ද්‍රව්‍යයක් අපථ්‍යයයි හැඟීගියොත් ඒ ආහාර ද්‍රව්‍යය අල්ලා තහනම් භාරගෙන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමා වෙත ගෙනයෑමට බලය තිබිය යුතුය. එසේ අල්ලා තහනම් කරන ලද ඕනෑම ආහාර ද්‍රව්‍යයක් අපථ්‍යයයි ඒ වෛද්‍ය නිලධාරිතුමා සහතික කළොත් එය යමෙකුගෙන් අල්ලාගන්නා ලද්දේ නම් ඔහුට කිසිම වන්දි මුදලක් නොගෙවා ඒ ද්‍රව්‍ය විනාශ කරදැමිය හැකිය.

22. කිසිම මාර්කැට්වු පාලකයකුට හෝ මාර්කැට්වුව පාලනය කිරීම පිණිස හෝ එහි බදු හෝ ගාස්තු එකතු කිරීම පිණිස නගර සභාව විසින් පත්කළ කිසිම නිලධාරියකුට හෝ පුද්ගලයකුට රාජකාරිය කිරීමේදී කිසිවකු විසින් විරුද්ධකමක් හෝ බාධාවක් හෝ කරදරයක් හෝ පීඩාවක් නොකළ යුතුය.

23. මේ උපනීතිවලින් කවරක් වුවත් කඩකරන හැම ප්‍රස්තාවයකදීම රුපියල් පනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩකිරීම ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීම ගැන සිහිපත් කරවා සභාපතිතුමා දැන්වීම් පතක් යැවූ පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එලෙස් කඩකරගෙන යන එක් එක් දවසකට රුපියල් දහයකට වැඩි අතිරේක දඩක් ගැසීමෙන්ද දඬුවම් දියහැකි විය යුතුය.

## "අ" උපලේඛනය

### "අ" පෝරමය

3 (1) වැනි උපනීතිය

ගෙවූ ගාස්තුව: රුපියල්———.

මෙහි පිටපැත්තේ සඳහන් කොන්දේසිවලට යටත් කොට——— වැනි දිනයෙන් අවසන්වන මාසය/මාස———ක්වූ කාලපරිච්ඡේදයේදී———මාර්කැට්වුවේ———වෙළඳාම් කිරීම සඳහා අංක———දරණ කඩය/බිම බුක්තියවිඳීමට———පදිංචි———ට මෙයින් අවසර දෙමි.

———,
නගර සභාවේ සභාපති.

#### පෝරමය පිටපැත්තේ සඳහන් කොන්දේසි

(1) පුරතල් සතුන් හා කුරුල්ලන් කඩයට/බිමට ගෙනඒම හෝ එහි තබාගැනීම නොකළ යුතුය.

(2) රාත්‍රී 9 යෙන් පසු කඩයේ/බිමේ ගිනි ගොඩවල් හෝ පහන් නොදැල්විය යුතුය.

(3) රාත්‍රී 9 යෙන් පසු කිසිවකු කඩයේ හෝ බිමේ නැවතී නොසිටිය යුතුය.

(4) ඕනෑම දවසක රාත්‍රී 9ත් උදේ 6ත් අතර කාලය ඇතුළත කඩයේ/බිමේ තබා තිබෙන කිසිම බඩුවක් ගැන (මේ අවසර පත්‍රය දරන්නාට) වගකියනු නොලැබේ.

(5) මේ කොන්දේසි කඩකළොත් මේ උපනීති යටතේ දෙන වෙන ඕනෑම දඬුවමක් පමණක් නොව, මේ අවසර පත්‍රය දරන්නාගේ බද්ද වහාම අවසන්වීමට පුළුවන්කමද තිබිය යුතුය.

### "ඉ" පෝරමය

3 (2) වැනි උපනීතිය

බුක්තිවිඳීම පිළිබඳ ප්‍රවේශ පත්‍රය

ගෙවූ ගාස්තුව: රුපියල්———.

මෙහි පිටපැත්තේ සඳහන් කොන්දේසිවලට යටත්කොට 195———මාසයේ———වැනි දින පෙරවරු 6යේ සිට රාත්‍රී 9 දක්වා අතර කාලය තුළ———මාර්කැට්වුවේ———වෙළඳාම පිණිස අංක———දරණ කඩබන්කිය/බිම බුක්තිවිඳීමට———පදිංචි———ට මෙයින් අවසර දෙමි.

———,
සභාපතිතුමාගේ අණ පරිදි.

———,
ප්‍රවේශ පත්‍රය නිකුත්කරන තැනැත්තාගේ

CamScanner

පෝරමය පිටුපැත්තේ සඳහන් කොන්දේසි

(1) පුරහල් සතුන් හෝ කුරුල්ලන් කඩයට/බිමට ගෙනඊම හෝ එහි තබාගැනීම නොකළ යුතුය.

(2) රාත්‍රී 9 යෙන් පසු කඩයේ/බිමේ ගිනිගොඩවල් හෝ පහන් නොදල්විය යුතුය.

(3) රාත්‍රී 9 යෙන් පසු කිසිවකු කඩයේ/බිමේ නැවතී නොසිටිය යුතුය.

(4) ඕනෑම දවසක රාත්‍රී 9ත් උදේ 6ත් අතර කාලය ඇතුළත කඩයේ/බිමේ තබා තිබෙන කිසිම බඩුවක් ගැන (මේ අවසර පත්‍රය දරන්නාට) වගකියනු නොලැබේ.

(5) මේ කොන්දේසි කඩකළොත් මෙ උපනීති යටතේ දෙන වෙන ඕනෑම් දඬුවමක් පමණක් නොව, මේ අවසර දරන්නාගේ බද්ද වනාම අවසන්වීමට පුළුවන්කමද තිබිය යුතුය.

"ඉ" උපලේඛනය

16 වැනි උපනීතිය

බලපත්‍ර පෝරමය

ගෙවූ ගාස්තුව—රුපියල් :———.

———නගර සභාවේ සභාපති ධුරන්දර———වන මම, වපිපණම් අංක——දරණ. ස්ථානයෙහි———විකිණීමට———ට හෝ ඔහුගේ (ලියාපදිංචි කරනලද) වෙළෙඳ අතවැසියන්ට මේ බලපත්‍රයෙන් බලය දෙමි.

——— දිනය තෙක් මේ බලපත්‍රය වලංගුව පැවතිය යුතුය.

———,
නගර සභාවේ සභාපති.

XVII වැනි කාණ්ඩය

පුස්තකාලයන් පිළිබඳ උපනීති

1. පද සම්බන්ධයෙන් වෙන තේරුමක් අවශ්‍ය වුවහොත් මිස නැත්නම් පුස්තකාලයන් පිළිබඳ මෙ උපනීතිවල "පුස්තකාලයාධිපති" යන්නෙන් අදහස් කරන්නේ පුස්තකාලය භාරව සිටීම පිණිස නගර සභාව විසින් පත්කළ තැනැත්තාය. එයේම ඔහුගේ සහකාරයෝද එයින් අදහස් කරනු ලැබෙත්.

2. නගර සභාව විසින් පිහිටුවාගෙන පවත්වන පොදු පුස්තකාලය—

(අ) පොත්පත් බැහැරට දෙන පුස්තකාලයකින්ද,

(ඉ) ආශ්‍රය පුස්තකාලයකින්ද,

(උ) කියවීම් ශාලාවකින්ද,

සමන්විත විය යුතුය.

3. (1) පොදු පුස්තකාලයේ පරිපාලනය හා සාමාන්‍ය පාලනය වූකලි මින් පසු "කාරක සභාවය" යි ව්‍යවහාර වන්නාවූද—

(අ) නගර සභාවේ තත්කාල සභාපති තැන,

(ඉ) නගර සභාව විසින් තෝරා පත්කරන තිදෙනකුට වැඩි නුවූ ඒ සභාවේ සාමාජිකයෝ,

(උ) නගර සභාවේ රැස්වීමකදී ඒ සභාව විසින් තෝරා පත්කරගනු ලබන්නාවූද නගර සභා ප්‍රදේශය තුළ පදිංචිවූවන් අතර ප්‍රමුඛත්වයක් දරන්නාවූද පස් දෙනෙක් යන මොවුන්ගෙන් යුක්තවූද පුස්තකාලයීය කාරක සභාවක් කෙරෙහි පවරා තැබිය යුතුය.

(2) පොදු පුස්තකාලය භාරයේ සිටීමට පුස්තකාලයාධිපතියකු පත්කිරීමට නගර සභාවට බලය ඇත්තේය. එසේ පත්වන ඒ පුස්තකාලයාධිපති තැන ඒ පුස්තකාලය ඇතුළත සංවරය ආරක්‍ෂා කර ගැනීමට බැඳී සිටිය යුතුය.

4. (1) නගර සභාවේ සභාපතිතුමා ස්ථානාන්තර හේතුවෙන් ඒ කාරක සභාවේ සභාපතිතුමා විය යුතුවා පමණක් නොව, කාරක සභාවේ හැම රැස්වීමකම මූලාසනය දැරිය යුතුය. යම් සභා රැස්වීමකට සභාපතිතුමා නාවොත්, ඇවිත් සිටින සෙසු සාමාජිකයන් විසින් මූලාසනයට තෝරා ගන්නා සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතුය.

(2) යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් දෙපක්‍ෂයෙන් දෙනලද ඡන්ද ගණන සමාන වුවහොත් ඕනෑම සභා රැස්වීමක මූලාසනය දරණ සාමාජිකයා විසින් තමාගේ ඡන්දයත් සභාපති වශයෙන් තමාට හිමි ඡන්දයත් දිය යුතුය.

5. සාමාජිකයන් පස්දෙනෙකුගෙන් යුත් ගණපූරණයක් නොමැති (කාරක සභාවේ) මොනම් රැස්වීමකදී වත් කිසිම කටයුත්තක් නොකළ යුතුය.

6. අවශ්‍යයයි හැඟී යනායම් යම් කොන්දේසිවලට යටත් පොදු පුස්තකාලය ස්ථානයේ ඕනෑම කොටසක් පාවිච්චිකිරීමට ඕනෑම කෙනෙකුට අවසර දීමට හෝ ඒ තැනැත්තා පුස්තකාලයයන් පිළිබඳ මේ උපනීතිවලින් යමක් කඩකර ඇතොත්, ඔහුට ඒ ස්ථානයේ මොනම කොටසක් වත් පාවිච්චිකිරීමට අවසර දෙන්ට බැරිය කීමට කාරක සභාවට බලය තිබිය යුතුය.

පොත්පත් බැහැරට දෙන පුස්තකාලය

7. (1) කිසිවකු—

(අ) වයස අවුරුදු 11 කට වඩා අඩු නොවීම,

(ඉ) අකුරු කියවීමට හා ලිවීමට හැකිවීම,

(උ) නගරසභා ප්‍රදේශය ඇතුළත පදිංචිකාරයකු වීම හෝ, එහි තමාගේ ව්‍යාපාරස්ථානයක් තිබීම හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබීම,

(එ) රුපියල් පහක මුදලක් පුස්තකාලයාධිපති තැන වෙත තැන්පත් කිරීම,

(ඔ) රුපියල් විසිපහකට නොඅඩු මාසික කුලියක් ගෙවනු ලබන පදිංචිකාරයකු හෝ අයිතිකාරයකු විසින් නිර්දේශ කරනු ලැබීම,

යන මෙ සුදුසුකම්වලින් යුක්තව සිටිනොත් මිස නැත් නම් (පොත්පත් බැහැරට දෙන) පුස්තකාලයකු සාමාජිකයකු වශයෙන් ඇතුළත් නොකළ යුතුය.

(2) පොත්පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයකු වශයෙන් ඇතුළත්වීමට කැමති කා විසිනුත් ඒ සඳහා පුස්තකාලයාධිපති තැනගෙන් පෝරමයක් ලබාගෙන අයදුම් පත ලියා පහත නම් සඳහන් භවතකු, එනම්—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, හෝ

(ඉ) නගර සභාවේ සාමාජිකයකු, හෝ

(උ) කාරක සභාවේ සාමාජිකයකු, හෝ

(එ) ශාස්ත්‍රය වහන්සේ නමක් හෝ ආගමික පූජකවරයකු, හෝ

(ඔ) වෛද්‍ය වෘත්තියෙහි හෝ නීතිඥ වෘත්තියෙහි යෙදී සිටින්නකු, හෝ

(ක) සමාදාන විනිශ්චයකාරයකු, හෝ

(ග) වාර්ෂික සිවිල් ලැයිස්තුවේ නම සඳහන් ආණ්ඩුවේ සේවකයකු,

(ජ) ද්විතීයික පාඨශාලාවක ප්‍රධානයකු, හෝ

(ට) රුපියල් එක්දහස් පන්සියයකට නොඅඩු වාර්ෂික පඩියක් ලබන නගර සභාවේ සේවකයකු

ලවා ස්ථිර කරවාගත යුතුය.

(3) ඉල්ලුම් පත්‍රයක් ස්ථිර කිරීමට මීට ඉහළින් ඡේදය යටතේ අයිතිවාසිකමක් තිබෙන කෙනෙකුට තමාගේ ඉල්ලුම් පත්‍රය ස්ථිර කරවා ගැනීම අවශ්‍ය නොවිය යුතුය.

8. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයකු වශයෙන් ඇතුළත් කරගන්නා හැම පුද්ගලයකුටම පුස්තකාලයාධිපතිතුමා විසින් ප්‍රවේශ පත්‍ර දෙකක් දිය යුතුය. ඒ තැනැත්තාට ඒ එක් එක් ප්‍රවේශ පත්‍රය පිට පොතක් බැගින් ලබාගෙන බැහැරට ගෙනයෑමට පුළුවන් කම තිබිය යුතුය.

9. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයකු විසින් තමාට ලැබී තිබෙන ප්‍රවේශ පත්‍රයක් පිට ඒ පුස්තකාලයෙන් බැහැරට ගෙනයන ඕනෑම පොතක් ගැන වගකිය යුතුය.

10. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයකුට 8 වැනි උපනීතිය යටතේ දෙනලද ප්‍රවේශ පත්‍රයක් නැතිවූ විට ඒ බව ඒ සාමාජිකයා විසින් පුස්තකාලයාධිපතිහට වහාම දන්විය යුතුය. ඒ පුස්තකාලයෙන් ඒ ප්‍රවේශ පත්‍රය පිට පොතක් ගෙන ගොස් නැති බැව් පුස්තකාලයාධිපතිහට ඒත්තුගියොත් ඒ සාමාජිකයාට ප්‍රවේශ පත්‍රයේ දෙවැනි පිටපතක් දීමට ඔහුට බලය ඇත්තේය. එහෙත්, ඒ ප්‍රවේශ පත්‍රය නැතිවූ බව තමාට දන්වූ දිනයේ සිට යටත්පිරිසෙයින් තිස් දවසක් වත් පසුවී ඇතොත් මිස නැත්නම් පුස්තකාලයාධිපතිතුමා විසින් ප්‍රවේශ පත්‍රයේ දෙවැනි පිටපතක් නොදිය යුතුය.

11. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් සාමාජිකයකු ඉල්ලා ගෙන ගිය ඕනෑම පොතක්, ඉල්ලාගත් දිනයේ පටන් දහහතර දවසක කාලපරිච්ඡේදයක් ඇතුළතදී පුස්තකාලයාධිපතිහට ආපසු බාරදිය යුතුය. වෙන සාමාජිකයකුට ඒ පොත වුවමනා නොවේ නම් තව දවස් දහහතරක කාලපරිච්ඡේදයකට ඒ පොත ඉල්ලා ගැනීමට ඒ සාමාජිකයාට ඉඩ දෙන්ට පුස්තකාලයාධිපතිහට පුළුවන් කම තිබිය.

12. 11 වැනි උපනීතියේ කී දහහතර දවස ඇතුළත පුස්තකාලයාධිපතිහට පොතක් ආපසු බාරදීම සාමාජිකයකු පැහැර හැරිය විට ඒ පොත බාරදීමට ප්‍රමාදවන එක් එක් දවසට ශත දහය බැගින් වූ දඩයකට ඔහු යටත් විය යුතුය.

CamScanner

13. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් ඉල්ලාගෙන ගිය
කවර පොතක් වුවත් 11 වැනි උපනීතියේ කී දහහතර දවසේ කාල
පරිච්ඡේදය ඉකුත්වී තිස් දවසක් ඇතුළත සාමාජිකයකු ආපසු බාර
නුදුන්නොත් ඒ පොත නැතිවූවා කොට සැලකිය යුතුය.

14. සාමාජිකයකු ඉල්ලාගෙන ගිය පොතක් නැතිවූ කල හෝ නැති
වූවා කොට සැලකූ කල ඒ සාමාජිකයා ඒ වෙනුවට අලුත් පොතක්
සැපයීම සඳහා යන වියදම ගෙවීමට බැඳී සිටිය යුතුය.

15. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් ඉල්ලාගෙන ගිය
කිසිම පොතකට සාමාජිකයකු විසින් කිසිම අන්දමකින් පලුද්දක්
හෝ හානියක් නොකළ යුතුය.

16. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් ඉල්ලා ගෙන යෑමට
ඉදගය් කරන ඕනෑම පොතකට යම් පලුද්දක් හෝ හානියක් සිදුවී
තිබෙනොත් ඒ බව පුස්තකාලයාධිපතිහට දන්වීම හැම සාමාජික
යකුගේම යුතුකම විය යුතුය. ඒ පලුද්ද හෝ හානිය පුස්තකාලයාධි
පතිහට නොදන්වුව හොත් ඒ පොත කිසිම පලුද්දක් හෝ හානියක්
නැතිව ඔහුට දුන්නාකොට සැලකිය යුතුය.

17. සාමාජිකයකු ආපසු ගෙනැවිත් බාරදුන් පොතකට වෙන අයට
දීමට බැරි තරමට පලුදු හෝ හානි සිදුවී තිබේයයි පුස්තකාලයාධිපති
හට ඒත්තුගියොත් ඒ පොත වෙනුවට අලුත් පොතක් සැපයීමට යන
වියදම ගෙවීමට ඒ සාමාජිකයා බැඳී සිටිය යුතුය. ඒ පොත වෙනුවට
අලුත් පොතක් ලබාගත් විට, "පොදු පුස්තකාලයෙන් පලුදුවූ
පොතක් වශයෙන් විකුණන ලදී" යන මේ වචන ඇති මුද්‍රාව පිහිටුවා
පලුදුවූ ඒ පොත ඒ සාමාජිකයාට දිය යුතුය.

18. (1) පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් ඉල්ලාගත්
කිසිම පොතක් කිසිම සාමාජිකයකු විසින් වෙන කිසිවකුට නොදිය
යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදයේ විධිවිධාන කඩකරන කොයි
සාමාජිකයකුගේ වුවත් ආධාන මුදල (deposit) නගර සභාව
...න්තකු කළ යුතුවාත් හැර ඔහුගේ (පොත්පත් බැහැරට දෙන
පුස්තකාලයේ) සාමාජිකත්වයද අහෝසිවිය යුතුය.

19. (1) විසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන
රෝගයකින් පෙළෙන තැනැත්තකු පාවිච්චිකළ බව තමා දන්නා
කිසිම පොතක් සාමාජිකයකු විසින් (පොත්පත් බැහැරට දෙන)
පුස්තකාලයට ආපසු බාර නොදිය යුතුය.

(2) පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් සාමාජිකයකු
ඉල්ලාගත් පොතක් යම් විසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන්
බෝවෙන රෝගයකින් පෙළෙන කවරකු වුවත් පාවිච්චි කළොත් ඒ
පොත විනාශකර දැමිය යුතුය. ඒ පොත වෙනුවට අලුත් පොතක්
සැපයීමට යන වියදම පුස්තකාලයාධිපතිහට ඒ සාමාජිකයා විසින්
ගෙවිය යුතුය.

20. එකම පොත ඉල්ලා (පොත්පත් බැහැරට දෙන) පුස්තකාලයේ
සාමාජිකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනකු අතර විවාදයක්
ඇතිවූ කල පුස්තකාලයාධිපතිහු විසින් ඒ විවාදය විසඳිය යුතුය.

21. වෙන සාමාජිකයකු ඉල්ලාගෙන ගොස් ඇති පොතක් ඉල්ලා
...න්ට ඕනෑවී සිටින ඕනෑම සාමාජිකයකු තමාගේ නමත් ඒ පොතේ
...මත් (ඒ සඳහා තබා තිබෙන) ලේඛනයේ ලකුණු කළ යුතුය. ඒ
පොත ඉල්ලාගෙන ගිය සාමාජිකයා එය ආපසු ගෙනැවිත් බාරදුන්
... පුස්තකාලයාධිපතිහු ලේඛනයේ නම ලකුණු වී ඇති සාමාජිකයාට
... දිය යුතුය. එකම පොත ඉල්ලා ගැනීම සඳහා සාමාජිකයන්
දෙනකු හෝ ඊට වැඩි දෙනකු ලේඛනයේ නම් ලකුණු කර ඇති
... ලේඛනයේ නම් ලකුණු කර තිබෙන අනුපිළිවෙලට ඔවුන්ට එය
... යුතුය.

22. යම් සාමාජිකයකු නගරසභා ප්‍රදේශය ඇතුළත පදිංචිව සිටීම
... තමාගේ කාර්යාලයක් හෝ ව්‍යාපාරික ස්ථානයක් තබාගැනීම
...රකළ විට (පොත්පත් බැහැරට දෙන) පුස්තකාලය සම්බන්ධයෙන්
...ගේ සාමාජිකත්වය අහෝසිවිය යුතුය. එපමණක්ද නොව, 8 වැනි
...නීතිය යටතේ ඔහුට දෙනලද ප්‍රවේශ පත්‍ර දෙක පුස්තකාලයාධිපතිහු
...ට ආපසු එවීමද ඔහු විසින් කළ යුතුය.

23. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයට සාමාජිකයකුගෙන්
...විය යුතු මුදලක් තිබෙනොත්, 7 (1) (ඇ) වැනි උපනීතිය යටතේ
... ගෙවා ඇති රුපියල් පහේ ආධානයෙන් අඩුකරගෙන ඉතිරි මුදල
... එසේ මුදලක් අයවෙන්ට නැතොත්, මුළු ආධානයම ඔහුගේ
...ජිකත්වය නතර වීමේදී ඔහුට ආපසු දිය යුතුය.

24. පොත්පත් බැහැරට දෙන පුස්තකාලය වූකලී ඉරිදා දවස්ය,
...ඩුවේ නිවාඩු දවස්ය, (යටත්පිරිසෙයින් දවස් හතකට කලින්
... සාමාජිකයන්ට දැනුම් දී) තොග හරිවැරදි බැලීමට කාරක සභාව
...ම කරන වෙන යම් යම් දවස්ය, යන මේ දවස්වලදී හැර, දිනපතා
...වරු 9න් පස්වරු 6න් කාලය තුළ ඇරලා තැබිය යුතුය.

### ආශ්‍රය පුස්තකාලය

25. පහත පෙනෙන දේ, එනම්—

(අ) පුස්තකාලය පාවිච්චි කිරීම සඳහා පුස්තකාලයාධිපතිහුගෙන්
අවසර ලබාගැනීම,

(ආ) ආශ්‍රය පුස්තකාලයෙහි තබා ඇති ලේඛනය අත්සන් කිරීම.
කරලා තිබෙනොත් මිස නැත්නම් කිසිවකු විසින් ආශ්‍රය
පුස්තකාලය පාවිච්චි නොකළ යුතුය.

26. (අ) අකුරු ලිවීම හා කියවීම පුළුවන්වූද,

(ආ) නගර සභා ප්‍රදේශය ඇතුළත පදිංචිකාරයකු වූද,

(ඇ) වයස අවුරුදු දහහතරකට අඩු නුවූද

ඕනෑම කෙනෙකුට ආශ්‍රය පුස්තකාලය පාවිච්චි කිරීමට අවසර දීමට
පුස්තකාලයාධිපතිහට බලය තිබේ.

27. බැලීම සඳහා තමාට දුන් කිසිම පොතක්, කිසිවකු විසින් ආශ්‍රය
පුස්තකාලයෙන් පිටතට ගෙනයායුතු නොවේ.

28. (1) මේ උපනීතියේ (2) වැනි ඡේදයේ වූ විධිවිධානවලට
යටත්ව, ඉරිදා දවස්වල හෝ ආණ්ඩුවේ නිවාඩු දවස්වල හැර වෙන
ඕනෑම දවසක පෙරවරු 8 සිට දවල් 12 දක්වාත් පස්වරු 2.30 සිට
පස්වරු 6.30 දක්වාත් ආශ්‍රය පුස්තකාලය ඇරලා තිබිය යුතුය.

(2) යෝජනාවක් ඉදිරිපත්කොට සම්මත කරගෙන—

(අ) මේ උපනීතියේ (1) වැනි ඡේදයේ සඳහන් කාලය දීර්ඝ
කිරීමට,

(ආ) යෝජනාවේ සඳහන් පරිදි ඉරිදා දිනයක හෝ ආණ්ඩුවේ නිවාඩු
දවස්වල ඒ කාලය තුළ ආශ්‍රය පුස්තකාලය ඇරලා තැබ්බ
වීමට කාරක සභාවට නියම කිරීමට, හෝ

(ඇ) තොග හරිවැරදි බැලීම සඳහා නගර සභාව නියම කරන දවස්
වලදී ආශ්‍රය පුස්තකාලය වැසීමට කාරක සභාවට නියම
කිරීමට

නගර සභාවට බලය තිබේ.

### කියවීම්ශාලාව

29. පහත පෙනෙන දේ, එනම් :—

(අ) පුස්තකාලයාධිපතිහුගෙන් කියවීම් ශාලාව පාවිච්චි කිරීමට
අවසර ලබා ගැනීම,

(ආ) කියවීම් ශාලාවේ තබා තිබෙන ලේඛනය අත්සන් කිරීම
යන මේ කටයුතු කරලා තිබෙනොත් මිස නැත්නම් කිසිවකු
විසින් කියවීම් ශාලාව පාවිච්චි නොකළ යුතුය.

30. (අ) අකුරු ලිවීම හා කියවීම පුළුවන්වූද,

(ආ) නගර සභා ප්‍රදේශය ඇතුළත පදිංචිකාරයකුවූද,

(ඇ) වයස දහහතරට අඩු නුවූද,

ඕනෑම කෙනෙකුට කියවීම් ශාලාව පාවිච්චි කිරීමට අවසර දීමට
පුස්තකාලාධිපතිහට බලය තිබේ.

31. (1) මේ උපනීතියේ (2) වැනි ඡේදයේ වූ විධිවිධානවලට
යටත්ව, ඉරිදා දවස් හෝ ආණ්ඩුවේ නිවාඩු දවස් හැර වෙන ඕනෑම
දවසක පෙරවරු 8 සිට දවල් 12 දක්වාත් පස්වරු 2.30 සිට පස්වරු
6.30 දක්වාත් කියවීම් ශාලාව ඇරලා තැබිය යුතුය.

(2) යෝජනාවක් ඉදිරිපත් කොට සම්මත කරගෙන—

(අ) මේ උපනීතියේ (1) වැනි ඡේදයේ සඳහන් කාලය දීර්ඝ
කිරීමට, හෝ

(ආ) යෝජනාවේ සඳහන් පරිදි ඉරිදා දිනයක හෝ ආණ්ඩුවේ නිවාඩු
දවස්වල කියවීම් ශාලාව ඇරලා තැබ්බවීමට කාරක සභාවට
නියම කිරීමට, හෝ

(ඇ) තොග හරිවැරදි බැලීම සඳහා නගර සභාව නියම කරන දවස්
වලදී කියවීම් ශාලාව වැසවීමට කාරක සභාවට නියම
කිරීමට නගර සභාවට බලය තිබේ.

32. කියවීම් ශාලාවේ තබා තිබෙන්නාවූ හෝ ඊට අයිතිවූ කිසිම
ප්‍රවෘත්ති පත්‍රයක් හෝ සඟරා කලාපයක් හෝ සඟරාවක් හෝ
සිතියමක් හෝ ලියවිල්ලක් හෝ අත් පිටපතක් හෝ වෙන මොනම
දෙයක් වත් කිසිවකු විසින් කියවීම් ශාලාවෙන් පිටතට ගෙන
නොගිය යුතුය.

### සාමාන්‍ය

33. ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ විසංගත රෝගයකින්
හෝ වම රෝගයකින් පෙළෙන්නාවූ හෝ ළඟදී පෙළුනාවූ හෝ ඒ
රෝගයකින් පෙළෙන කෙනෙකුට ළඟදී සාත්තු කළාවූ කිසිවකු විසින්
ඒ රෝගය බෝවීමට හා රෝග බීජයන් මැරීමට ගතවන කාල
පරිච්ඡේදය පසුවන තෙක් පොදු පුස්තකාලයට අයිති ස්ථානයට
ඇතුල් නොවිය යුතුය.

34. කිසිවකු විසින්—

(1) පොදු පුස්තකාලයට අයිති ස්ථානය ඇතුළත හෝ ඒ අසල
නොමනා අන්දමින් හැසිරීම හෝ ගැහැටක් ඇතිවන කිසිම
දෙයක් කිරීම, හෝ

(2) පොදු පුස්තකාලය තුළ හෝ ඒ අයල වූ නගර සභාවේ ගොඩ
නැගිල්ලේ කිසිම කොටසකට හෝ කිසිම දේපලකට
පලුද්දක් කිරීම හෝ එය මොන අන්දමකින් වත් විරූප
කිරීම, හෝ

(3) තමා ගැන පිළිගත හැකි විස්තරයක් කියන්ට නැතිව ඒ
පුස්තකාලය වැසූ පසු ඒ පුස්තකාලයට අයිති ස්ථානයෙහි
නැවතී සිටීම හෝ ඔබමොබ ඇවිදීම, හෝ

(4) පොදු පුස්තකාලයට අයිති ස්ථානය ඇතුළතදී දුම්බීම හෝ
කෙළ ගැසීම, හෝ

(5) පොදු පුස්තකාලයට අයිති ස්ථානය ඇතුලතදී ගුදු ඉතුනිම හෝ හයදුඩු කොළවලින් සුදු ගෙළීම හෝ කිසිම ක්‍රීඩාවක් කිරීම, හෝ

(6) පුස්තකාලය ඇතුළේදී කෑගැසීමෙන් හෝ බින්ද වීමෙන් හෝ වෙන යම් ඝෝෂාවක් කිරීමෙන් පොදු පුස්තකාලය පාවිච්චි කරන්නන්ට කරදර කිරීම, හෝ

(7) අපිළිසිඳු ලෙසින් පොදු පුස්තකාලයට අයිති ස්ථානයට ඇතුල් වීම, හෝ

(8) පොදු පුස්තකාලයට අයිති ස්ථානය ඇතුළට බල්ලකු හෝ වෙන යම් සතකු ගෙනඊම, හෝ

(9) පොදු පුස්තකාලයට අයිති ස්ථානයේ කිසිම කොටසක නිද ගැනීම හෝ කිසිම ආහාරයක් අනුභව කිරීම, හෝ

(10) මේ උපනීති යටතේ තමා වෙත පැවරී ඇති බලතල නීත්‍යානුකූල ලෙස පාවිච්චි කිරීමට පුස්තකාලයාධිපතිගට හෝ ඔහුගේ අණ පරිදි ක්‍රියා කරන අන් කිසිවකුට අවහිර කිරීම,

නොකළ යුතුය.

35. 32 වැනි උපනීතිය හෝ 33 වැනි උපනීතිය හෝ 34 වැනි උපනීතිය කඩකරන කොයි ප්‍රස්තාවයේදීත් රුපියල් පනහකට නොවැඩි දඩයකින් දඬුවම් දීමට පුළුවන් විය යුතුය.

## XVIII වැනි කාණ්ඩය

### මහජන සෞඛ්‍යය පිළිබඳ උපනීති

1. (1) වසංගත රෝගයකින් හෝ ස්ථානික වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් පෙළෙන අයකු සිටින යම් ගෙයක හෝ ගොඩනැගිල්ලක පිට පැත්තේ කාටත් පෙනෙන හැනක සලකුණක් සවිකර තැබ්බවීමටත් ඒ සලකුණ තමාට සුදුසුයයි හැඟෙන කාලයක් තැබ්බවීමටත් සභාපතිහට හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද ඕනෑම කෙනෙකුට බලය තිබිය යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදයේ කියා ඇති කිසිම සලකුණක් සභාපතිහුගේ අවසරය නැතිව කිසිවකු විසින් ඉවත් කිරීම හෝ මකා දැමීම නොකළ යුතුය.

2. 1 වැනි උපනීතියේ සඳහන් ඕනෑම රෝගයකින් පෙළෙන කවරකු වත් කිසිම මහ පාරකට හෝ අඩිපාරකට හෝ පොදු ස්ථානයකට ගිහාම්හාගෙනම නොයා යුතුය.

3. 1 වැනි උපනීතියේ සඳහන් ඕනෑම රෝගයකින් පෙළෙන ළමයකු හෝ වෙන කෙනෙකු, කිසිවකු විසින් ගිහාම්හාගෙනම පාරකට බැස්සවීම හෝ මහ පාරකට හෝ අඩිපාරකට හෝ පොදු ස්ථානයකට එක්ක යෑම නොකළ යුතුය.

4. මහජනයා නාන තැනක ගැණු. පිරිමි දෙපක්ෂයෙන් එක් පක්ෂයකට පමණක් නගර සභාව විසින් වෙන් කරනලද කිසිම කොටුවකට අනිත් පක්ෂයේ කිසිවකු ඇතුළත් නොවිය යුතුය.

5. (1) ස්පර්ශයෙන් බෝවෙන ඕනෑම රෝගයකින් හෝ වණ රෝගයකින් හෝ වසංගත රෝගයකින් පෙළෙන්නාවූ හෝ ලෙඩ පෙළුනාවූ කිසිවකු ඒ රෝගය බෝවීමට හා රෝග බීජයන් මෙරීමට ගතවන කාලපරිච්ඡේදය පසුවන තෙක් මහජනයා නාන කිසිම ස්ථානයක නෑම හෝ මුහුණ කට සේදීම නොකළ යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදයේ කී ඕනෑම කෙනෙකුගේ පාවිච්චිය සඳහා වුවමනාවන වතුර නීරෝගී පුද්ගලයකු විසින් ඇදලා පාවිච්චිය පිණිස පොදු ළිඳකින් හෝ මහජනයා නාන ස්ථානයකින් යටත් පිරිසෙයින් අඩි විසිපහක් වත් ඈතට ගෙන යා යුතුය.

6. කිසිවකු විසින් පොදු ළිඳකින් හෝ මහජනයා නාන ස්ථානයකින් වතුර ඇදීම පිණිස අපවිත්‍ර කිසිම භාජනයක් පාවිච්චි නොකළ යුතුය.

7. කිසිවකු විසින් :—

(1) පොදු ළිඳක හෝ මහජනයා නාන ස්ථානයක් වශයෙන් වෙන් කර තිබෙන කිසිම තැනක දමා හෝ ඒ අසලදී මොනම කරුණක් නිසා වත් කිසිම ද්‍රව්‍යයක් සේදීම හෝ සේදීමට සැලැස්වීම නොකළ යුතුය, නැතහොත්

(2) මහජනයා නාන කිසිම ස්ථානයකට මොනම කරුණක් නිසා වත් කිසිම සතකු දක්කාගෙන යෑම හෝ එළවීම හෝ ඇර හෙනයෑම හෝ නොකළ යුතුය, නැතහොත්

(3) කිසිම පොදු ළිඳක හෝ මහජනයා නාන ස්ථානයක වතුර හෝ ඒ ළිඳ හෝ ස්ථානය පිහිටි භූමිය මොනම අන් දමකට වත් අපවිත්‍ර නොකළ යුතුය.

8. සෞඛ්‍යවත් ඉදිරිපත් කොට සම්මත කරගෙන යම්කිසි පොදු ළිඳකින් හෝ පිල්ලකින් හෝ වෙන ජලස්ථානයකින් නෑම හෝ මුහුණ කට සේදීම තහනම් කිරීමට නගර සභාවට බලය තිබිය යුතුය.

9. (1) සේදීම හෝ නෑම හෝ මනුෂ්‍යයන්ගේ බීමට වතුර ගෙන යෑම හෝ ... නෑම සඳහා නගර සභාවට ස්වකීය අභිමත පරිදි ... වෙන ජලස්ථානයක විශේෂ ස්ථාන වෙන් කිරීමට බලය තිබේ.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ නගර සභාව විසින් වෙන් කර තිබෙන කිසිම ස්ථානයක් නියමිත කටයුත්තට හැර වෙන කිසිම කටයුත්තකට කිසිවකු විසින් පාවිච්චි නොකළ යුතුය.

10. (1) ගෙදර දොරේ කටයුතු සඳහා ජලය ලබා ගන්නා පොදු ළිඳකින් හෝ පිල්ලකින් හෝ උල්පොතකින් හෝ වෙන ජල ස්ථානයකින් අඩි පනහක් ඇතුළත කිසිම කසළ වළක් හෝ මලමුත්‍ර වළක් හෝ ගොම කොටුවක් හෝ ගාලක් හෝ හරක් මඩුවක් හෝ වළ වැසිකිළියක් හෝ නරක් වූ කාණුවක් හෝ තිබෙන්ට ඉඩ හැරීම වත් කිසිම ඉඩමකට වගකිවයුතු සඳහා විරින් වර පෝර දැමීම වත් කිසිවකු විසින් නොකළ යුතුය.

(2) ගෙදර දොරේ කටයුතු සඳහා ජලය ලබාගන්නා පුද්ගලික ළිඳක් කිසිම මලමුත්‍ර වළකින් හෝ කසළ වළකින් හෝ ගොම කොටුවකින් හෝ ගාලකින් හෝ ගරක් මඩුවකින් හෝ වළ වැසිකිළියකින් හෝ නරක්වූ කාණුවකින් හෝ විරින් වර පෝර දමා වගා කරන ඉඩමකින් අඩි පනහක් ඇතුළත කිසිවකු විසින් නොකැපිය යුතුය.

11. වෙන කෙනෙකුට අයිති ඉඩමකට හෝ පොදු ස්ථානයකට හෝ පහපාරකට කිසිවකු විසින් කැලිකසළ හෝ කුණුරොඩු හෝ ප්‍රයෝජනයට ගත නොහැකි අබලන් බඩු හෝ අන් කිසි දෙයක් විසි නොකළ යුතුය.

12. යම්කිසි සතකු මැරුණ විට ඒ වේලාවේ සිට පැය දොළහක් ඉකුත් වන්ට මත්තෙන් ඒ මළකුණ වළලා දැම්මවීම ඒ සතා අයිතිකාරයාගේ හෝ අයිතිකාරයෙක් නැත්නම්, සතා මැරුණ ස්ථානයෙහි පදිංචිකාරයාගේ යුතුකම විය යුතුය.

13. නගර සභා ප්‍රදේශය ඇතුළත වූ ඕනෑම ගෙයක පදිංචිකාරයා විසින් හෝ පදිංචිකාරයෙක් නැත්තේ වී නම් ඒ ගෙයි අයිතිකාරයා විසින් ඒ ගෙට අයිති භූමිභාගය කුණුරොඩු හා වල් පැලෑටි ඉවත් කොට ශුද්ධපවිත්‍ර කර සෞඛ්‍යානුකූලව තබාගත යුතුය.

14. මලමුත්‍ර කිරීම සඳහා විශේෂයෙන් වෙන් කරනලද ස්ථානයකට හැර වෙන මොනම ස්ථානයකට වත් කිසිවකු විසින් මලමුත්‍ර පහ නොකළ යුතුය.

15. මහජන සෞඛ්‍යය පිළිබඳ මේ උපනීතිවලින් කවරක් වුවත් ඇති විධිවිධාන කඩකරන ඕනෑම කෙනෙකුට දඬුවමක් වශයෙන් රුපියල් විසිපහකට නොවැඩි දඩයක් ගැසීමට උසාවියට පුළුවන් කම තිබිය යුතුය.

## XIX වැනි කාණ්ඩය

### නිකරුණේ ඇවිදීම පිළිබඳ උපනීති

1. රාත්‍රී 11 හා උදේ 5 අතර කාලය ඇතුළත කිසිවකු එළියක් නැතිව කිසිම මහ පාරක නිකරුණේ සංචාරය නොකළ යුතුය. තියම වශයෙන් දල්වීමක් නොකර විදුලි පන්දමක් හෝ දල්විය හැකි වෙන උපකරණයක් නිකම් ළඟ තබාගැනීම මේ උපනීතිය සඳහා ප්‍රමාණවත් යයි නොසැලකිය යුතුය.

2. 1 වැනි උපනීතිය කඩකරන කොයි ප්‍රස්තාවයේදීත් රුපියල් දහයකට නොවැඩි දඩයකින් දඬුවම දීමට පුළුවන් විය යුතුය.

## XX වැනි කාණ්ඩය

### කසළ ශෝධනය පිළිබඳ උපනීති

1. කසළ ශෝධන (අශූචි ඉවත් කිරීමේ) සේවයක් ඇති ප්‍රදේශයක් ඇතුළත පිහිටි ඕනෑම ඉඩමක අයිතිකාරයකුට, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිහුගේ හෝ ඒ වෛද්‍ය නිලධාරිහු විසින් බලය පවරන ලද නිලධාරියකුගේ නිර්දේශය පිට තමා අනුමත කරන ප්‍රමාණයක හා වර්ගයක ජල මුද්‍රා වැසිකිළියක් හෝ පතිවටු වැසිකිළියක් තමා අනුමත කරන තැනක යාද ගන්නා ලෙස දැන්වීම් පත්‍රයකින් නියමකර යැවීමට සභාපතිහට බලය තිබේ.

2. කසළ ශෝධන සේවයක් පිහිටුවා ඇති ප්‍රදේශයක් ඇතුළත පිහිටි ඕනෑම ඉඩමක තිබෙන (1 වැනි උපනීතියේ කියා ඇති ප්‍රමාණයට හා වර්ගයට ගැළපෙන්ට සෑදූ ජල මුද්‍රා වැසිකිළියක් හෝ පතිවටු වැසිකිළියක් නොවන) ඕනෑම කසළ වළක් හෝ වැසිකිළියක් යෝග්‍යතානුකූල නොවන හෙයින් සෞඛ්‍යයට උපද්‍රවදායකය කියා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිහු හෝ ඒ වෛද්‍ය නිලධාරිහු විසින් බලය පවරන ලද නිලධාරියකු සහතික කළොත් ඒ ඉඩම අයිතිකාරයාට ඒ කසළ වළ හෝ වැසිකිළිය වසා දමන ලෙස නගර සභාවේ නිර්දේශය පිට දැන්වීම් පත්‍රයකින් නියම කර යැවීමට සභාපතිහට බලය තිබේ.

3. 1 වැනි උපනීතියේ හෝ 2 වැනි උපනීතියේ කී දැන්වීම බාර දෙනු ලැබූ හැම අයිතිකාරයකුම ඒ දැන්වීමේ කියා ඇති නියමයන් එහි සඳහන් කාලපරිච්ඡේදය (මේ කාලපරිච්ඡේදය කොයි ප්‍රස්තාවය වත් දෙමසට අඩු නොවිය යුතුය.) ඇතුළතදී ඉටුකල යුතුය.

4. කසළ ශොධන සේවයක් ඇති ප්‍රදේශයක් ඇතුළත පිහිටියාවූද, ජලමුණා වැසිකිළියක් හෝ පතිවවූ වැසිකිළියක් තිබෙන්නාවූද ඉඩමක පදිංචිකාරයා විසින් ඒ වැසිකිළිය හැම කල්හිම ශුඩපවිත්‍ර කොට කිසිම කැඩුමක් බිඳුමක් නැතිව නිතරම සවස්ථානුකූලව තබාගත යුතුය.

5. නගර සභාවේ සේවය කරන කසළ ශොධකයකු හැර අන් කිසිවකු කසළ ශොධන සේවයක් ඇති ප්‍රදේශයක් ඇතුළත පිහිටියා වූ කිසිම වැසිකිළියකින් අශූචි ගෙනයෑම හෝ වෙන විදිය කින් අස්කිරීම නොකල යුතුය.

6. දුප්පත්කම නිසා නගර සභාව විසින් නිදහස් කරනලද අයකු හැර, කසළ ශොධන සේවයෙන් ප්‍රයෝජන ලබන ඕනෑම ඉඩමක අයිතිකරයා විසින් හෝ පදිංචිකාරයා විසින්, නගර සභාව වැසිකිළි යකට මෙපමණ කියා නියම කරන ගණනක් අනුව කසළ ශොධන ගාස්තුවක් ගෙවිය යුතුය.

7. 6 වැනි උපනීතියේ කියා ඇති කසළ ශොධන ගාස්තුව සභාපතිහට හෝ ඒ ගාස්තුව එකතුකිරීම පිණිස ඔහු විසින් ලියවිල්ලකින් විධිවූ පරිදි බලය පවරනලද ඕනෑම කෙනෙකුට ගෙවිය යුතුය.

## XXI වැනි කාණ්ඩය

### කැළිකසළ ඉවත්කිරීම පිළිබඳ උපනීති

1. නගර සභා ප්‍රදේශයෙහි හැම තැනම හෝ එහි නියමිත කොටසක කැළිකසළ ඉවත්කිරීමේ සේවයක් පිහිටුවූ විට ඒ සේවය පිහිටුවා තිබෙන ප්‍රදේශයක් තුළ පිහිටි ඕනෑම ඉඩමක පදිංචිකාරයා විසින් තමාගේ ඉඩම අතුගා ඉවත දමන අලුය, කුණුරොඩුය, සෙසු කැලිකසළය යන මේවා එකතු කරන (සුදුසු පියනක් ඇත්තාවූද උස අඟල් විසිහතරකට අඩු නුවූද පතුලේ විෂ්කම්භය අඟල් දහහතර කට හා මුදුනේ විෂ්කම්භය අඟල් දහඅටකට අඩු නුවූද ලෝහවලින් සාදන ලද්දාවූ) කුණු බාල්දියකට දැමිම විය යුතුය.

2. 1 වැනි උපනීතියේ කී ඉඩමක පදිංචිකාරයා විසින්—

(අ) සභාපතිහු කලින් කල අණබෙර ගස්වා දන්වන හෝ වෙන යම් ක්‍රමයකින් දන්වන වේලාවල් අතර දින පතාම (1 වැනි උපනීතියේ කී) ඒ බාල්දිය ඒ ඉඩමෙන් පිටත පාරේ රථවාහන ගමනාගමනයට බාධා නොවන පරිදි අයිනකින් තැබීමට සැලැස්විය යුතුය.

(ආ) නගර සභාවේ කැළිකසළ ශෝධකයන් ඒ බාල්දිය හිස්කොට පැය බාගයක් ඇතුළතදී එය ඒ ස්ථානයෙන් අස්කර විය යුතුය.

3. 2 වැනි උපනීතියේ කී කාලවේලාවලදී මිස කිසිවකු විසින් 1 වැනි උපනීතියේ සඳහන් කිසිම බාල්දියක් කිසිම පාරක නො තැබිය යුතුය.

4. දුප්පත්කම නිසා නගර සභාව විසින් නිදහස් කරන ලද පදිංචි කාරයකු හැර කැළිකසළ ශොධන සේවයෙන් ප්‍රයෝජන ලබන ඕනෑම ඉඩමක පදිංචිකාරයා විසින් නගර සභාව නියම කරන රේට ගණනක් අනුව කසළ ශොධන ගාස්තුවක් නගර සභාවට මාස් පතා ගෙවිය යුතුය.

5. සභාපතිහු බලය දී ඇතොත් මිස නැත්නම් කිසිවකු විසින් නගර සභා ප්‍රදේශය ඇතුළත වූ කිසිම විධියකින් හෝ පොදු ස්ථානය කින් දූවිලි, අලු, කුණු රොඩු ආදිය එකතු කිරීම හෝ ඉවත් කිරීම නොකල යුතුය.

6. 1 වැනි උපනීතිය හෝ 2 වැනි උපනීතිය හෝ 3 වැනි උපනීතිය හෝ 5 වැනි උපනීතිය කඩකරන කොයි ප්‍රස්තාවයේදීත් රුපියල් පනහකට නොවැඩි දඩයක් ගැසීමෙන් දඬුවම් කිරීමට පුළුවන්කම තිබිය යුතුය.

## XXII වැනි කාණ්ඩය

### දියවැසිකිළි හා වැසිකිළි සාද තබාගැනීම පිළිබඳ උපනීති

1. සභාපතිහුගෙන් අවසර පත්‍රයක් ලබාගෙන ඇතොත් මිස නැත් නම් යම් ස්ථානයක අයිතිකාරයා විසින් හෝ පදිංචිකාරයා විසින් ඒ ස්ථානයේ දියවැසිකිළියක් හෝ වැසිකිළියක් නොසෑදිය යුතුය.

2. 1 වැනි උපනීතිය යටතේ අවසර පත්‍රයක් ලබාගැනීමට කිසිවකු ඉල්ලීමක් කල කල ඔහු සෑදීමට අදහස් කරන දියවැසිකිළියේ හෝ වැසිකිළියේ සැලැස්මක් හා වැඩි විස්තර ඉදිරිපත් කරන ලෙස ඔහුට නියම කරන්ට සභාපතිහට බලය තිබේ.

3. 1 වැනි උපනීතිය යටතේ සභාපතිහු දෙන ඕනෑම අවසර පත්‍රය කින් (නගර සභාව අනුමත කර ඇති වගීයේ) දියවැසිකිළියක් හෝ වැසිකිළියක් ඒ ස්ථානයෙහි ඒ අවසර පත්‍රයෙහි කියා ඇති තැනක සෑදෙනුවට අයැදුම්කරුට නියම කිරීමට සභාපතිහට බලය තිබේ.

4. සභාපතිහුගෙන් අවසර පත්‍රයක් ලබා නොගෙන හෝ 1 වැනි උපනීතිය යටතේ දෙනලද අවසර පත්‍රයේ සඳහන් නියමයන්ගෙන් යමකට ප්‍රතිවිරුඩව යම් ඉඩමක දියවැසිකිළියක් හෝ වැසිකිළියක් සාද තිබෙනොත්, ඒ ඉඩමේ අයිතිකාරයා හෝ පදිංචිකාරයා වෙත දැන්වීම් පතක් යවමින් ඒ දැන්වීමේ සඳහන් කාලපරිච්ඡේදය ඇතුළතදී ඒ දියවැසිකිළිය හෝ වැසිකිළිය වසා දමන ලෙස නියම කිරීමට සභාපතිහට බලය ඇත්තේය.

5. යම් ඉඩමක අයිතිකාරයා හෝ පදිංචිකාරයා වෙත දැන්වීම් පතක් යවමින් ඒ දැන්වීමේ කියා ඇති ආකාරයට කාණු ඇතිව එහිම කියා ඇති තැන (නගර සභාව විසින් අනුමත කරනලද ප්‍රමාණයේ හා වගීයේ) දියවැසිකිළියක් හෝ වැසිකිළියක් ඒ ඉඩමේ සාදගන්නා ලෙස ඒ අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට නියම කිරීමට සභාපතිහට බලය ඇත්තේය.

6. ඕනෑම ඉඩමක තිබෙන දියවැසිකිළිය හෝ වැසිකිළිය—

(අ) සාද තිබෙන ආකාරය හොඳ නැත කියා, හෝ

(ඉ) පාවිච්චි කරන කට්ටුන්ට නුසුදුසු කියා, හෝ

(උ) සවස්ථානුකූල නොවේය කියා නැතහොත් සෞඛ්‍යයට අහිතය කියා, හෝ

(එ) අශූචි ඉවත් කිරීම සඳහා ඊමට නගර සභාව දමා ඇති පාර කින් පහසුවෙන් ආ නොහැකිය කියා නැතහොත් ඒ පාරකට යාවී නැත කියා හෝ

සභාපතිහට කල්පනා වුවහොත් ඒ ඉඩමේ අයිතිකාරයා හෝ පදිංචි කාරයා වෙත දැන්වීම් පතක් යවමින් ඒ දැන්වීමේ කියා තිබෙන ආකාරයට එහිම කියා ඇති කාලපරිච්ඡේදය ඇතුළත ඒ දියවැසිකිළිය හෝ වැසිකිළිය අලුත්වැඩියා කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් යම් වෙනසක් කිරීමට හෝ එය කඩා දමා අලුතුවෙන් සෑදීමට ඒ අයිති කාරයාට හෝ පදිංචිකාරයාට නියම කිරීමට සභාපතිහට බලය තිබේ.

7. දියවැසිකිළියක් හෝ වැසිකිළියක් ඇති හැම ඉඩමකම පදිංචි කාරයා විසින් ඒ දියවැසිකිළිය හෝ වැසිකිළිය කැඩුම්බිඳුම් නැතිව සවස්ථානුකූල ලෙස නිතරම තබාගත යුතුය.

8. හොඳින් අශූචි ඉවත්කිරීම සඳහා යම්කිසි විශෙෂ ප්‍රදේශයක ඉඩම්වල අයිතිකාරයන් හෝ පදිංචිකාරයන් විසින් ඒ ප්‍රදේශයෙහි පාරවල් දමාගත යුතුය කියා නගර සභාව යෝජනාවක් ඉදිරිපත් කොට තීරණය කල කල ඒ ප්‍රදේශයේ ඕනෑම ඉඩමක අයිතිකාරයා හෝ පදිංචිකාරයා වෙත දැන්වීම් පතක් යවමින් ඒ දැන්වීමේ කියා ඇති කාලපරිච්ඡේදය ඇතුළතදී ඒ ඉඩමට පිටිපසින් හෝ සමාන්තරව එහි කියා ඇති තැනක කියා ඇති පළලක (කිසි විටෙක වත් අඩි දහයකට වැඩි නොවිය යුතුය.) පාරක් දමා ගන්නා ලෙස ඒ අයිති කාරයාට හෝ පදිංචිකාරයාට නියම කිරීමට සභාපතිහට බලය ඇත්තේය.

9. නගර සභාව විසින් අනුමත කරන ලද ප්‍රමාණයේ හා වගීයේ දියවැසිකිළියක් හෝ වැසිකිළියක් ගොඩනැගිල්ලක් තුළ තැනීමට බාරගනිතොත් මිස නැත් නම් කිසිවකු තැනීමට අදහස් කරන ඕනෑම ගොඩනැගිල්ලක සැලැස්මක් හෝ සටහනක් හෝ වැඩ විස්තරයක් අනුමත කිරීමට බැරිය කීමට සභාපති හට බලය ඇත්තේය.

10. මේ උපනීති යටතේ දැන්වීමක් බාරදෙනු ලැබූ කා විසිනුත් ඒ දැන්වීමේ සඳහන් නියමයන් ඒ දැන්වීමේ කියා ඇති කාල පරිච්ඡේදය ඇතුළතදී ඉටු කල යුතුය.

11. මේ උපනීතිවලින් කවරක් වුවත් කඩ කරන ඕනෑම කෙනෙකු වරදක් කලා විය යුතුවාත් හැර වරදකාරයා බැව් උසාවියකින් තීරණය කල කල රුපියල් සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතුද වන්නේය.

## XXIII වැනි කාණ්ඩය

### රථවාහන හා සත්ව බද්ද පිළිබඳ උපනීති

1. පද සම්බන්ධයෙන් වෙන අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස නැත් නම් රථවාහන හා සත්ව බද්ද පිළිබඳ මේ උපනීතිවල—

"ආඥාපණත" යන්නෙන් 1939යේ අංක 61 දරණ නගර සභා ආඥාපණතද;

"ආදායම් පරීක්ෂක යන්නෙන් නගර සභාවේ ආදායම් පරීක්ෂක තැනද අදහස් කරනු ලැබේ.

2. ආඥාපණතේ 175 වැනි, 176 වැනි වගන්ති යටතේ නගර සභාව විසින් රථවාහන හා සතුන් වෙනුවෙන් අය කරන වාර්ෂික බද්ද එක් එක් අවුරුද්දේ මාර්තු මාසයේ තිස්එක්වැනිද පසුවෙන්ට මත්තෙන් නගර සභාවේ කායර්‍යාලයට ගෙවිය යුතුය.

3. (1) වාර්ෂික බද්ද ගෙවන ලද හැම රථවාහනයක්ම වෙනුවෙන් සභාපතිහු විසින් ලෝහ තහඩුවක් දිය යුතුය; නැතහොත් ගදවිය යුතුය. ඒ තහඩුවෙහි වූ කලී රථවාහනය හැඳින ගැනීම සඳහා යෙදිය යුතුයයි නගර සභාවෙන් නියම කරන අකුරුවලින් ඒ රථයට ගැලපෙන අකුරුද තහඩුව යම් අවුරුද්දක් වෙනුවෙන් දෙනොත් ඒ අවුරුද්ද [illegible] ඉලක්කමද රථවාහන ලේඛනයෙයි ඒ රථයට යොද ඇති [illegible] සඳහන් කොට තිබිය යුතුය.

CS CamScanner

(2) මේ උප නීතියේ (1) වැනි ඡේදය යටතේ දුන් ඕනෑම තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙනයම් කරුණක් නිසා බැරී විරූප වී ගියහොත් ඒ තහඩුව අයිතිකාරයා එය සභාපතිහට ආපසු බාරදී ශත විසිපහක් ගෙවූ විට අලුත් තහඩුවක් ලබාගැනීමට ඒ අයිතිකාරයාට අයිතිවාසිකම තිබිය යුතුය.

(3) මේ උප. නීතියේ (1) වැනි ඡේදය යටතේ දුන් ඕනෑම තහඩුවක් නැතිවූ බව හෝ සොරා ගන්නා ලද බව දිවුරුම් පත්‍රයකින් හෝ වෙන යම් අන්දමකින් ඒත්තුගන්වා ඒ තහඩුව අයිතිකාරයා අලුත් තහඩුවක් ඉල්ලා ශත පණහක් ගෙවූ විට අලුත් තහඩුවක් දීමට සභාපතිහට බලය ඇත්තේය.

4. 1 (3) වැනි උප නීතිය යටතේ තහඩුවක් දුන් ඕනෑම රථ වාහනයක් ඇත්තාවූ හෝ බාරව සිටින්නාවූ හෝ පාලනය කරන්නාවූ පුද්ගලයා විසින් ඒ තහඩුව ඒ රථයේ කාටත් පෙනෙන තැනක සවි කරවිය යුතුය.

(2) මේ උප නීතියේ (1) වැනි ඡේදයේ විධිවිධාන කඩකරන කොයි පුද්ගලයාත් රුපියල් පණහකට නොවැඩි දඩයකින් දඬුවම් ලැබිය හැකි වරදක් කරන්නකු විය යුතුය.

5. (1) සභාපතිහට හෝ ඕවර්සියර්ට හෝ ඕනෑම පොලිස් නිලධාරියකුට හෝ සභාපතිනු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද වෙන ඕනෑම නිලධාරියකුට නගර සභා ප්‍රදේශ සීමාව ඇතුළත ඕනෑම ධාරක ගමන් කරන රථවාහනයක්, 4 (1) වැනි උප නීතියෙහි සඳහන් ලෝග තහඩුව තිබේදැයි පරීක්ෂාකර බැලීම පිණිස නැවැත්වීමට බලය තිබිය යුතුය. සභාපතිහට හෝ ඒ නිලධාරියාට ඒ පරීක්ෂාව කිරීම පිණිස ඒ ඕනෑම රථයක රියැදුරා හෝ ඒ රථය බාරව සිටින්නා විසින් අවසර දිය යුතුවාත් හැර ඒ සඳහා අවශ්‍ය හැම උපකාරයක්ම කළ යුතුද වන්නේය.

(2) මෙ උප නීතියේ (1) වැනි ඡේදයේ විධිවිධාන කඩ කරන කොයි පුද්ගලයාත් රුපියල් පණහකට නොවැඩි දඩයකින් දඬුවම ලැබිය හැකි වරදක් කරන්නකු විය යුතුය.

## XXIV වැනි කාණ්ඩය

### උකස් (කිරීම්) ලියාපදිංචි කිරීම පිළිබඳ උපනීති

1. නගර සභා පාලන ප්‍රදෙශ සීමාව ඇතුළත පිහිටි හැම තිශ්වල දේපලකම උකස් හිමියාට හෝ නැසීගිය ඕනෑම උකස් හිමිගකුගේ උරුමක්කාරයකුට හෝ නීත්‍යනුකූල නියෝජිතයාට ඒ ඕනෑම උකසක් නගරසභා කාර්යාලයේ ලියාපදිංචි කරවා ගැනීමට නීතියෙන් බලය තිබිය යුතුය.

2. නගරසභා කාර්යාලයේ උකසක් ලියාපදිංචි කරවා ගැනීමට කැමති කා විසිනුත්—

(අ) උකස් හිමියාගේ හෝ ඔහු නැසී ගියේ නම් ඔහුගේ උරුමක්කාරයකුගේ හෝ උකස් හිමියාගේ නීත්‍යනුකූල නියෝජිතයාගේ නම හා ලිපිනයද;

(ආ) උකස් කරන්නාගේ නම හා ලිපිනයද;

(ඇ) දේපල පිළිබඳ විස්තරයක් හෝ එය හැඳින ගැනීම සඳහා අවශ්‍ය වන තොරතුරුද දක්වා සටහනක්ද

සභාපතිනු වෙත එවිය යුතුය: නැතහොත් එවන්ට සැලැස්විය යුතුය.

3. 2 වැනි උපනීතිය යටතේ සටහනකුත් නගර සභාව නියම කරන රේට් ගණනක් අනුව ලියාපදිංචි කිරීමේ ගාස්තුවත් ඉල්ලුම්කාරයාගෙන් ලැබුණ විට සභාපතිනු විසින් නම් සහ ලිපිනයන් ඇතුළු අවශ්‍ය විස්තර නගරසභා කාර්යාලයේ (ඒ කටයුත්ත සඳහා තබා තිබෙන) ලේඛන යෙහි ඇතුළත් කරවිය යුතුය.

4. මෙ උපනීතිවල ප්‍රකාර යම් දේපලක් සම්බන්ධයෙන් උකසක් හා නම් හා ලිපිනයන් ලියාපදිංචිකර ඇතොත් ඒ දේපල නගර සභාවට ලැබියයුතු වරිපණමක් හෝ අයබද්දක් හෝ ගාස්තුවක් අයකර ගැනීම් වශයෙන් අල්ලා ගතහොත් ඒ දේපල වෙන්දේසි කරන බව පල කිරීමට යටත්පිරිසෙයින් දහ හතර දවසකටවත් කලින් සභාපතිනු විසින් ඒ අල්ලා ගැනීමත් වෙන්දේසිය පැවැත්වීමට නියම කරන ලද දිනයත් ඇල්ලීම කළේ යම් මුදල් ගණනක් අයකර ගැනීමට නම් ඒ මුදල් ගණනත් දන්වා ලිඛිත නිවේදනයක්, නම හා ලිපිනය ලියාපදිංචිකර ඇති තැනැත්තා හෝ තැනැත්තන් වෙත බාරදිය යුතුය; නැතහොත් බාර දෙවිය යුතුය.

5. 4 වැනි උපනීතිය යටතේ බාරදුන් නිවේදනයෙහි සඳහන් මුදල් ගණන වෙන්දේසියට මත්තෙන් ඕනෑම වේලාවකදී නගරසභාවට දෙවරෙන් අල්ලාගත් ලැබූ ඒ දේපල නිදහස් කරනු ලැබේ.

## XXV වැනි කාණ්ඩය

### වාහන නතරකර තැබීම පිළිබඳ උපනීති

1. පද සම්බන්ධයෙන් වෙන අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස නැත් නම් මේ උපනීතිවල—

"රියදුරා" යන්නෙන් තනි පුද්ගලයකු නැගී යන බයිසිකලයක් හෝ රෝද තුනේ සයිකලයක් හෝ සම්බන්ධයෙන් නම් එහි නැගී යන්නාද, අත් කරත්තයක් හෝ තල්ලු කරගෙන යන කරත්තයක් සම්බන්ධයෙන් නම් ඒ කරත්තය ඇදගෙන යන හෝ තල්ලු කරගෙන යන තැනැත්තාද ජීත් රිකෂෝ රථයක් සම්බන්ධයෙන් නම් ඒ රික්ෂෝ රථය ඇදගෙන යන යන තැනැත්තාද අදහස් කරනු ලැබේ.

"නතරකර තැබීම" යන්නෙන් වාහනයක් අචල තත්වයකට ගෙන ඊම නැතහොත් එවලේම මිනිසුන් නග්ගා ගැනීමට හෝ බැස්සවීම හෝ බඩු පටවා ගැනීම හෝ බෑම හැර වෙන කටයුත්තක් සඳහා වාහනයක් නවත්වා තබාගැනීම අදහස් කරනු ලැබේ;

"වාහනය" යන්නෙන් ගොඩබිමේ ගමනාගමනය කිරීමේ උපාය මාර්ගයක් වශයෙන් පාවිච්චි කරන්නාවූ හෝ පාවිච්චි කිරීමට පුළුවන් වූද යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් හෝ වෙන අන්දමකින් දුවවන්නාවූද ඕනෑම කෘත්‍රිම උපකරණයක් අදහස් කරනු ලැබේ. එහෙත් 1951 කේ අංක 14 දරණ මෝටර් වාහන ආඥා පණතේ විස්තරකර තිබෙන මෝටර් රථයක් ඊට ඇතුළත් නොවේ.

2. නගරසභා ප්‍රදේශය ඇතුළත ඕනෑම වීදියක හෝ වීදි කැල්ලක වාහන නතරකර තැබීම හෝ නැවැත්වීම. තහනම් කොට හෝ සීමාකොට හෝ විධිමත් කොට නැතහොත් වාහන නතරකර තැබීමේ ක්‍රමක් වෙන් කොට දන්වීමක් ඒ වීදියේ හෝ වීදි කැල්ලේ කාටත් පෙනෙන තැනක හෝ පෙනෙන ලෙසට තැබ්බවීමට සභාපතිට බලය තිබේ; නැතහොත් ඔහුගේ අණ පරිදි එසේ තැබ්බවිය හැකිය.

3. 2 වැනි උපනීතිය යටතේ තබ්බවන ලද දැන්වීමකින් යම් වීදියක හෝ වීදි කැල්ලක වාහන නැවැත්වීම හෝ නතරකර තැබීම තහනම් කර ඇතිවිට වාහනයක රියැදුරා විසින්:—

(අ) යම් නිලධාරියකු විසින් හෝ ජාලන මණ්ඩලයක් විසින් ඒ වීදියේ හෝ ඒ වීදි කැල්ලේ, ගමනාගමනය සම්බන්ධයෙන් කරන යම්කිසි සංඥවකට හෝ, එහි සවිකර තිබෙන්නාවූ හෝ තබා තිබෙන්නාවූ දැන්වීමකට කීකරුවීම් වශයෙන්; හෝ

(ආ) ඒ ප්‍රස්තාවයේදී ඒ වීදියේ හෝ ඒ වීදි කැල්ලේ පවතින ගමනාගමනයේ අනුපිළිවෙල අනුගමනය කිරීම් වශයෙන්; හෝ

(ඇ) ඒ වාහනයෙන් යමකුට බැසීමට හෝ ඊට නැගීමට ඉඩ දීම් වශයෙන්; හෝ

(ඈ) ඒ වාහනයෙන් බඩු බෑම් වශයෙන් හෝ ඊට බඩු පැටවීම් වශයෙන්

අවශ්‍ය වන කාලයට හැර ඒ වීමයේ හෝ වීදි කැල්ලේ ඒ වාහනය නවත්වා තබන්ට ඉඩ නොදිය යුතුය.

4. 2 වැනි උපනීතිය යටතේ තබන ලද දැන්වීමකින් යම් වීදියක හෝ වීදි කැල්ලක වාහන නැවැත්වීම හෝ නතරකර තැබීම තහනම් කර හෝ සීමාකර නොමැති විට ඒ වීදියේ හෝ ඒ වීදි කැල්ලේ වාහන ගමනාගමනය විධිමත් කිරීම සඳහා කටවචනයෙන් නියමයන් කරන්ට හෝ සංඥවන් කරන්ට පොලිස් නිලධාරියකුට බලය තිබේ. පොලිස් නිලධාරියා නියම කරන අන්දමකට හෝ වේලාවක් තුළ ඒ වීදියේ හෝ ඒ වීදි කැල්ලේ ඒ වාහනය තිබෙන්ට රියැදුරා විසින් ඉඩ නොදිය යුතුය.

5. මෙ උපනීති මාලවෙන් කවරක් වුවත් කඩ කරන ඕනෑම කෙනෙකු වරදක් කළා විය යුතුවාත් හැර වරදකාරයා බැව් උසාවියකින් තීරණය කළ කල රුපියල් පනහකට නොවැඩි දඩයකටද යටත් විය යුතු වන්නේය.

## XXVI වැනි කාණ්ඩය

### ජලසම්පාදනය පිළිබඳ උපනීති

#### වචනාර්ථ නිරූපණය

1. මේ උප නීතිවල—

ජලසම්පාදනය සම්බන්ධයෙන් ව්‍යවහාර කරන "ගෙදරදොරේ කටයුතු" යන්නට විකිණීම පිණිස හෝ කුලියට දීම පිණිස තබාගෙන ඇති අශ්වයන් හෝ ගවයන් සඳහා යන වතුර හෝ විකිණීම පිණිස හෝ කුලියට දීම පිණිස තබාගෙන ඇති රථවාහන සේදීම සඳහා යන වතුර හෝ කිසියම් කර්මාන්තයක් හෝ නිෂ්පාදනයක් හෝ ව්‍යාපාරයක් සඳහා හෝ වතුර මලක් සඳහා හෝ පිහිනුම් වැන්කියක් සඳහා හෝ සැරසිලි කටයුතු සඳහා හෝ යාන්ත්‍රික කටයුතු සඳහා හෝ වාරිමාර්ග කටයුතු කටයුතු සඳහා යන වතුර ඇතුළත් නොවේ.

... වතුර පයිප්ප කණුවලින් හෝ වතුර මල්වලින් හෝ ... ප්‍රයෝජනය සඳහා දමා තිබෙන වතුර පයිප්පයකින් හෝ ... නියමකර තිබෙන වෙන අන් දමකින් හෝ මිස ... ජල කණ්ඩයකින් වතුර ලබා නොගත යුතුය.

## පොදු වතුර පයිප්ප කණු

පොදු වතුර පයිප්ප කණුවකින්—

... කිසිවකු විසින් පොදු වතුර පයිප්ප කණුවකින්—

(අ) ... සාමාන්‍යයෙන් අතින් ගෙන යා හැකි පනිවිඩුවකින් හෝ එබඳු වෙන භාජනයකින් මිස කරත්තයකින් හෝ පීප්පයකින් හෝ වෙනයම් භාජනයකින්; නැතහොත්

(ආ) අපතේ යා හැකි අන් දමකට හෝ ප්‍රමාණයකට ... නොගෙනිය යුතුය.

... කිසිවකු විසින් කොයිම පොදු වතුර පයිප්ප කණුවකටවත් ... හෝ පයිප්පයක්වත් නලයක්වත් පිල්ලක්වත් මොනම ... වෙන උපකරණයක්වත් තාවකාලික වශයෙන් හෝ ස්ථිර ... සවි නොකළ යුතුය.

... කොයිම පොදු වතුර පයිප්ප කණුවකටවත් සවිකර තිබෙන්නාවූ ... කොටසක්ව පවතින්නාවූ හෝ ස්වයංකාරක (ඉබේ ක්‍රියා ...) ඉපියාව හෝ වෙන ස්වයංකාරක උපකරණයක් අතපත ගැම ... ඉපියාවේ හෝ උපකරණයේ ස්වයං ක්‍රියාකාරිත්වය තාවකාලික ... හෝ ස්ථිර වශයෙන් වළකින විදියේ ක්‍රියාවක් කිසිවකු ... නොකළ යුතුය.

6. කිසිවකු විසින් ගෙදර දොරේ කටයුතුවලට හැර වෙන මොනම ... ප්‍රයෝජනයකටවත් පොදු වතුර පයිප්ප කණුවකින් වතුර නොගත ... යුතුය.

7. ... රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ ... රෝගයකින් පෙළෙන්නාවූ හෝ එබඳු රෝගයකින් පෙළෙණ ... ළඟදී සාත්තු කළාවූ කිසිවකු පොදු වතුර පයිප්පයකින් ... නොගත යුතුය.

8. නගර සභාව කෙරෙහි පවරා ඇත්තාවූ හෝ නගරසභාව විසින් ... කරන්නාවූ මොනම ජලාශයකින් හෝ වතුර පයිප්ප ... කණුවකින් හෝ වතුර මලකින් හෝ සැළකින් හෝ පයිප්පයකින් ... වෙන ජල කණ්ඩයකින් හෝ ඒ ළඟ සිටගෙන හෝ කිසිවකු ... හෝ තමාගේ ශරීරයේ කොටසක් සේදීම හෝ යම් සතකු ... හෝ වාහනයක් හෝ ඇඳුම් හෝ භාජන හෝ වෙන කිසිම ... සේදීම හෝ නොකළ යුතුය.

### පුද්ගලික ප්‍රයෝජනය සඳහා දමා තිබෙන වතුර පයිප්ප හා ඒ සම්බන්ධයෙන් සවිකළ පෙසු උපකරණ පිළිබඳ නියමයෝ

9. මෙහි සඳහන් උපලේඛනයේ "අ" පෝරමයේ ප්‍රකාරයට සභාපතිහු වෙත ඉල්ලුම් පතක් යවා ඔහුගේ අනුමතිය ලියවිල්ලක ... කලින් ලබා නොගෙන කිසිවකු විසින්—

(අ) නගර සභාවේ ප්‍රධාන වතුර පයිප්පවලින් හෝ ජල කණ්ඩ ... යෙන් යම් පුද්ගලික ස්ථානයකට අලුත් ජලසම්පාදනයක් ඇතිකිරීම හෝ අලුත් අතු පයිප්පයක් දැමීම හෝ ඒ සඳහා කිසිම වැඩක් පටන් ගැනීම; නැතහොත්

(ආ) නගර සභාවේ ප්‍රධාන වතුර පයිප්පවලට හෝ ජල කණ්ඩයට සම්බන්ධ කොට තිබෙන්නාවූ යම් අතු පයිප්පයක් වෙනස් කිරීම හෝ දීර්ඝ කිරීම හෝ ශුද්ධ පවිත්‍ර කිරීම හෝ අලුත් වැඩියා කිරීම හෝ ඒ සඳහා කිසිම වැඩක් පටන්ගැනීම; ... යුතුය.

10. 9 වැනි උපනීතිය යටතේ සභාපතිහු විසින් අනුමත කරන ලද ... කණ්ඩයක් ඔහු ලියා එවූ නියමයන් අනුව කරවිය යුතුය. ... සභාපතිහු විසින් අනුමත කරන ලදින් නගර සභාවේ මුද්‍රාව තබා නැති ... උපකරණයක් ඒ කණ්ඩයක් සඳහා සවිකිරීමට නොගත ... යුතුය.

11. ... ඉල්ලුම්කරුවකුට දිය යුතු පයිප්පයේ මහත ප්‍රමාණය ... නගර සභාව විසින් තීරණය කළ යුතුය.

12. (1) පුද්ගලික ජලසම්පාදනය සඳහා පාවිච්චි කරන සියලු අතු ... (වක්කළ) ගැල්වනයිස් යකඩෙන් හෝ තඹෙන් සාදා තිබිය ... පයිප්පවල ඝනකම හෝ තත්වය සභාපතිහු විසින් හෝ ... ලේඛනයක් ... මලය පැවරූ නිලධාරියකු විසින් අනුමත කරන ... විය යුතුය.

(2) පුද්ගලික ජලසම්පාදනය සඳහා පාවිච්චි කරන සියලු (වක්කළ) ... ගැල්වනයිස් යකඩ පයිප්පවල පීඩනය වශී අඟලට රාත්තල් 2,000ක් ... ඒවායේ බර පහත දක්වන අයුරු විය යුතුය:—

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් ½යි, දිග අඩි 100 ට රාත්තල් ...

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් ¾යි, දිග අඩි 1000 රාත්තල් ...

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් 3/4යි, දිග අඩි 1000 රාත්තල් 125යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් 1යි, දිග අඩි 1000 රාත්තල් 181යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් 1¼යි, දිග අඩි 1000 රාත්තල් 250යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් 1½යි, දිග අඩි 1000 රාත්තල් 320යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් 2යි, දිග අඩි 1000 රාත්තල් 405යි.

(3) පුද්ගලික ජලසම්පාදනය සඳහා පාවිච්චි කරන සියලු තඹ පයිප්පවල පීඩනය වශී අඟලට රාත්තල් 200ක් විය යුතුය. ඒවායේ බර පහත දක්වන අයුරු විය යුතුය:—

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් ⅜යි, දිග අඩි 1000 රාත්තල් 19යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් ½යි, දිග අඩි 1000 රාත්තල් 27යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් ¾යි, දිග අඩි 1000 රාත්තල් 39යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් 1යි, දිග අඩි 1000 රාත්තල් 62යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් 1¼යි, දිග අඩි 1000 රාත්තල් 76යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් 1½යි, දිග අඩි 1000 රාත්තල් 91යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් 2යි, දිග අඩි 1000 රාත්තල් 140යි.

13. නගර සභාව විසින් එකම ස්ථානයක් වශයෙන් භක්සේරු කරන ලද්දාවූද එකම භූමිභාගයෙහි පිහිටියාවූද දේපලකට ජලය ලබා ගැනීම සඳහා නගර සභාවේ ප්‍රධාන වතුර පයිප්පවලට හෝ ජල කණ්ඩයට එක් අතු පයිප්පයකට වඩා සම්බන්ධ නොකළ යුතුය.

14. යම් ස්ථානයකට වතුර ගැනීමට සවිකරන සියලු කරාම සභාපතිහු අනුමත කළ මෝස්තරයකට හා මහත දෙගෙතට තිබිය යුතුය.

15. වතුර ගන්නා හැම කරාමයකම කට වූකලී වතුර කාන්දුවීම පහසුවෙන් සොයාගත හැකිවන සේ කාටත් හොඳින් පෙනෙන අනාවරණ ස්ථානයක තිබිය යුතුය. එය වතුර වැක්කෙරෙන සැළේ හෝ වැංකියේ හෝ භාජනයේ ඉහළම ජල මට්ටමට පහළින් කොයිම විටෙකවත් නොතිබිය යුතුය.

16. (1) නගර සභාවේ ජලකණ්ඩයට සම්බන්ධකොට තිබෙන සියලුම පුද්ගලික ජලසම්පාදන සේවයක වතුර පයිප්ප අතර හෝ පයිප්ප හා උපකරණ අතර සියලු සන්ධි විදුලිබලය යොදා පිරිද්දිය යුතුය.

(2) කිසිම සන්ධියකට විදුලි ගුණය නාල්ලන ද්‍රව්‍යයක් නොදැමිය යුතුය. එහෙත් එබඳු ද්‍රව්‍යයක් පාවිච්චි නොකරම බැරියයි සභාපති හට පෙනී ගියහොත් සන්ධියේ හෝ සන්ධිවල පයිප්ප හෝ උපකරණ විදුලිබලය යොදා පිරිද්දිය යුතුය යන කොන්දේසිය පිට ඒ ද්‍රව්‍යය පාවිච්චි කිරීමට අවසර දීමට ඔහුට බලය ඇත්තේය.

17. හැම නාන බල්දියකටම හෝ වැසිකිළි බේසමකට හෝ මළ තුපයකට (sink) වතුර එන කට ඒ වතුර පිටවී යන ද්වාරයෙන් වෙන්වී තිබිය යුතුයි. වතුර එන ඒ කට ඒ නාන බාල්දියේ හෝ වැසිකිළි බේසමේ හෝ මලතුපයේ මුදුනෙහි තිබිය යුතුය; නැතහොත් ඒ නාන බාල්දියට හෝ වැසිකිළි බේසමට හෝ මලතුපයට—උඩින් තිබිය යුතුය.

18. හැම සැලකටම වතුර එන කටේ හෝ වතුර එන පයිප්පයේ වතුර වැක්කෙරෙන මට්ටමම ඒ සැළේ ඉහළම ජල මට්ටමට උඩින් තිබිය යුතුය.

19. මේ උපනීති වලංගු වූ දිනයෙන් පසු—

(අ) ගෙදර දොරේ කටයුතු සඳහා දෙන වතුරෙන් කොටසක් තබා ගැනීම පිණිස යම් ස්ථානයක ගැලුම් 100 ට වැඩියෙන් අල්ලන සැලක් පිහිටුවීම හෝ සෑදීම නොකළ යුතුය.

(ආ) මහත දෙගෙත හා මෝස්තරය හා පිහිටුවන හෝ සාදන ගණන සම්බන්ධයෙන් සභාපතිහුගේ අනුමතිය කලින් ලබාගෙන මිස නැත්නම් කිසිම ස්ථානයක සැලක් පිහිටුවීම හෝ සෑදීම නොකළ යුතුය.

20. ජලකණ්ඩයෙන් වතුර ලැබෙන හැම සැළකටම අනුමත කරනලද මෝස්තරයක කරාමයක් හා පමබර වටතුරු ඉපියාවක් සවිකර තිබිය යුතුය. වැන්කියේ ජලය ගැවියට අඟල් දෙකකට පහළින් තිබෙන විට හෝ පිටාර ගලන විට වතුර ඊම නවතින පරිද්දෙන් වටතුරු ඉපියාව සවිකළ යුතුය.

21. හැම සැළසුම් වතුර පිටකරන පයිප්පයේ අග කෙළවර හොඩ කැපිල්ලෙන් පිටතට කෙත පොදින් පෙනෙන තැනක සවිකළ යුතුය. එසේ කළයුත්තේ වතුර කාන්දුවීම පහසුවෙන් සොයා ගත හැකිවීම පිණිසය. කිසිම සැළක වතුර පිටකරන පයිප්ප කානුවකට හෝ මල මූත්‍රාපලිකාවකට හෝ නාන කාමරයක වත් වතුර ඉවත් කරන පයිප්පයකට හෝ මලනලයකට හෝ වෙන සමාන උපකරණයකට හෝ වෙන සැළක වතුර පිටකරන පයිප්පයකට මොනම කරුණක් නිසා වත් සම්බන්ධ නොකළ යුතුය. එක් එක් සැළකට ජලය පිට කිරීමට වෙන වෙනම පයිප්පයක් තිබිය යුතුය.

22. යම් ස්ථානයකට වතුර ගැනීමට සවිකොට තිබෙන අතු පයිප්පය හෝ සැළ හෝ සෙසු ජලසම්පාදන උපකරණ වෙන ස්ථානයක වූ අතු පයිප්පයකට හෝ සැළකට හෝ සෙසු ජලසම්පාදන උපකරණවලට සම්බන්ධ නොකළ යුතුය.

23. පුද්ගලික ජල සේවයක කොටසක්ව පවතින කිසිම පයිප්ප යක් නගර සභාවේ විශේෂ අනුමතිය නැතිව කිසිම බොයිලේරුවකට හෝ සනීකරණ යන්ත්‍රයකට හෝ සෙසු යන්ත්‍ර සූත්‍රාදියකට එක එල්ලේම සම්බන්ධ නොකළ යුතුය.

24. හැම පුද්ගලික ජල සේවයකටම—

(අ) පිත්තලෙන් හෝ තුවක්කු ලෝහ නම් ලෝහව විශේෂයෙන් හෝ චීනවළඳවියෙන් කැදුවාවූද පතුල ගනබෝලූකමට ඇත්තා වූද ගස්තිමත් වූද රෝධකයක් (Stop-Cock) තිබිය යුතුය. රෝධකය චීනවළඳවියෙන් කැදුවක් නම් ජලගයට ඇස්බැස්ටෝස් සැතිං දමා තිබිය යුතුය; නැතහොත්

(ආ) මුරුල් ඉපියාවක් සමග පහතට නැමුනු ඉස්කුරුප්පු රෝධක යක් තිබිය යුතුය; නැතහොත්

(ඇ) අඟල් දෙකකට වඩා විෂ්කම්භය ඇති පයිප්පයකින් වතුර දෙන සේවයක් නම් සොරොව්වක් හෝ ලිස්සනසුලු ඉපිය වක් තිබිය යුතුය.

ඒ විපියේ පදික වේදිකාවක් තිබේ නම් ඒ රෝධකය හෝ ඉපියාව ඒ වේදිකාව යටින්ද ජලසේවය ලැබෙන ස්ථානයට හැකි තරම් කිට්ටු වෙන්ද සවිකළ යුතුය. කොයි වේලෙකදී වුවත් රෝධකය හෝ ඉපියාව සොයා ගත හැකිවීම පිණිස චීනවළඳවි පෙට්ටියක් හා පියනක් එයි මතුපිට සවිකළ යුතුය. රෝධකය හෝ ඉපියාවත් චීනවළඳවි පෙට්ටියත් සභාපතිනු අනුමත කළ මාදිලියක විය යුතුය.

25. යම් දේපලකට අලුතෙන් දමනලද ජලසම්පාදන සේවයක පයිප්ප හෝ ඉපියාවල් හෝ සෙසු උපකරණ සභාපතිනු හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරනලද නිලධාරියකු පරීක්ෂාකර ලියවිල්ලකින් අනුමත කරන තුරු නොවැසිය යුතුය.

## පොළොබද විදුලි කම්බි

26. (1) කිසිවකු වෝල්ට් 500 ක හෝ ඊට වඩා විදුලි බලය යන විපයසීප උපකරණ පෙට්ටියකින් හෝ වෙන විදුලි උපකරණ පෙට්ටිය කින් නගර සභාවේ ජලකණින්තයේ පයිප්පයකට හෝ උපකරණය කට හෝ ජලකණින්තයට සම්බන්ධ කරනලද යම් පුද්ගලික ජල සම්පාදන සේවයකට පොළොබද විදුලි කම්බි සවි නොකළ යුතුය.

2. 1 වැනි ඡේදයේ සඳහන් ඕනෑම විපරාංශ යන්ත්‍රයක හෝ වෙන විදුලි උපකරණයක පොළෝ තහඩුව හෝ පොළොබද විදුලි කම්බියේ ඕනෑම කොටසක් නගර සභාවේ ජලකණින්තයේ හෝ නගර සභාවේ ජලකණින්තයට සම්බන්ධවූ යම් පුද්ගලික ජලසම්පාදන සේවයක් පයිප්පයකින් හෝ උපකරණයකින් අඩි දෙකක් වත් ඈත් විය යුතුය.

27. විදුලි ආලෝක ක්‍රමයෙන් විදුලි බලය ලබන ගුවන් විදුලි යන්ත්‍ර යකට පොළොබද විදුලි කම්බියක් සම්බන්ධ කිරීම අවශ්‍යවූ කල ඒ සම්බන්ධ කිරීම කළ යුත්තේ නගර සභාවේ ජලකණින්තයේ පයිප්පයකින් හෝ උපකරණයකින් හෝ නගර සභාවේ ජලකණින්ත යකට සම්බන්ධකර තිබෙන පුද්ගලික ජලසම්පාදන සේවයකින් අඩි දෙකකට නොඅඩු දුරක සවිකරන පොළෝ තහඩුවක් මගිනි.

28. නගරසභාවේ ජලකණින්තයට සම්බන්ධ කරන ලද ජලමාපන යන්ත්‍රයක් පිහිටුවා තිබෙන ඕනෑම ස්ථානයක පොළොබද ඕනෑම විදුලි කම්බියක් සවිකරන්නා විසිනුත් ඒ සවිකිරීම කළයුත්තේ ඒ ජලමාපන යන්ත්‍රයට වතුර එන පැත්තෙනි. නැතහොත් ඒ ජල මාපන යන්ත්‍රය හරහට විදුලි කම්බියක් දැමීමෙනි.

## පුද්ගලික ජලසම්පාදන සේවය ප්‍රධාන පයිප්පවලට සම්බන්ධ කිරීම

29. (1) අලුතෙන් පිහිටුවන ලද ජලසම්පාදන සේවයක් 25 වැනි උපනීතිය යටතේ පරීක්ෂා කොට අනුමතකළ කල ඉල්ලුම්කරු විසින්—

(අ) සභාපතිනු තක්සේරු කළ පරිදි කම්කරුවන්ට හා ද්‍රව්‍යවලට හා පරිපාලනයට යන වියදම ඇතුළුව නගර සභාවේ ප්‍රධාන වතුර පයිප්පවලට හෝ ජලකණින්තයට ඒ පුද්ගලික ජල සම්පාදන සේවය සම්බන්ධ කිරීමට යන වියදමත්,

(ආ) ජලසම්පාදන සේවය සම්බන්ධ කිරීම හා ජලය සැපයීම සඳහා රුපියල් 25 ක මුල් මුදලක් හෝ රුපියල් 25 ක අත්තර මුදලකුත්

නගර සභාවේ තැන්පත් කළ යුතුය.

(2) මේ උපනීතියේ 1 වැනි ඡේදයෙන් නියමිත මුදල් විධිවූ පරිදි තැන්පත්කරන තෙක් ජලසම්පාදන සේවය සම්බන්ධ කිරීම නොකළ යුතුය.

30. (1) යම් පුද්ගලික ස්ථානයකට වතුර දෙන පයිප්ප වූකලී සභාපතිනු විසින් බලය පවරනලද නගර සභාවේ නිලධාරියකුගේ පරිපාලනය යටතේ මිස වෙන අන්දමකට නගර සභාවේ ප්‍රධාන වතුර පයිප්පවලට හෝ ජලකණින්තයට සම්බන්ධ නොකළ යුතුය.

(2) ඒ ස්ථානයට වතුර දීම පටන් ගත්තේ පයිප්ප විධිවූ පරිදි සම්බන්ධ කරන ලද වේලාවේ සිටයයි සියලු කටයුතු සම්බන්ධයෙන් සැලකිය යුතුය.

31. නගර සභාවේ ප්‍රධාන වතුර පයිප්පවලට හෝ ජලකණින්තයට පුද්ගලික ජලසම්පාදන සේවයක් සම්බන්ධ කළ පසු මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් "ඉ" පෝරමයේ ප්‍රකාරයට ලියා ඒ පිළිබඳ ගණන් හිලව් ඉල්ලුම්කරු වෙත යැවිය යුතුය. ඒ සම්බන්ධ කිරීම සඳහා යන වියදම වශයෙන් ඉල්ලුම්කරු තැන්පත් කළ මුදලෙන් වියදම් නොවී යමක් ඉතිරිවී තිබෙතොත් එය ඔහුට ආපසු දිය යුතුය. සැබැවින්ම වියදම් වූ මුදල තක්සේරු කරනලද වියදමට වඩා වැඩිවුවහොත් ඒ වැඩි මුදල, ඉහත සඳහන් ගණන් හිලව් පිළිබඳ ලිපිය ලැබුණ වහාම ඉල්ලුම්කරු විසින් නගර සභාවට ගෙවිය යුතුය.

## ජලමාපන යන්ත්‍ර

32. නගර සභාවේ ජලකණින්තයකින් ඕනෑම දේපලකට දෙන ජලය මනින සියලු මාපන යන්ත්‍ර නගරසභාව මගින් සපයා සවිකළ යුතුවා පමණක් නොව නගරසභාව සතු දේපල වශයෙන්ද තිබිය යුතුය.

33. (කම්කරුවන්ට හා උපකරණවලට හා පරිපාලනයට ගෙවන වියදම ඇතුළුව) මාපන යන්ත්‍ර සවිකිරීමට යන වියදම ජලය ලැබෙන ස්ථානයේ අයිතිකාරයා හෝ පදිංචිකාරයා විසින් කලින් ගෙවිය යුතුය.

34. ජලමාපන යන්ත්‍රයක් මගින් ජලය ලැබෙන ඕනෑම ස්ථානයක අයිතිකාරයා හෝ පදිංචිකාරයා ඒ මාපන යන්ත්‍රය නඩත්තු කිරීමට හෝ අලුත්වැඩියා කිරීමට යන වියදම ගෙවීමට බැඳී නොසිටිය යුතුය.

එසේවුවද වුවත්, ඒ අයිතිකාරයා හෝ පදිංචිකාරයා හිතාකමින්ම කළ දෙයකින් හෝ ඔහුගේ නොසැලකිල්ලකින් සිදුවූ අලාභහානියක් නිසා ජලමාපන යන්ත්‍රය අලුත්වැඩියා කිරීම හෝ අලුත් කිරීම අවශ්‍ය වුව හොත් ඒ අලුත්වැඩියා කිරීම හෝ අලුත් කිරීමට යන වියදම සභාපතිනු නියමකළ විටෙක ඒ අයිතිකාරයා හෝ පදිංචිකාරයා විසින් නගර සභාවට ගෙවිය යුතුය.

35. (1) ජලමාපන යන්ත්‍රයක් මගින් ජලය ලැබෙන ඕනෑම ස්ථානයක අයිතිකාරයා විසින් ඒ මාපන යන්ත්‍රය පාවිච්චි කිරීම වෙනුවෙන් පහත පෙනෙන රේට් ගණන් අනුව ගණන් බැලූ කුලියක් කාර්තුවකට (තුන් මාසයකට) වරක් බැගින් නගර සභාවට කලින් ගෙවිය යුතුය; නැතහොත් ගෙවීමට සැලැස්විය යුතුය.

කාර්තුවකට හෝ කාර්තුවකින් කොටසකට කුලිය

| | රු. | ශ. |
|---|---|---|
| අඟල් 3කේ ජලමාපන යන්ත්‍රයක් වෙනුවෙන් ... | 33 | 50 |
| අඟල් 2කේ ජලමාපන යන්ත්‍රයක් වෙනුවෙන් ... | 20 | 0 |
| අඟල් 1½යේ ජලමාපන යන්ත්‍රයක් වෙනුවෙන් ... | 14 | 0 |
| අඟල් 1කේ ජලමාපන යන්ත්‍රයක් වෙනුවෙන් ... | 8 | 0 |
| අඟල් ¾කේ ජලමාපන යන්ත්‍රයක් වෙනුවෙන් ... | 6 | 50 |
| අඟල් ½යේ ජලමාපන යන්ත්‍රයක් වෙනුවෙන් ... | 5 | 50 |
| අඟල් ⅜කේ ජලමාපන යන්ත්‍රයක් වෙනුවෙන් ... | 4 | 50 |

(2) මේ උපනීතිය සම්බන්ධයෙන් කාර්තුව යන්නෙන් අදහස් කරන්නේ එක් එක් අවුරුද්දේ ජනවාරි මස 1 වැනිදයින් හා අප්‍රේල් මස 1 වැනිදයින් හා ජූලි මස 1 වැනිදයින් හා ඔක්තෝබර් මස 1 වැනිදයින් ආරම්භවන්නාවූද එක දිගටම වූද තුන් මාසයක කාලපරිච්ඡේදයකි.

36. (1) ඕනෑම කාර්තුවකට පාවිච්චි කරන වතුරේ ප්‍රමාණය ගණන් ගත යුත්තේ ඒ කාර්තුව ආරම්භයේදී මාපන යන්ත්‍රයේ වැටී තිබුණ ගණන හා ඒ කාර්තුව අවසානයේදී වැටී තිබුණ ගණන අතර ඇති අන්තරය කොපමණදැයි පහත පෙණෙන ආකාරයට ගණන් බැලීමෙනි.

(2) අලුතෙන් සවිකරන ජලමාපන යන්ත්‍රයක් සම්බන්ධයෙන් නම් එය සවිකරන විට වැටී තිබුණ ගණනද වෙන ජලමාපන යන්ත්‍රයක් සම්බන්ධයෙන් නම් එය ඊට කලින් ඒ එක්කමවූ කාර්තුව වෙනුවෙන් අන්තිමට වැටී තිබුණ ගණනද පළමුවැනි ගණන් ගැණීම වශයෙන් සැලකිය යුතුය. යම් කාර්තුවක් සඳහා අන්තිමට වැටෙන ගණන විය යුත්තේ ඒ කාර්තුව ඉකුත්වීමට දහ දවසකට මත්තෙන් වූ දිනයකදී හෝ ඒ කාර්තුව ඉකුත් වී දහ දවසකට මත්තෙන් වූ දිනයකදී ගණන් ගන්නාලද ගණනය.

එතකුදු වුවත්, අලුත්වැඩියා කිරීම පිණිස ජලමාපන යන්ත්‍රය ඉවත් ...ම නිසා පූර්වෝක්ත කාලපරිච්ඡේදය ඇතුළත අවසාන ගණන් ...ගැනීම කිරීමට පිළිවෙලක් නැති තැනකදී ජලමාපන යන්ත්‍රය ...න්ට මත්තෙන් අවසාන ගණන් ගැනීම කළ යුතුය.

(3) යම් කාර්තුවකදී යම් ස්ථානයක ජලමාපන යන්ත්‍ර දෙකක් හෝ ...ට වැඩි ගණනක් පාවිච්චි කොළොත් ඒ කාර්තුවේදී ප්‍රයෝජනයට ...න්නා ජලය ඒ ජලමාපන යන්ත්‍රවල වැටෙන ගණන්වල එකතුය ...ය යුතුය.

37. (1) ජලමාපන යන්ත්‍රයක් නරක්වූ විට හෝ අලුත්වැඩියා කිරීම ...ණිස හෝ වෙනස් කොට හරිගැස්සීම පිණිස ඉවත්කරන විට හෝ ...ලුත් ජලමාපන යන්ත්‍රයක් සවිකරන විට හෝ පරණ ජලමාපන ...න්ත්‍රයක් නැවත සවිකරන විට ඒ පිළිබඳ සන්දේශයක් ඒ ජලමාපන ...න්ත්‍රය මගින් ජලය ලැබෙන ස්ථානයෙහි තබා තැබිය යුතුය.

(2) ජලමාපන යන්ත්‍රය නරක්වූ විට හෝ අලුත්වැඩියා කිරීම පිණිස ...ස් වෙන යම් කරුණක් නිසා ඒ ස්ථානයෙන් ඉවතට ගෙනගිය විට ...ි වැනි උපනීතියේ කවර විධිවිධානයක් යොදා තිබුණත් ඒ ජල...පන යන්ත්‍රය නරක්ව තිබුණ කාලපරිච්ඡේදයේදී හෝ ජලමාපන ...න්ත්‍රයක් නැතිව සේවය ලැබුණ කාලපරිච්ඡේදයේදී පාවිච්චි කළ ...ලය ගණන් බැලිය යුත්තේ ඒ කාලපරිච්ඡේදය එක්කම ඊට කලින් ... කාර්තුවේදී දින පතා පාවිච්චි කරන ලද ජලයේ මාධ්‍යය (රේට ...ණන්වල සාමාන්‍ය ගණන) අනුවය.

38. (1) යම් පදිංචිකාරයකු තමාගේ ස්ථානයෙහි වූ ජලමාපන ...න්ත්‍රයේ නිවැරදි බව ගැන තමාට සැකයක් ඇතිවූයෙන් පරීක්ෂණ ...ාස්තු වශයෙන් රුපියල් විස්සක් කලින් ගෙවා ඒ යන්ත්‍රයේ ...ිරවද්‍යතාවය පරීක්ෂා කරවන ලෙස සභාපතිහට කියා සිටියොත් ඔහු ...ිසින් ඒ පදිංචිකාරයා හෝ ඒ පදිංචිකාරයා බලය පැවරූ වෙන ...කෙනෙකු ඉදිරියේදී ඒ ජලමාපන යන්ත්‍රය පරීක්ෂා කරවිය යුතුය. ඒ ...රීක්ෂණයෙන් ප්‍රකාශවන දෙය පිළිගැනීමට සභාපතිහුත් පදිංචිකාර...ත් බැඳී සිටිය යුතුය. එසේම 35 (2) වැනි උපනීතියේ කියා තිබෙන ...රිදි කාර්තුව වෙනුවෙන් ජලමාපන යන්ත්‍රයෙහි වැටී තිබුණ ජලයේ ...්‍රමාණය පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව හරිගැස්විය යුතුය.

(2) ජලමාපන යන්ත්‍රයෙහි වැටී ඇති ගණන හරි නම්, නැතහොත් ...ියම වශයෙන් ලැබුණ ජලයත් ලැබෙන්ට තිබුණ ජලයත් අතර ඇති ...වනස ලැබෙන්ට තිබුණ ජලයේ ප්‍රමාණයෙන් සියයට දෙකකට වැඩි ...නොවෙතොත්, (1) වැනි ඡේදය යටතේ කලින් ගෙවනලද පරීක්ෂණ ...ාස්තුව නගර සභාව විසින් තබාගත යුතුය.

(3) ජලමාපන යන්ත්‍රයෙහි වැටී ඇති ගණනත් නියම වශයෙන් ...ැබුණ ජලයත් අතර ඇති වෙනස වූකලී නියම වශයෙන් ලැබුණ ...ජලයෙන් සියයට දෙකකට වඩා වැඩි වූ විට (1) වැනි ඡේදය යටතේ ...කලින් ගෙවූ පරීක්ෂණ ගාස්තුව පදිංචිකාරයාට ආපසු ගෙවිය යුතුය.

39. (1) ජලමාපන යන්ත්‍රවල වැටී ඇති ගණන් සභාපතිහු නියම ...කරන වකවානුවලදී ගණන් ගත යුතුය. එහෙත් ඒ ගණන් ගැනීම ...කාර්තුවකට තුන් වාරයකට වඩා අඩු නොවිය යුතුය.

(2) ජලමාපන යන්ත්‍රයක වැටී ඇති ගණන් ගණන්ගත් කොයි ...වත් ඒ ගණන් ඇතුළත්කොට සන්දේශයක් ඒ යන්ත්‍රය මගින් ...ජලය ලැබෙන ස්ථානයේ පදිංචිකාරයාගේ නමට ලියා තැබිය යුතුය.

### ජලය සැපයීම වෙනුවෙන් අයකරන ගාස්තු

40. (1) ගෙදර දොරේ කටයුතු සඳහා ජලය සැපයීම නගර සභාවේ ...අභිමතය පරිදි මාපන යන්ත්‍රයක් මගින් හෝ වෙන විධියකින් කළ ...හැකිය. ඒ සඳහා අයකරන ගාස්තු නගර සභාවේ යෝජනාවකින් ...විසින් වර නියම කරන රේට් ගණන් අනුව විය යුතුය.

(2) ගෙදර දොරේ කටයුතුවලට නොව වෙන කටයුතු සඳහා ජලය ...සැපයීම නගර සභාවේ අභිමතය පරිදි මාපන යන්ත්‍රයක් මගින් හෝ ...වෙන විදියකින් කළ හැකිය.

(3) නගරසභාවේ ජලකර්මාන්තයෙන් ජලය ලැබෙන ඕනෑම ස්ථාන...ක ජලමාපන යන්ත්‍රයක් ඕනෑම වේලාවකදී සවිකිරීමට නගර සභාවට ...ලය තිබේ.

41. (1) ගෙදර දොරේ කටයුතුවලට නොව වෙන කටයුතු සඳහා ...ජලමාපන යන්ත්‍රයක් මගින් ජලය දෙන විට ඒ වෙනුවෙන් අයකරන ...ගාස්තුව ගණන් බැලිය යුත්තේ වතුර ගැලුම් දහසකට රුපියල බැගිනි.

(2) ගෙදර දොරේ කටයුතුවලට නොව වෙන කටයුතු සඳහා ජලමාපන ...යන්ත්‍රයක් මගින් නොව වෙන විදියකින් ජලය සපයන විට එක් එක් ...පුද්ගලික ජල සේවය වෙනුවෙන් පහත පෙනෙන ගාස්තු මාස් පතා ...නගර සභාවට කලින් ගෙවිය යුතුය.

...මුළු ස්ථානයම හෝ එහි කොටසක් පාවිච්චියට ගත්—

(අ) කිරිපට්ටියක් හෝ බේකරියක් හෝ භෝජනාගාරයක් හෝ භෝජන ශාලාවක් හෝ බත්කඩයක් වැනි ස්ථානයක් සඳහා රුපියල් 2.

(ආ) තේ කෝපි කඩයක් හෝ කරනැවුම් මැදුරක් වැනි ස්ථානයක් සඳහා රුපියල් 1.



42. 41 වැනි උපනීතියේ (2) වැනි ඡේදයෙන් ඉඩ දී ඇති ස්ථාන වලදී හැර පුද්ගලික ජල සේවයකින් ලැබෙන ජලය, ඒ ස්ථානයෙහි පදිංචිකාරයා මෙහි පහත ඇති උපලේඛනයේ "උ" ෆෝරමයේ ප්‍රකාර ගිවිසුමකට බැඳී ඇතොත් මිස නැත්නම්, ගෙදර දොරේ කටයුතුවලට හැර වෙන කටයුත්තකට පාවිච්චි නොකළ යුතුය.

එතකුදු වුවත්, එසේ වතුර දීමෙන් වෙන පුද්ගලයකුට හෝ පුද්ගලයන්ට ගෙදර දොරේ කටයුතුවලට වතුර දීම සම්බන්ධයෙන් බාධාවක් ඇති වෙතොත් පදිංචිකාරයා එබඳු ගිවිසුමකට බැඳී ඇතත්, ඔහුට ඒ කටයුතු සඳහා දෙන ජලය මොනම වන්දි ගෙවීමකට හෝ දඩුවමකට යටත් නොවී නැවැත්වීමට හෝ තාවකාලික වශයෙන් නතර කිරීමට හෝ අඩුකිරීමට නගර සභාවට බලය ඇත්තේය.

43. ඕනෑම පුද්ගලික ස්ථානයකට දෙන වතුර වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තුව, මෙහි පහත උපලේඛනයෙහි ඇති "එ" ෆෝරමයේ ප්‍රකාර ගණන් බිලට ලියා එවූ විට, ඒ ස්ථානයේ අයිතිකාරයා හෝ පදිංචිකාරයා ඒ ලිපියේ සඳහන් දිනයේ සිට පහළොස් දවසක් ඇතුළතදී සභාපතිහට හෝ ඔහු විසින් බලය පවරනලද නිලධාරියකුට ගෙවිය යුතුය.

### ජලය අපතේ යෑම වැළැක්වීම

44. (1) නගර සභාවේ ජලකර්මාන්තයට සම්බන්ධව ඇති ඕනෑම පුද්ගලික ස්ථානයක තිබෙන්නාවූද පුද්ගලික ජල සේවයක කොටසක් වශයෙන් පවතින්නාවූද පයිප්පයක හෝ කරාමයක හෝ ඉපියාවක හෝ ජලමාපන යන්ත්‍රයක හෝ වෙන උපකරණයක විනාශය හෝ ප්‍රමාණය හෝ පිහිටීම හෝ ස්වභාවය හෝ තත්ත්වය නිසා ජලකර්මාන්තයෙන් පොදු ප්‍රයෝජනය හෝ පුද්ගලික ප්‍රයෝජනය සඳහා දෙන ජලය අපතේ යාහැකිය කියා හෝ වැරදි ලෙස පාවිච්චි වේය කියා හෝ නොසැහෙන ලෙස පාවිච්චි වේය කියා හෝ නරක්විය හැකිය කියා හෝ ජලකර්මාන්තයෙන් ජලය දීම නිසි ලෙස පාලනය කිරීමට හෝ ජලය නිසි ලෙස බෙදා හැරීමට බාධාවක් වේය කියා සිතා ගැනීමට කරුණු ඇතිවූ කොයි විටකදී වුවත් සභාපතිහට ඒ ස්ථානයේ අයිතිකාරයා වෙත මෙහි පහත උපලේඛනයෙහි වූ "ම" ෆෝරමයේ ප්‍රකාර දන්වීමක් යැවීමට බලය ඇත්තේය.

(2) ඒ හැම දන්වීමකම සභාපතිහු අවශ්‍යයයි කල්පනාකරන වෙනස් කිරීම සඳහන් කළ යුතුවාත් හැර ඒ දන්වීමේ සඳහන් කාලපරිච්ඡේදය ඇතුළතදී ඒ අයිතිකාරයා විසින් සභාපතිහු හොඳය කියා පිළිගන්නා පරිද්දෙන් ඒ වෙනස් කිරීම කළ යුතුය.

(3) අයිතිකාරයාගේ නම හෝ පදිංචි ස්ථානය නොදනිතොත් දන්වීම හා සම්බන්ධ ස්ථානයේ කාටත් පෙනෙන තැනක ඒ දන්වීම ඇලෙව් කල එය අයිතිකාරයාට විධිවූ පරිදි බාරදුන්නා කොට සැලකිය යුතුය.

45. පහත පෙනෙන අයුරු වූ විට, එනම්:—

(අ) යම් ස්ථානයක අයිතිකාරයාගේ හෝ පදිංචිකාරයාගේ ඉල්ලීම පිට, හෝ

(ආ) ඒ ස්ථානයේ අයිතිකාරයාගෙන් හෝ පදිංචිකාරයාගෙන් මේ උපනීතිවල විධිවිධාන යටතේ අයවිය යුතුවූ මුදලක් නොගෙවා තිබෙතොත්, හෝ

(ඇ) ඒ ස්ථානයේ අයිතිකාරයා හෝ පදිංචිකාරයා යම් වතුර පයිප්පයක් සෑදීම හෝ දැමීම මේ උපනීතිවල විධිවිධාන අනුව නොකරවුව හොත් නැති නම් වෙනස් නොකරවුව හොත්, හෝ

(ඈ) ජලකර්මාන්තයට අලාභහානි සිදුවීම හෝ ජලකර්මාන්තය අපිරිසිදුවීම හෝ ජලය අපතේ යෑම හෝ ජලය අයථා අන්දමින් පාවිච්චි කිරීම පිළිබඳ යම් උපනීතිවල විධිවිධාන යන් අනුව ඒ ස්ථානයේ අයිතිකාරයා හෝ පදිංචිකාරයා තමා විසින් කළයුතු යම් ක්‍රියාවක් හෝ දෙයක් නොකොළොත් නැතහොත් නොකළ යුතු යම් ක්‍රියාවක් හෝ දෙයක් කළොත්

නගර සභාවේ ප්‍රධාන වතුර පයිප්පවලින් හෝ ජලකර්මාන්තයෙන් ඒ ස්ථානයට ජලය දීම නැවැත්වීමට හෝ තාවකාලික වශයෙන් නතර කිරීමට හෝ අඩුකිරීමට නැතහොත් ඒ ස්ථානයට දමා ඇති පුද්ගලික වතුර පයිප්පය වැස්සවීමට සභාපතිහට බලය ඇත්තේය.

46. නගරසභාවේ ජලකර්මාන්තයෙන් පුද්ගලික සේවයක් (වතුර පයිප්පයක්) දමා ඇති ගෙයක හෝ ස්ථානයක පදිංචිකාරයා විසින් ඒ සේවයේ කොටසක් වශයෙන් පවතින කරාමයකින් හෝ පයිප්පයකින් හෝ ජලමාපන යන්ත්‍රයකින් හෝ වෙන යම් උපකරණයකින් ජලය අපතේ යන කවරවිටකදී වුවත් ඒ බව වහාම සභාපතිහට දන්විය යුතුය.

47. ඕනෑම ස්ථානයක ඇති පුද්ගලික ජල සේවයේ කොටසක්ව පවතින යම් කරාමයකින් හෝ පයිප්පයකින් හෝ ජලමාපන යන්ත්‍රයකින් හෝ වෙන යම් උපකරණයකින් ජලය අපතේ යන බව දැනගත් කවර විටකදී වුවත් සභාපතිහට හෝ ඔහු විසින් බලය පවරනලද ඕනෑම කෙනෙකුට ඒ ජලසේවයත්—නගරසභාවේ ප්‍රධාන වතුර පයිප්පත් අතර ඇති සම්බන්ධය වහාම වැස්සවීමට බලය තිබේ. ඒ ස්ථානයේ අයිතිකාරයා හෝ පදිංචිකාරයා විසින් ජලය එසේ අපතේ යෑමට ඇති හේතුව නැතිකරන තුරු එකී ජල සේවය නැවත සම්බන්ධ නොකළ යුතුය.

CamScanner

48. 45 වැනි උපනීතියේ කියා ඇති සිනෑම හේතුවක් පිට වස්සවන ලද යම් පුද්ගලික ජල සේවයක් නගර සභාවේ ප්‍රධාන වතුර පයිප්පවලට හෝ ජලකර්මාන්තයට නැවත සම්බන්ධ කිරීම සඳහා සභාපතිනු ගන්සේරු කළ මුදල ඒ ස්ථානයේ අයිතිකාරයා හෝ පදිංචිකාරයා විසින් නගරසභාවට කලින් ගෙවිය යුතුය. එයින් යමක් ඉතිරි වුවහොත් වැඩ අවසන් වූ පසු අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට ආපසු දිය යුතුය. කියම වශයෙන් වියදම්වූ මුදල තක්සේරු කරනලද මුදලට වඩා වැඩිවුව හොත් ඒ වැඩි මුදල ඒ වැඩය අවසන්වූ වහාම අයිතිකාරයා විසින් හෝ පදිංචිකාරයා විසින් ගෙවිය යුතුය.

සාමාන්‍ය

49. (අ) ජලකර්මාන්තයේ ජලය ප්‍රමාණවත් නොවේය කියා, හෝ
(ආ) ප්‍රධාන වතුර පයිප්පවල හෝ ජලකර්මාන්තය විශාල කිරීම හෝ වෙනස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම හෝ ප්‍රධාන වතුර පයිප්පවලට අතු පයිප්ප සම්බන්ධ කිරීම සඳහා ජලය සැපයීම හෝ තාවකාලික වශයෙන් නතර කිරීම හෝ වෙන අතකට හැරවීම සුදුසුය නොහොත් ආවශ්‍යකය කියා, හෝ
(ඇ) පොදු වතුර පයිප්ප කණුවකට අලාභහානියක් සිදුවන හෙයින් හෝ එහි ජලය අපවිත්‍රවන හෙයින් හෝ අපතේ යන හෙයින් එසේ කිරීම සුදුසුය නොහොත් ආවශ්‍යකය කියා, හෝ
(ඈ) ගින්නක් හට ගැනීමෙන් ජලකර්මාන්තයට යම් අලාභහානියක් සිදුවේය නැතහොත් සිදුවීමට ඉඩ තිබේය කියා හෝ

එන්තුශිය කවර විටකදී වුවත් සභාපතිහට මේ උපනීති යටතේ නගර සභාවට අයවන්ට තිබෙන හෝ අයවිය යුතුව තිබෙන යම් වතුර බද්දක් හෝ ජලමාපන යන්ත්‍ර බද්දක් හෝ වෙන මුදලක් සම්බන්ධයෙන් කිසිම පාඩුවක් විඳීමට යටත් නොවී නගරසභාවේ ජලකර්මාන්තයට සම්බන්ධ ප්‍රධාන වතුර පයිප්පවලින් හෝ පොදු වතුරමලකින් හෝ අතු පයිප්පවලින් හෝ වෙන උපකරණවලින් ජලය සැපයීම නැවැත්වීමට හෝ තාවකාලික වශයෙන් නතර කිරීමට හෝ වෙන අතකට හැරවීමට බලය තිබේ.

50. එක් එක් පුද්ගලික ජල සේවයේ රෝධකය හෝ ඉපියාවත් ඒ රෝධකය හෝ ඉපියාව හා ප්‍රධාන වතුර පයිප්පය අතරවූ අතු පයිප්පයේ කොටසත් නගරසභාවේ දේපල කොට සැලකිය යුතුය. එසේම ඒ පයිප්ප කොටස නඩත්තු කිරීමට හෝ අලුත්වැඩියා කිරීමට හෝ අලුතෙන් දැමීමට යන වියදමද නගරසභාව විසින් දැරිය යුතුය.

51. 25 වැනි උපනීතිය යටතේ යම් පුද්ගලික අතු පයිප්පයක් හෝ උපකරණයක් අනුමත කර තිබීම හෝ ඒ පුද්ගලික අතු පයිප්පය දමා ඇති ස්ථානයේ අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට මෙයින් යම් උපනීතියක් යටතේ යම් අවසරයක් හෝ අනුග්‍රහයක් දී තිබීම මුකලි පයිප්පයේ යම් කොටසක් පිපිරියාමෙන් හෝ පයිප්පයට සවිකරන ලද උපකරණයක යම් කොටසකින් වතුර පිටාරේ ගලා යාමෙන් සිදුවන යම් අලාභහානියක් ගැන මොනම කරුණක් සම්බන්ධයෙන් වත් නගරසභාව කිසිම වගකීමකට බැඳී සිටීමක් කොට නොසැලකිය යුතුය.

52. කොන්තරාත්තුවක් පිට හෝ වේවා ගිවිසුමක් පිට හෝ වේවා වෙන විධියකට හෝ වේවා නගරසභාවෙන් සැපයිය යුතු ජලය දීමට ඒ සභාවට බැරිවූ කල ඒ බැරිවීම සිදුවූයේ බලාපොරොත්තු නුවූ නියඟක් නිසා හෝ යම් වැඩක් කිරීම කරණකොටගෙන ඇතිවූ බාධාවක් නිසා හෝ වැළැක්විය නොහැකි වෙන හේතුවක් නිසා හෝ අන්තරායක් නිසා නම් ඒ ගැන වන්දි ගෙවීමට නගරසභාව යටත් නොවිය යුතුය.

53. (1) ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි තැනීම පිණිස නගර සභාවේ ජලකර්මාන්තයෙන් යම් ස්ථානයකට තාවකාලික පයිප්පයකින් ජලය සපයන විටෙකදී ඒ ගොඩනැගිල්ල හෝ ගොඩනැගිලි තැනීම අවසානවූ පසු ඒ සැපයීම නැවැත්විය යුතුය.

(2) 1 වැනි ජේදයේ සඳහන් කටයුත්ත සඳහා ජලය සැපයීම වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තු 41 වැනි උපනීතියේ කී ගෙදර දොරේ කටයුතුවලට ඇතුළත් නුවූ කටයුතු වෙනුවෙන් නියමිත රේට් ගණන් අනුව විය යුතුය.

54. මෙ උපනීතිය යටතේ නගරසභාවට ගෙවිය යුතු සියලු මුදල්, සභාපතිහට හෝ ඔහු විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය පවරන ලද නිලධාරියකුට ගෙවිය යුතුය.

55. මේ උපනීතිවල කවර විධිවිධානයක් වුවත් කඩකරන හැම ප්‍රස්ථාවකදීම රුපියල් පනහකට වැඩි නොවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩකිරීමක් ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීමක් සිස්පත් කරවා සභාපතිනු හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු දන්වීම් පතක් බාර දුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසකට රුපියල් දහයකට වැඩි නුවූ අතිරේක දඩයක් ගැසීමෙන්ද දඬුවම් දියහැකි විය යුතුය.

## නගරසභාව

### ජලකර්මාන්ත දෙපාර්තමේන්තුව

### "අ" පෝරමය

(9 වැනි උපනීතිය)

අංකය :——.

නගරසභාවේ සභාපති වෙතටයි.

මෙහි සඳහන් උපලේඛනයේ දක්වා ඇති ආකාරයට——— කොට්ඨාශයේ——— වීදියේ——— වැනි අංකය දරණ ගෙට

* පුද්ගලික ජලසේවයක්,

* දැමීම,

* දමා ඇති සේවය වෙනස් කිරීම,

* දමා ඇති සේවය දීර්ඝ කිරීම,

* දමා ඇති පයිප්ප ශුද්ධ කිරීම

සඳහා ඔබේ අනුමතිය ලියවිල්ලකින් දෙන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

* බදුකාරයෙක් පදිංචිවී සිටි නම් වාර්ෂික බද්ද : රුපියල් ———

* අයිතිකාරයා පදිංචිව සිටි නම් වාර්ෂික වටිනාකම: රුපියල්———.

* දැනට දමා තිබෙන පයිප්පවල විෂ්කම්භය :———.

ජලය වුවමනා ගෙදර දොරේ කටයුතු සඳහාද නැතහොත් වෙන කටයුතු සඳහාද යන බව :———.

ස්ථානය පාවිච්චි කරන්නේ කුමන කටයුත්තක් සඳහාද යන බව :———.

තැන්පත් කළ මුදල : රුපියල් :———.

* වුවමනා නැති වචන කපා දමන්න.

උපලේඛනය

| පුද්ගලික ස්ථානයකට දමන පයිප්ප | | කාමර | | | සැල් | |
|---|---|---|---|---|---|---|
| දිග | විෂ්කම්භය | ගණන | පළල | ප්‍රමාණය | වතුර අල්ලන ප්‍රමාණය | පළල |
| | | | | | | |

වෙනත් කරුණු :—

පැහැදිලි ලෙස ලියනු මැනවි.

* අයිතිකාරයාගේ අත්සන :———.

* අයිතිකාරයාගේ නම :———.

* අයිතිකාරයාගේ ලිපිනය :———.

* පදිංචිකාරයාගේ අත්සන :———.

* පදිංචිකාරයාගේ නම :———.

* වුවමනා නැති වචන කපා දමන්න.

කාර්යාලයේදී පිරවීම පිණිසයි

අනුමත කෙළෙමි.

———,
නගරසභාවේ සභාපති.

මුදල් තැන්පත් කළ දිනය :———.

ජලකර්මාන්ත දෙපාර්තමේන්තුවට යැවූ දිනය :———.

වැඩ අවසන් කිරීමෙන් පසු වාර්තාව ලැබුණු දිනය :———.

කරුණාකර පිහිටීම දක්වමින් ස්ථානයේ සැලැස්මක් (තනි ඉරේ සැලැස්මකි.) පහත සඳහන් කොටසේ අඳින්න.

සැලකිය යුතුයි—

(1) ජලසේවය සඳහා එවන සියලු ඉල්ලුම්පත් නිත්‍යනුකූල "අ" පෝරමයේ ලිවිය යුතුය.